# සම්මා සම්බුදුරජාණන් වහන්සේට අවේණික

# ෂට් අසාධාරණ ඥාණ

## ධර්ම දේශනා

දේශකයාණන් වහන්සේ
අතිගරු පූජනීය ත්‍රිපිටකාචාර්ය
**නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

සංස්කරණය
පූජ්‍ය මොරගොල්ලේ සුමනයෝගී ස්වාමීන් වහන්සේ

සම්මා සම්බුදුරජාණන් වහන්සේට
අවේණික

# ෂට් අසාධාරණ ඤාණ


දේශකයාණන් වහන්සේ
අතිගරු පූජනීය ත්‍රිපිටකාචාර්ය

**නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

සංස්කරණය
**පූජ්‍ය මොරගොල්ලේ සුමනයෝගී ස්වාමීන් වහන්සේ**

# පටුන


පෙරවදන v

පුණ්‍යානුමෝදනාව ix

1. ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණ ධර්ම දේශනය 1

2. ආසය අනුසය ඤාණ ධර්ම දේශනය 29

3. යමක ප්‍රාතිහාර්යඤාණ ධර්ම දේශනය 52

4. මහාකරුණා සමාපත්තිඤාණ ධර්ම දේශනය 69

5. සබ්බඤ්ඤුත ඤාණ - අනාවරණ ඤාණ ධර්ම දේශනය 98

# පෙරවදන

**බුද්ධෝහං බෝධයිස්සාමි - මුත්තෝහං මෝචයේ පරේ**
**තිණ්ණෝහං තාරයිස්සාමි - සංසාරෝඝා මහබ්භයා**

(මහාබෝධි ප්‍රාර්ථනාව)

ඉහත සඳහන් වූ මහාබෝධි ප්‍රාර්ථනාව ප්‍රථම මනෝප්‍රණිධානයේ දී අප මහ බෝසතාණන් වහන්සේ මහසයුරේ සිට මවුතුමිය කර තබාගෙන පීනමින් සත්වැනි දින අධිෂ්ඨාන කර ගත් උදාරතම ප්‍රාර්ථනයකි.

"මම බුදුවී අන් අයට අවබෝධ කරවන්නෙමි. මම සසර දුකින් හා කෙලෙසුන්ගෙන් මිදී අන් අය මුදවන්නෙමි. මම මහත් බියකරු ඕඝයෙන් එතෙර වී, අන් අය එතෙර කරවන්නෙමි" එම ගාථාවේ තේරුමයි.

එදිනම මහ සයුරෙන් ගොඩ වූ, මාතුපෝසක නම් වූ අප මහ බෝසතාණන් වහන්සේ, මෑණියන්ගේ ද ආශීර්වාද ඇතිව, සත් අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් තුළ මනෝප්‍රණිධානය ද, නව අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් තුළ වාග්ප්‍රණිධානය ද, සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් තුළ දී මහාප්‍රණිධානය ද සපුරා, ත්‍රිවිධ, අර්ථ චර්යා, පඤ්චමහා පරිත්‍යාග සහිත සමත්‍රිංසත් පාරමී ධර්ම මුදුන්පත් කොට, බුද්ධගයා බෝධිමූලයේ දී සවාසනා සකල ක්ලේශයන් සෝදාහැර අනුත්තර සම්මා සම්බෝධිඥාණය ප්‍රතිලාභ කළ සේක.

ඉහත දැක්වූ මහාබෝධි ප්‍රාර්ථනාව අනුව තමන් වහන්සේ බුදුබවට පත් වී සූවිසි අසංඛෙය්‍ය හැටකෝටි පනස් ලක්ෂයකින් අධික පිරිසකට අවබෝධ කරවූ සේක. තමන් වහන්සේ සසර දුකින් සහ කෙලෙසුන්ගෙන් මිදී අන් අය මුදවා ගත් සේක. තමන් වහන්සේ බියකරු සංසාර ඕඝයෙන් එතෙර වී සිට, අන් අය එතෙර කරවූ සේක. අනාගතයේ වසර පන් දහසකට අධික කාලයක් ලෝවැසි ජනතාවට අවබෝධය පිණිස, මිදීම ද පිණිස,

එතෙරවීම ද පිණිස සුවාසූ දහසක් දහම් කඳ දේශනා කොට වදාළ සේක. ලොව පහළ වන පසේ බුදුවරයන් වහන්සේලාට හෝ, අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවකාදී මහරහතන් වහන්සේලාට හෝ, කළ නොහැකි එම ධර්ම ශාන්තිය සලසාලීම පිණිස ශාන්ති නායකයාණන් වහන්සේට පමණක් ම ලැබෙන අන් අයට නොලැබෙන බැවින් අසාධාරණ නම් වූ අතිවිශේෂ ප්‍රඥාවේ ප්‍රභේද සයක් ඇත. "ෂට් අසාධාරණ ඤාණ" නමින් හැඳින් වූයේ ඒ අති උත්තරීතර ප්‍රඥාවේ ප්‍රභේදය වේ. ඉන්ද්‍රිය පරොපරියත්තේ ඥානය, ආසයානුසයේ ඥානය, යමක ප්‍රාතිහාර්ය ඥානය, මහාකරුණා සමාපත්ති ඥානය, සර්වඥතා ඥානය සහ අනාවරණ ඥානය ද ෂට් අසාධාරණ ඥාන නම් වෙති.

මඟඵල නිවන් සුව ලැබීමට සුදුසු වන වේනෙය්‍ය පුද්ගලයන්ගේ සන්තානයෙහි ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන්ගේ ප්‍රමාණය ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥානයෙන් දැන වදාරා, සසර දී ඒ ඒ අය පුරුදු කළ පිළිවෙත් ප්‍රමාණය ආසයානුසය ඥානයෙන් මැනග න්නා සේක. යමක ප්‍රාතිහාර්යය ඒ ඒ අයගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්ම අවදි කරවා මහාකරුණා සමාපත්ති ඥානයෙන් ඔවුනට පිහිට වීමේ කරුණා සේවය යොදා, සර්වඥතා ගුණ, අනාවරණ ඥානයෙන් සුදුසු පරිදි දහම් අමා වැසි වස්සවා සතර මඟඵල නිවන් පමුණුවන සේක.

සර්වඥ සන්තානයෙහි විද්‍යමාන වන මේ ෂට් අසාධාරණ ඥාන අලලා, දම්සෙනෙවි සැරියුත් මහරහතන් වහන්සේ විසින් විවරණය වූ, පටිසම්භිදාමග්ග පාලියේ සඳහන් පරිදි ඒ පිළිබඳ ධර්ම දේශනා පෙළක් පවත්වන ලද්දේ මීතිරිගල ශ්‍රී ඥාණාරාම ධර්මායතනයේ නිර්මාතෘ වරයාණන් වන, කොළඹ 3, ගෝල්ෆේස් ටෙරස්, අංක 47 නිවැසි සත්ගුණවත් එන්.ජී.පී. පණ්ඩිතරත්න මහත්මාණන්ගේ කාරුණික ආරාධනාවෙනි.

මෙයින් දස වසරකට පමණ පෙර පැවැත්වූ එම දේශනා සහ මෑතක දී ගුවන්විදුලියෙන් දේශනා කළ ධර්ම දේශනාවක් සහිත සියල්ල පටිගත කරවා දහම් පොතක් වශයෙන් සකසන

ලද්දේ පුහුල්වැල්ල රුහුණු යෝගාශ්‍රම වාසී පූජ්‍ය මොරගොල්ලේ සුමනයෝගී ස්වාමීන් වහන්සේ විසිනි.

"**අමතං දදෝච සෝ හෝති යෝ ධම්මමනුසාසති**" යමෙක් ධර්මය දෙසන්නේ නම්, දහම් පොත් ලියා ප්‍රචාරය කරන්නේ නම්, හෙතෙම අමෘතය දුන්නේ වේ. වසර ගණනාවක් පුරා දහම් පොත් ලියා මුද්‍රණය කර නොමිලේ පිරිනමමින් උදාර දහම් සේවාවක් සිදු කරන පූජ්‍ය සුමනයෝගී ස්වාමීන් වහන්සේටත්, මුද්‍රණ දායකත්වය දැරූ සැමටත්, දහම් පොත කියවන සැමටත් ආයුරාරෝග්‍යයාදී සම්පත් සැලසී ධර්මාවබෝධය පිණිස ම හේතු වාසනා වේවා!

"**සබ්බේ භද්‍රානි පස්සන්තු - මා කඤ්චි පාපමාගමා**"

මෙයට,

මෙතැති

**අරියධම්ම ස්ථවිර**

ගුණවර්ධන යෝගාශ්‍රම මධ්‍යස්ථානය,

ගල්දූව, කහව, අම්බලන්ගොඩ.

# පුණ්‍යානුමෝදනාව

**මානුසිකාච සම්පත්ති - දේවලෝකේ ච යා රති**
**යාච නිබ්බාන සම්පත්ති - සබ්බේ මේ තේන ලබ්භති**

සම්බුදු සසුනෙහි අප්‍රමාදව පාරමී ශීර්ෂයෙන් දාන, සීල, භවනාදී කුසල ධර්මයන් සිදුකර ගන්නා වූ සැදැහැවතුනට සසර වසනා තෙක් මනුලොව, දෙව්ලොව යම්තාක් සැප සම්පත් වෙතොත් ඒ සියල්ල ලැබෙන අතර, ජරා මරණාදී දුකෙන් අත මිදී ලෝකෝත්තර නිවන් සම්පත් ලබා ගැනීමටත්, එම කුසල් මහෝපකාරී වේ.

ලොව්තුරා බුදු කෙනෙකුට පමණක් ලැබෙන වෙන කිසිම රහතන් වහන්සේ කෙනෙකුට හෝ නොලැබෙන අසාධාරණ ඥාන හය පිළිබඳව විස්තර විවරණය කරමින් අතිපූජනීය ත්‍රිපිටකාචාර්ය මහාකර්මස්ථානාචාර්ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම දේශනා මාලාවක් අප විසින් ලියා සංස්කරණය කර මෙසේ දෙවන වතාවටත් මුද්‍රණය කර නොමිලේ ධර්ම දානයක් වශයෙන් පිරිනැමීමට ලැබීම මහා පුණ්‍ය ලාභයකි.

මෙම උදාර ධර්මදාන පුණ්‍යානුභාව බලයෙන් සහ තිසරණ සරණින් අතිපූජනීය අරියධම්ම ස්වාමීන් වහන්සේට නිරෝගි සුව අත්වී තව තවත් සසුන් ගුණ, පාරමී දම් සපිරීමට කායික මානසික ශක්තිය බලය ලැබේවා! සුවසේ පාරමී සපුරා මතු උතුම් ලොව්තුරා සම්බුදු පදවිය පිණිසම හේතු වාසනා වේවා යි ගෞරවයෙන් පුණ්‍යානුමෝදනා කරන අතර, දහම් පොත මුද්‍රණය සඳහා ධාර්මික ධනය පරිත්‍යාග කරමින් දායකත්වය දැරූ සැම දෙනාටත්, උදව් උපකාර අනුග්‍රහ දැක්වූ සැමටත්, අභාවයට පත් සියලු ඥාතීන්ටත් මෙම අගනා වටිනා දහම් පොත කියවන භාවිත කරන සැමටත්, දෙවියන් සහිත සමස්ත සත්ව ප්‍රජාවටත්,

කායික, මානසික, නිදුක් නිරෝගී සුව දීර්ඝායු අත්වේවා! අපල උවදුරු මාරක බාධක සකලාන්තරාය සර්ව උපද්‍රවයන් දුරු වී සැමට සියලු යහපත උදාවේවා! ගුණයෙන්, නුවණින්, ධනයෙන්, ධාන්‍යයෙන්, යසඉසුරින්, සැප සම්පතින් ආයු වර්ණ සැප බල ප්‍රඥාවෙන් තව තවත් දියුණු වේවා!

ධර්මඥාණ, භාවනාඥාණ වැඩේවා! සීල, සමාධි, ප්‍රඥා, වර්ධනය වී චතුරාර්ය සත්‍යාවබෝධයෙන් අමාමහ නිවන් සුව අවබෝධය පිණිසම හේතු වේවා! වාසනා වේවා!!

"ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී"

ධර්මයේ හැසිරෙන්නා ධර්මයෙන් ම ආරක්ෂා වේ.

මෙයට,

කාරුණික,

**සුමනයෝගී හිමි**

ශ්‍රී රුහුණු යෝගාශ්‍රමය,

පුහුල්වැල්ල, මාතර.

2013.12.06

# 1. ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණ

## ධර්මදේශනය

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///*

ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණං බුද්ධ ඤාණං
සත්තානං ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං
යමකපාටිහාරියේ ඤාණං බුද්ධ ඤාණං
මහාකරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං
සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං
අනාවරණ ඤාණං බුද්ධ ඤාණං
ඉමානි චුද්දස බුද්ධඤාණානි, ඉමේසං අට්ඨ ඤාණානි සාවක සාධාරණානි "ඡ"ඤාණානි අසාධාරණානි සාවකේහී ති.

ශ්‍රද්ධාවන්ත පින්වතුනි!

තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත් වූ, අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයන් වහන්සේට පමණක් ලැබෙන, ෂට් අසාධාරණ ඤාණයි, මේ සූත්‍ර පාඨයෙන් ඉදිරිපත් කරන්නට යෙදුනේ.

ලෝකධාතුවෙහි පසේ බුදුරජාණන් වහන්සේලාට ද නොලැබෙන, අග්‍රශ්‍රාවක, මහාශ්‍රාවක ආදි රහතන් වහන්සේලාට ද නොලැබෙන, සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේලාට පමණක් ම ලැබෙන, අසාධාරණ ඤාණ හයයි ඒ සඳහන් කළේ.

ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ ඤාණ සාගරයක්, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඤාණ ප්‍රමාණය කරන්නට ලෝකයේ තවත් සර්වඥයන් වහන්සේ කෙනෙක් හැර සමතෙක් නෑ. එසේ නමුත්, ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ විසින් ඉතාමත්ම විශිෂ්ඨ ලෙස බුද්ධගුණ දේශනාවන් පවත්වල තිබෙනවා. ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ තරම් බුදුගුණ දේශනා

කළ ශ්‍රාවකයන් වහන්සේ නමක් වෙන නැහැ. එයට හේතුව ශාරීපුත්‍ර මහරහතන් වහන්සේ ප්‍රඥාවෙන් අග්‍රයි.

පටිසම්භිදාමග්ගපාළිය, මහානිද්දේසපාළිය වැනි ග්‍රන්ථයන් කියවීමේ දී පැහැදිලි වෙනවා, සූත්‍රාන්ත පිටකයේ තැන් තැන්වල තිබෙන සූත්‍ර කොටස් අරගෙන පටිසම්භිදාමග්ගපාළිය, මහානිද්දේසපාළිය සහ චුල්ල නිද්දේසපාළිය දේශනා කරල තිබෙන්නේ ශාරීපුත්‍ර මහරහතන් වහන්සේ. උන්වහන්සේගේ ප්‍රඥා කෞශල්‍යය විදහා දැක්වෙන ඉතාම වැදගත් ග්‍රන්ථ දෙකක් නම්, පටිසම්භිදාමග්ග පාළිය සහ මහානිද්දේස පාළිය.

එයින් තෙසැත්තෑ ඤාණ, ඤාණ කථා නිද්දේසයෙහි හැටියට පටිසම්භිදාමග්ග පාළියේ මුලටම දැක්වෙනවා. ඒ තෙසැත්තෑ ඤාණ විවරණයේ තමයි මෙම සූත්‍ර පාඨය දැක්වෙන්නේ.

## ෂට් අසාධාරණඤාණ

මේ ෂට් අසාධාරණඤාණ පමණක් නොව, සෙසු සියලුම ඤාණත් ශ්‍රාවකයන් වහන්සේලාට ඒක දේශයකින් සාධාරණ වුවත්, සම්මා සම්බුදු රජාණන් වහන්සේ ඊට වඩා සිය ගුණයෙන්, දහස් ගුණයෙන්, ලක්ෂ කෝටි ගුණයෙන්, අසංඛ්‍ය ගුණයෙන්, අසාමාන්ත ලෙස ඒ ඤාණ ධාතුන්ගෙන් සමන්නාගත වෙනවා.

චුද්දස බුද්ධ ඤාණ නමින් අපේ දේශනාවේ සඳහන් වෙනවා බුද්ධ ඤාණ දාහතරක්, ඒවා අතරින් අටක්, ශ්‍රාවකයන් වහන්සේලාට ලැබෙනවා. එසේ නමුත් ඒ ශ්‍රාවකයන් වහන්සේලාට ලැබෙන ඤාණ අට ශ්‍රාවකයන් වහන්සේලාට ලැබෙන්නේ ඒක දේශයකින්, එක්තරා ප්‍රමාණයකින් පමණයි. ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේට ලැබෙන ඒ ඤාණ අසාමාන්ත ඤාණ හැටියට හඳුන්වනවා.

"දුක්ඛෙ ඤාණං බුද්ධ ඤාණං" කිව්වාම දුක්ඛ සත්‍යය පිළිබඳව ලැබෙන ඤාණයක්. මේ දුක්ඛ සත්‍යය පිළිබඳව අවබෝධ ඤාණය, ශ්‍රාවකයන් වහන්සේලාට ලැබෙන, දුක්ඛෙ ඤාණයට වඩා අසංඛෙය්‍ය, අප්‍රමෙය්‍ය ගුණයකින්, භාග්‍යවත් බුදුරජාණන්

වහන්සේගේ දුක්ඛේ ඥාණය අසාමාන්තයි. මේ වාගේ තමයි සෑම ඥාණ ධාතුවක් ම, සර්වඥයන් වහන්සේට හා ශ්‍රාවකයන් වහන්සේලාට සාධාරණ ඥාණ වලිනුත් භාග්‍යවතුන් වහන්සේ අසාමාන්තයි, ශ්‍රාවකයන් වහන්සේලාට පසේ බුදුරජාණන් වහන්සේලාට ද, නොලැබෙන සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණන්, අට අසංඛෙය්‍ය කල්ප ලක්ෂ ගණන්, සොළොසාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණන්, විසි අසංඛෙය්‍ය කල්ප ලක්ෂ ගණන් මුළුල්ලේ පාරමී සම්පූර්ණ කරලා, ලොව්තුරා බුදුවන සම්මා සම්බුදු රජාණන් වහන්සේලාට පමණක් ලැබෙන ශ්‍රේෂ්ඨ ඥාණ හයයි මේ ෂට් අසාධාරණ ඥාණ නමින් හඳුන්වන්නේ.

පළමු වැන්න, ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය
දෙවැන්න, ආසයානුසයේ ඥාණය
තෙවැන්න, යමකපාටිහාරියේ ඥාණය
සිවුවැන්න, මහාකරුණා සමාපත්ති ඥාණය
පස්වැන්න, සර්වඥතා ඥාණය
හයවැන්න, අනාවරණ ඥාණය.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිළිබඳව නියම අවබෝධයක් ලැබෙන්නට නම්, මේ ෂට් අසාධාරණ ඥාණ අපි තේරුම් කර ගන්නට ඕනෑ. තෙසැත්තෑ ඥාණ කථාවේ අගට තියෙන මේ ඥාණ හය පිළිබඳව විස්තර බොහෝම පැහැදිලිව පටිසම්භිදාමග්ග පාළියේ දැක්වෙනවා. එයින් පටිසම්භිදාමග්ග පාළියේ කියවෙන ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය පිළිබඳවයි, මෙම ධර්මදේශනාව.

කතමං තථාගතස්ස ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණං.

තථාගතයන් වහන්සේගේ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය නම් කවරේ ද? මේ ශාරීපුත්ත මහරහතන් වහන්සේ ප්‍රශ්න කරන ආකාරය තමන් වහන්සේම ප්‍රශ්න කරල ඉන්පසු ඒක විවරණය කරමින් වදාරළා තිබෙනවා.

ඉධ තථාගතෝ - සත්තේ පස්සති
**අප්ප රජක්ඛේ - මහා රජක්ඛේ,**
තික්ඛින්ද්‍රියේ - මුදින්ද්‍රියේ,
ස්වාකාරේ - ද්වාකාරේ,
සුවිඤ්ඤාපයේ - දුවිඤ්ඤාපයේ,
**අප්පේකච්චේ** පරලෝකවජ්ජභයදස්සාවිනෝ
**අප්පේකච්චේ** න පරලෝකවජ්ජභයදස්සාවිනෝ.

මේ සූත්‍ර පාඨය යි. මාතෘකා පාඨය යි. මෙතැන දී කියවෙනවා, තථාගතයන් වහන්සේ මේ ලෝක ධාතුවෙහි සෑම සත්වයෝ ම කොටස් පහකට බෙදල නුවණින් දැකගන්නවා.

1. අල්පරජස්ක - මහාරජස්ක යුගලය
2. තික්ඛින්ද්‍රිය - මුදින්ද්‍රිය යුගලය
3. ස්වාකාර - ද්වාකාර යුගලය
4. සුවිඤ්ඤාපය-දුවිඤ්ඤාපය යුගලය සහ
5. පරලෝකවජ්ජභයදස්සාවි - න පරලෝකවජ්ජභයදස්සාවි යුගලය

යුගල වශයෙන් තිබෙනව පහක්. ප්‍රභේද වශයෙන් පනහයි. මේ කොටස් යුගල පහට සියලුම සත්වයන් බෙද බෙදා ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේ දැකගන්නව. අවබෝධ කර ගන්නව. ප්‍රථමයෙන් අපි තේරුම් ගන්නට ඕනෑ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණයේ තේරුම කුමක් ද කියලා. ඉන්ද්‍රිය කියන්නේ කුමක් ද? පරෝපරියත්තේ කියන්නේ කුමක් ද? ඤාණය කියන්නේ කුමක් ද? කියන එක අපි වෙන් කරල බලන්නට ඕනෑ.

"ඤාණය"කියන්නේ මෙතැන දර්ශනය සැබෑ දර්ශනය විනිවිද දක්නා නුවණ. මෙය සර්වඥයන් වහන්සේට ම අයත් ඤාණයක්. අපේ සන්තානයේ පහළ වෙනවා සෝභන චෛතසික 25ක්. ඒ අතරින් අග්‍රගණ්‍යය චෛතසිකය තමයි ප්‍රඥා ඉන්ද්‍රිය. මේ ප්‍රඥා ඉන්ද්‍රිය චෛතසිකය තමයි මෙතැන දී ඤාණය කියල හඳුන්වන්නේ.

ඒ ප්‍රඥා ඉන්ද්‍රිය නම් වූ චෛතසික ධර්මය ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳව, උස් පහත් බව දැනගන්නවා නම්, ඒ ඤාණයට කියනවා ඉන්ද්‍රිය පරෝපරිය ඤාණය කියල.

සර්වඥ සන්තානයේ පහළ වන්නාවූ ද එක් එක් ඤාණයන්ගෙන් කෙරෙන ක්‍රියාවලියන් වෙන වෙනම විවිධාකාරව තිබෙනවා.

දිබ්බචක්ඛු ඤාණයෙන් කෙරෙන්නේ ආලෝකයක් විහිදුවල ඒ ආලෝකය පැතිර පවත්නා ප්‍රදේශයෙහි මැරෙන, උපදින, සුගති-දුගති යන, කුසල්-අකුසල් කරන, සෝභන-අසෝභන ගති පැවතුම් ඇති, සත්වයන් සහ ද්‍රව්‍යයන් දැකීමයි. දිවැස් නුවණින් කෙරෙන්නේ තේජෝ කසිණ සමාපත්ති බලයෙන් හෝ ඕදාත කසිණ සමාපත්ති බලයෙන් හෝ ආලෝක කසිණ සමාපත්ති බලයෙන් හෝ ආලෝකයක් විහිදුවනවා. විහිදුවල සත්ව පුද්ගලයන් සහ අවශ්‍ය ද්‍රව්‍යයන් උන්වහන්සේ දැක ගන්නව. මේක දිවැස් නුවණට ඇති ආලම්භනයයි.

පූර්වේනිවාසානුස්මෘති ඤාණයෙන් කෙරෙන්නේ පෙර විසූ ආත්මභාවයන් බැලීමයි. අසවල් භවයේ අසවල් නම් ගොත් ඇතිව ජීවත් වුණා, අසවල් විදියේ රූප සම්පත් ඇතිව ජීවත් වුණා, මේ මේ විදියේ ආහාරපාන ඇතිව ජීවත් වුණා, මේ මේ විදිහේ කුසල් අකුසල් කරමින් ජීවත් වුණා, මෙපමණ ආයුෂයක් විඳල එතැනින් චුත වුණා, අසවල් තැන උපන්නා. මේ ස්කන්ධ පරම්පරාව පිළිබඳව පූර්ව ආත්මයන් දැකීම පමණයි පුබ්බේ නිවාස ඤාණයෙන් කෙරෙන්නේ, දිවකන් නුවණින් කෙරෙන්නේ.

ළඟ වූ ද, දුර වූ ද, සියුම් වූ ද, ඖදාරික වූ ද, දිව්‍ය වූ ද, මනුෂ්‍ය වූ ද ශබ්දයන් ශ්‍රවණය කිරීමේ සමර්ථ භාවය පමණයි දිවකන් නුවණට තිබෙන්නේ.

පරචිත්ත විජානන ඤාණයෙන් කෙරෙන්නේ අන් අයගේ සන්තානවල චිත්ත සන්තතිය බැලීමයි. දිවැස් නුවණ වගේ ම කසිණ ආලෝකයක් විහිදුවල පුද්ගල සන්තානය වෙත, හෘදයවස්තුවට ආලෝකය විහිදුවල, හෘදයවස්තුවේ තියෙන වර්ණය විග්‍රහ කරනව. වර්ණය ව්‍යවස්ථාපනය කරනව. වර්ණය

ව්‍යවස්ථාපනය කරල, චිත්ත සන්තතිය අල්ලගන්නව. සිත උපදින, පවතින, වස්තුරූපය අල්ලා ගැනීමෙන් ඒ පුද්ගල සන්තානයේ චිත්ත සන්තතිය අරමුණු කර ගන්න හැකි වෙනවා. එසේ අරමුණු කරගෙන, අසවල් පුද්ගලයා දැන් මේ මේ කුසල් සිතින් ඉන්නේ. මේ මේ අකුසල් සිතින් ඉන්නේ. මේ මේ ලෝභ සිතින් ඉන්නේ. මේ මේ දෝස සිතින් ඉන්නේ. මේ මේ විදිහේ මෝහ සිතින් ඉන්නේ ආදි වශයෙන් ඒ ඒ පුද්ගලයන් සිතන සිතන සිතිවිල්ල දැක ගන්නට සමර්ථ වන්නේ චේතෝපරිය ඤාණය හෙවත් පරචිත්ත විජානන ඤාණයටයි. මෙන්න මෙහෙම එක එක ඤාණධාතුන්ගෙන් කෙරෙන ක්‍රියාවලියක් තිබෙනව.

ඒ වගේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ, සන්තානයේ පහළ වෙනව පුද්ගලයන්ගේ සන්තානවල, ඉන්ද්‍රියයන් පිළිබඳව, උස් පහත් බව තේරුම් ගන්නා ඤාණ දර්ශනයක්. මෙන්න මේ ඤාණ දර්ශනයට කියනවා ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණය කියල. එයින් මෙතැන ඉන්ද්‍රිය කියන්නේ කුමක් ද? යන්න අපි තේරුම් ගන්නට අවශ්‍ය යි.

"ඉන්ද්‍රිය", "අක්ඛමින්ද්‍රියන්" කියල ව්‍යාකරණයේ සඳහන් වෙනව. ඉන්ද්‍රියයට කියන්නේ "අක්ෂය" කියල. අපි ඇහැටත් කියනව නේ. ඇස ඉන්ද්‍රියක් නිසා ඇසට අක්ෂි කියනව. ඒ වගේ තමයි අක්ඛමින්ද්‍රිය. යම්කිසි දෙයක් අරමුණු කර ගැනීමේ ඉසුරුමත් බවට කියනව ඉන්ද්‍රිය කියල. ඉන්දට්ඨං කරෝතීති ඉන්ද්‍රියං.

යමක් පිළිබඳව ඉසුරුමත් බවක් තිබෙනව නම්, ඒ ඉසුරුමත් බවට කියනවා, ප්‍රධාන බවට කියනවා, ඉන්ද්‍රිය කියලා. ඒ වාගේ ඉන්ද්‍රිය ජාති තියෙනවා. අපේ සන්තානවල විසි දෙකක්. ඒ විසිදෙකෙන් තුනක් ලෝකෝත්තරයි. අනිකුත් ඒවා ලෞකික ලෝකෝතර වශයෙන් බෙදාගන්න කොටස් තියෙනව. ඒ ඉන්ද්‍රිය දේශනාවන් අතර ආධ්‍යාත්මික ඉන්ද්‍රිය, බාහිර ඉන්ද්‍රිය කියල තිබෙනව. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන කියල ඉන්ද්‍රිය හයක් තිබෙනව. චක්ඛු ඉන්ද්‍රිය, සෝත ඉන්ද්‍රිය, ඝාණ ඉන්ද්‍රිය, ජිව්හා ඉන්ද්‍රිය, කාය ඉන්ද්‍රිය, මනින්ද්‍රය.

තවත් අපේ සන්තානයේ බෝධිපාක්ෂික ධර්ම වශයෙන් වැඩෙන ඉන්ද්‍රිය පහක් තිබෙනව. ඒවානම්, සද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, මේවා බෝධිපාක්ෂික මණ්ඩලයට අයත් ඉන්ද්‍රිය ධර්ම පහයි.

දෙවිසි ඉන්ද්‍රියන් වෙන් කරන කොට මුලින් සඳහන් කළ චක්ඛු ඉන්ද්‍රිය, සෝත ඉන්ද්‍රිය, ඝාණ ඉන්ද්‍රිය, ජිව්හා ඉන්ද්‍රිය, කාය ඉන්ද්‍රිය, මනින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සෝමනස්ස ඉන්ද්‍රිය, දෝමනස්ස ඉන්ද්‍රිය, උපේක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අනඤ්ඤාතඤ්ඤස්සාමිතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවී ඉන්ද්‍රිය යන මේ විසිදෙකයි.

ඒ අතරින් අගට තිබෙන අනඤ්ඤාස්සාමීති ඉන්ද්‍රිය සෝවාන් මාර්ග ඤාණය යි.

අඤ්ඤින්ද්‍රිය සෝවාන් මාර්ගයෙන් ඉහළ අර්හත් මාර්ග ඤාණය දක්වා මාර්ගඵල ඤාණ හයයි. අඤ්ඤාතාවී ඉන්ද්‍රිය අර්හත්ඵල ඤාණය යි. එම තුන ලෝකෝතරමයි.

ඊළඟට සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා කියන ඉන්ද්‍රිය පහ ලෞකික ලෝකෝත්තර දෙකටම සාධාරණයි.

මෙතැනදී ගැනෙන්නේ ඉන්ද්‍රිය නමින් මෙන්න මේ ශ්‍රද්ධා ආදී පංච ඉන්ද්‍රිය ධර්මයි. ශ්‍රද්ධා ආදි පංච ඉන්ද්‍රියන්ට මෙතැන කියන්නේ ඉන්ද්‍රිය කියල. ශ්‍රද්ධාව ඉන්ද්‍රිය නමින් හඳුන්වන්නේ, අපේ සන්තානයේ ප්‍රසාදයට පමුණුවන ධර්මයන් අතුරින් ශ්‍රද්ධාව ප්‍රධානයි. ඒක නිසා මෙතැන ඉන්ද්‍රිය නමින් හඳුන්වන්නේ. තම තමාට අයිති කිසෙහි, තම තමාට අයිති කටයුත්තෙහි ප්‍රධානත්වය දරනවා නම් ඒක තමයි ඉන්ද්‍රිය කියල කියන්නේ.

අපේ සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේටත් නමක් තියෙනවා "ඉන්ද්‍රිය" කියල.

සදේවකේ භික්ඛවේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ
සස්සමණ බ්‍රාහ්මණියා පජාය තථාගතෝ ඉන්දෝ

තථාගතයන් වහන්සේට "ඉන්ද්‍ර" කියනව. අපි නම කියනකොට මුනින්ද්‍ර කියනව, සුගතීන්ද්‍ර කියනව. ඔයවාගේ ඉන්ද්‍රිය භාවිතාවක් අපි භාවිතා කරනවනෙ.

ඉන්ද්‍රිය කියන්නේ, ප්‍රධාන කියන එකයි. මුනිවරයින් වහන්සේලාගේ ප්‍රධාන බැවින්, ශ්‍රේෂ්ඨ බැවින්, භාග්‍යවතුන් වහන්සේට මුනීන්ද්‍ර" කියනව. ඒ වගේම තම තමාට අයිති කටයුත්තෙහි යම් යම් චිත්ත චෛතසික ධර්මයක් හෝ, රූප ධර්මයක් ප්‍රධාන වෙනව නම්, ඒකට කියනව ඉන්ද්‍රිය කියල. ඉන්ද්‍රාර්ථය නමින් එය හඳුන්වනව.

සක්දෙව් රජ්ජුරුවෝ දිව්‍යලෝක දෙකකට නායකයි, ප්‍රධානයි. එනිසා ශක්‍ර දේවේන්ද්‍ර කියනව. ඉන්ද්‍ර කියල සක්දෙව් රජ්ජුරුවන්ට නමක් තියෙන්නේ ඒකයි. ඒ වගේ මේ ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා කියන පංචකයටත් තියෙනවා ප්‍රධානත්වයක්. මේ ප්‍රධානත්වය තිබෙනව ක්‍රම දෙකකට.

1. ප්‍රදේශ අධිපති 2. සර්වත්‍ර අධිපති කියල.

- ප්‍රදේශ අධිපති කියන්නේ එක එක ප්‍රදේශවලට නායකත්වය
- සර්වත්‍ර අධිපති කියන්නේ හැම තැනටම නායකත්වය, සක්විති රජ්ජුරුවෝ වාගේ. සක්විති රජ්ජුරුවෝ නම් මුළු පොළෝ තලයට ම නායකයි, අධිපතියි. ප්‍රදේශ රජ දරුවෝ ඉන්නව, එක එක රාජධානියට අධිපති.

ඒ වාගේ අපේ සන්තානවල පවතිනව ඡන්ද, චිත්ත, විරිය, විමංසා කියල අධිපති ධර්ම හතරක්. මේවා සර්වත්‍ර අධිපති සැම තැනටම නායකත්වය දරනවා, මේ අධිපති ධර්ම හතර.

ඒ හැර ඉන්ද්‍රිය විසිදෙක තම තමාට අයිති කෘත්‍යරසයෙහි ප්‍රධානත්වයක් උසුලනවා. එයින් මෙතැන ශ්‍රද්ධාව කියන්නේ සෝභන චෛතසික විසිපහෙන් එකක්, සෝභන සාධාරණ දහනවයෙන් එකක් ශ්‍රද්ධාව, ශ්‍රද්ධාව කියන එක ධම්මසංඝණිප්‍රකරණයේ හඳුන්වල තිබෙන්නේ.

කතමං තස්මිං සමයේ සද්ධින්ද්‍රියං හෝති
යා තස්මිං සමයේ සද්ධා, සද්ධහනා,
ඕකප්පනා, අභිප්පසාදො, සද්ධා, සද්ධින්ද්‍රියං, සද්ධා
බලං, ඉදං තස්මිං සමයේ සද්ධින්ද්‍රියං හෝති.

මේ අභිධර්මපිටකයේ සද්ධා ඉන්ද්‍රිය පැහැදිලි කරන සූත්‍ර පාඨයක්.

යා සද්ධාඃ තුනුරුවන්ගේ ගුණ යම් අදහා ගැනීමක් වෙයි නම්, සද්ධහනා-අදහන ආකාරයක් තියෙනවා නම් එයත්, ඕකප්පනා - තුනුරුවන්ගේ ගුණයේ පතුලටම පිහිටුවා ගත්ත ස්ථිර පැහැදීමක් තිබෙනවා නම් එයත්, අභිප්පසාදො - තුනුරුවන්ගේ ගුණය පිළිබඳව අතිශයින්ම පැහැදීමක් වෙත්නම් එයත්, සද්ධා සද්ධින්ද්‍රියං - සිත පැහැදවීමේ ඉසුරුමත් බවක් ඇත්නම් එයත්, සද්ධා බලං - අශ්‍රද්ධාවෙන් සොලවාලිය නොහැකි සේ බලවත් වූ පැහැදීමක් වේ නම් එයත්, ඉදං තස්මිං සමයේ සද්ධින්ද්‍රියං හෝති - මෙන්න කුසල් සිතේ, සෝභන සිතේ, පවත්නා සද්ධා ඉන්ද්‍රිය, මෙයට ශ්‍රද්ධා කියන්නෙ ඇදහීම.

ඇදහීම කියනකොට ඤාණ සම්ප්‍රයුක්ත ඇදහීම, මේ ශ්‍රද්ධාවේ අවස්ථා හයක් තිබෙනවා. එයින් මෙතැන සඳහන් කරනු ලබන්නේ, ඕකප්පන ලක්ඛණ ශ්‍රද්ධාව. එම ශ්‍රද්ධාවේ අවස්ථා හය නම්ඃ

1. සද්ධහන ලක්ඛණ සද්ධා
2. සම්පසාදන ලක්ඛණ සද්ධා
3. සම්පක්ඛන්දන ලක්ඛණ සද්ධා
4. ඕකප්පන සද්ධා
5. ආගම සද්ධා
6. අධිගම සද්ධා.

**සද්ධහන ලක්ඛණ සද්ධා**! තුනුරුවන්ගේ ගුණය හදවතින්ම පිළිගැනීම.

**සම්පසාදන ලක්ඛණ සද්ධා** - සෑම කටයුත්තක දී ම, තුනුරුවන්ගේම ගුණ සිහිපත් කරගෙන, කටයුතු කරනව. කනගාටුවක්, දුකක්, දොම්නසක්, විපතක් ආවත්, බියක්, තැති ගැනීමක්, අන්තරාවක්, සන්ත්‍රාසයක්, සිතේ රාගයක්, ද්වේෂයක්, මෝහයක් ඇති වුණත්, තුනුරුවන්ගේ ම ගුණ සිහි කරලා, ඒ සිත සනසවා ගන්නවා. පහදවා ගන්නවා. බොරවතුරට "උදක ප්‍රසාදක මාණික්‍යරත්නය" දැමීමෙන් බොරවතුර පැහැදෙන්න වගේ. සිතේ කැළඹීමක්, නොසන්සුන් බවක්, අසහනයක් ඇතිවුණා නම් වෙන පිහිටක් නොසොයා රත්නත්‍රයේම ගුණ සිහිපත් කරලා, ඒ තුළින් සිතේ පැහැදීමක් ඇති කරගෙන සැනසුමක් ලබා ගන්නවා නම්, එයට කියනවා සම්පසාදන ලක්ඛණ ශ්‍රද්ධාව.

**"සම්පක්ඛන්දන ලක්ඛණ ශ්‍රද්ධා"**

ඊටත් වඩා බලසම්පන්න ශ්‍රද්ධාව. දාන, සීල, භාවනාදී කවර ආකාරයේ හෝ ආගමික කටයුත්තකට යොමු වුණත් වැස්සෙන්, පින්නෙන්, අව්වෙන්, සුළඟින්, මැසි මදුරුවන්ගෙන්, කුසගින්නෙන්, පිපාසයෙන්, රජ, සොර, සතුරු ආදි අභ්‍යන්තර බාහිර කවර ආකාරයේ උපද්‍රවයක් පැමිණියත්, ඒවාට පස්සට අඩිය නොතබා තමා බලාපොරොත්තු වන, ඒ ආගමික කටයුතුවල යෙදීමේ උද්‍යෝගීමත්, ශ්‍රද්ධාවට කියනවා සම්පක්ඛන්ධන ලක්ඛණ ශ්‍රද්ධා කියල. අට්ඨකථාවේ මෙය හඳුන්වනවා. ගංගාවක් දෙගොඩතලා ගලන වෙලාවේ එහා මෙහා යන්න බැරිව, භීරුක ජනතාව දෙතීරේ රැස්වී සිටිද්දී, නිර්භීත, සූරවීර, සංග්‍රාමජී යෝධයෙක් යගදාවක් අරගෙන, කැසපොට ගහගෙන, ගඟ දිය දෙබෑ කරමින් මේ ජනයා බලාගෙන සිටිද්දී එගොඩ, මෙගොඩ යනවා. ජනතාව එගොඩ, මෙගොඩ කරවනව.

මෙන්න මේ වාගේ දාන, සීල, භාවනාදී කවර ආකාරයේ හෝ කුසල ක්‍රියාවන්ට, නිර්භීතව ඉදිරිපත් වීමේ, උද්‍යෝගීමත් ශ්‍රද්ධාවට කියනවා සම්පක්ඛන්ධන ලක්ඛණ ශ්‍රද්ධාව කියල.

බෝධිසත්ව චරිතවලින් එවැනි අවස්ථා අපට සොයාගන්න තිබෙනවා. "බදිරංගාර ජාතකය" වටිනා නිදර්ශනයක්.

බෝධිසම්භාර පුරමින් පැමිණි අප මහා බෝසතාණන් වහන්සේ බරණැස් නුවර එක්තරා සිටු පවුලක සිටු පුත්‍රයෙක්ව උපන්නා. එතුමා කුඩා කල පටන් විශාල දන්වැටක් පැවැත්වුවා. දහස් ගණන් ජනයා දන් ගන්නට පැමිණෙනවා. මේ අතරට ගන්ධමාදන පර්වතයේ සතියක් නිරෝධ සමාපත්තියට සමවැදී සිටි පසේ බුදුවරයන් වහන්සේ නමක්, හත්වෙනි දවසේ එතැනට පිණ්ඩපාතේ වැඩියා ඍද්ධියෙන්.

උන්වහන්සේට එදා පිණ්ඩපාතේ වැරදුණොත් පිරිනිවන් පානවා. ඒක නිසා වසවර්ති දිව්‍ය පුත්‍රයා හැට රියනක් දිග පළල කිහිරි ගිනි අඟුරු වලක් මැව්වා දාන ශාලාවටත්, පසේ බුදුරජාණන් වහන්සේටත් අතරේ. දානය ගන්න පැමිණි දහස් ගණන් දුගී මගී අසරණ ජනතාව කෑගහන්න ගත්තා. එසේ නමුත් උදාර අධිෂ්ඨාන ඇති බෝධිසත්ව සිටු පුත්‍රයා, දාන පාත්‍රයත් අතේ තබාගෙන හැන්දක් අනිත් අතින් අරගෙන මේ ගිනි අඟුරුවල සමීපයට ආවා. ඇවිත් කල්පනා කළා මේක නම් ඉබේ මැවෙන්න බැහැ. මම පාරමී පුරනවාට බාධා කරන මාර පාක්ෂික ඇත්තෝ දෙවි දේවතාවෝ ඉන්නවා. එහෙම කෙනෙක් ඉන්නවානම් මට දකින්න ලැබේවා, කියල අහස දෙස බැලුවා. දිලිහි දිලිහී වසවර්ති දිව්‍ය පුත්‍රයා අහසේ හිටියා. උන්වහන්සේ නොබියව කථා කළා. ... ඔබ කවුද? ... මම වසවර්ති දිව්‍ය පුත්‍රයා. ... මේ ගිනිඅඟුරු වල මැව්වේ ඔබද? ... ඔව් මමයි. ... ඒ කුමක් සඳහා ද? ... ඔබේ දානය වලක්වන්න. බෝධිසත්ව සිටුපුත්‍රයා නොබියව අභියෝගයක් කළා. ... වසවර්ති දිව්‍ය පුත්‍රය, ඔබ වැනි එක්කෙනෙක් නොවෙයි සීයක්, දාහක් මාරයෝ ආවත් මගේ දානය වලක්වන්න බැහැ. මම දානය දෙන හැටි බලන්න කිව්වා. උන්වහන්සේ අධිෂ්ඨාන කළා කුඩා කල පටන් නිති පන්සිල් ර ක්කා. පොහොය අටසිල් රැක්කා. අපමණ දම් පින්කම් කළා. මව්පියන්ට උපස්ථාන කළා. බණ ඇහුවා. බණ දේශනා කළා.

පින් දුන්නා. පින් අනුමෝදන් වුණා.

මේ සියල්ල කළේ භව සම්පත් පතා නොවෙයි. ලොවුතුරා බුදුබව පතාගෙනයි. ඒ බව සත්‍ය යි. ලොව බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා පහළවූ බව සත්‍යයි. මෙම සත්‍යානුභාවයෙන් ගිනි අඟුරු වල මැද්දෙන් මැඩගෙන මේ දානය දී ගන්ඩ ලැබේවා යි, කියල අධිෂ්ඨාන කර ගත්තා. පසේ බුදුරජාණන් වහන්සේට ඇහෙන්න ගාථාවකින් ආරාධනා කළා. තුන්ලොවට පිහිට වෙන පින් කෙතක් වූ උත්තමයන් වහන්ස!

මම දැන් මේ ගිනි අඟුරු වල මැද්දෙන් පැනගෙන දානය පූජා කරන්න එනව. මම මේ ගිනි අඟුරු වලට පනින කොට මගේ හිස යටිකුරු වෙන්න පුළුවන්. ස්වාමීනි, පා උඩුකුරු වෙන්න පුළුවන්. ඒ වේලාවේ මට අනුග්‍රහ පිණිස, මේ දානය පිළිගන්නා සේක්වා කියල. අර බුර බුරා ගිනිදැල් නඟින කිහිරි ගිනි අඟුරු වලට පැන්නා. පුදුම ආශ්චර්යයක්. උන්වහන්සේ උන්වහන්සේගේ ආත්ම විශ්වාසයක් තිබුණා, මම ජීවිතය පරිත්‍යාග කරල මේ දානය දෙනවා කියල. උන්වහන්සේ විසින් සසර දී කර ගත්තාවූ පාරමී බලයත්, මේ උදාර වූ ප්‍රතිපත්ති ගුණධර්ම බලයත් නිසා. හිතක් පිතක් නැති මේ මහා පොළොවෙ අර ගිනි අඟුරු වල මැද්දෙන් රිය සකක් තරම් (කරත්ත රෝදයක් තරම්) විශාල නෙලුම් මලක් පහළ වුණා. උන් වහන්සේ පස්වණක් ප්‍රීතියෙන් පින පිනා නෙලුම් මල උඩ වැඩ ඉඳගෙන, බලවත් ශ්‍රද්ධාවෙන් බුදුබව පතාගෙන පසේ බුදුරජාණන් වහන්සේට දානය පූජා කළා. බලාගෙන සිටිය අයට අසීමිත සන්තෝශයක් ඇති වී ඔවුන් සාධුකාර දෙන්ට පටන් ගත්තා. මේ මහා බෝධිසත්වයන් වහන්සේ සැමට පින් දීමක් කළා. සත්පුරුෂයිනි, දන් දෙන්න බය වෙන්න එපා. පින්කම් කරන්න බයවෙන්ට එපා. ජීවිතය ගැන ද නොබලා මම ගින්නට පැන්නා. මා හැසුරුනා වූ ධර්මය මට පිහිට වෙලා නෙලුම් මලක් පහළ වුණා. මට වැඩ ඉන්න. මේ නෙලුම් මල උඩ වැඩ ඉඳගෙන මේ දානය දීමෙන්, යම් පිනක් අත්කර ගත්තා නම්, දෙවියන් සහිත සමස්ත ලෝකයාට

මේ පින අත්වේවා. මේ ගිනි අඟුරු වල මැද්දේ හිටගෙන මේ දානය පූජා කළ පිනෙන්, දෙවියන් සහිත ලෝකයාගේ කෙලෙස් ගිනි නිවා අමාමහ නිවන් සුව බෙදා දෙනු පිණිස, මට මතු ලොවුතුරා බුදුබව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, දෙවියන් සහිත ලෝකයාට පින් දෙමින් ගිනි අඟුරු වලෙන් ගොඩ වුණා.

පරාජයට පත් වූ මාර දිව්‍ය පුත්‍රයා ද දෙව්ලොවට ගියා. මේ පුදුම ආශ්චර්ය බෝධිසත්ව ජීවිතයක්. මේ වාගේ අනේක ජාති සිය දහස් ගණන්හිදී මාරයන් පළවා හරිමින්, ගිනි නිවමින්, වැසි වස්සවමින්, පොලොව කම්පා කරවමින්, උදාර අධිෂ්ඨානයෙන් දාන, සීල, නෙක්ඛම්ම ආදී පාරමී පුරන්නට හැකි වුණේ සම්පක්ඛන්දන ලක්ඛණ ශ්‍රද්ධාවේ මහිමයෙන්.

### ඕකප්පන ලක්ඛණ සද්ධා

මඩ වගුරෙක ඉන්නක් හිටෙව්වා නම්, ඇද වැටෙනවා. දහයියා ගොඩක ඉන්නක් හිටෙව්වා නම් ඇද වැටෙනවා. එසේ නොමැතිව අටරියනක් දිග ඇති "නා කඳක්, ඇසළ කඳක්" වැනි හර ඇති දැව කඳක්, හතර රියනක් ම පොළොවේ හිටවලා හතර රියනක් පොළොවෙන් උඩට තියනවා. මේකට කියනවා "ඉන්ද්‍රඛීලය" කියල.

නගර ද්වාරවල නගර දොරටුව සවිකරල තිබෙන්නේ මේ වාගේ ඉන්ද්‍රඛීලවල. සිවු දිගින් හමා එන සැඩ මාරුතයකින්, සුළඟකින් වත් මේ ඉන්ද්‍රඛීලය සොලවන්නට බැහැ.

ඒ වගේම බුද්ධ, ධම්ම, සංඝ යන තුනුරුවන්ගේ ගුණය කෙරෙහි පත්ලටම පිහිටුවා ගත් නොසැලෙන ශ්‍රද්ධාවට කියනවා ඕකප්පන ලක්ඛණ ශ්‍රද්ධා. මෙන්න මේ ඕකප්පනලක්ඛණ ශ්‍රද්ධාවයි මෙතැන ගැනෙන්නේ.

### ආගම ශ්‍රද්ධා

නියත විවරණ ලබා ගත්ත බෝධිසත්වයින් වහන්සේලාට කාගේවත් උපදේශයක් නැතිව භවයක් පාසා ශ්‍රද්ධාව පිහිටනවා. දාන, ශීල, නෛෂ්ක්‍රම්‍යාදී පාරමී පුරන්න. මෙසේ ආත්ම

භාවයෙන්, ආත්ම භාවයට පිහිටන ශ්‍රද්ධාවට කියනව ආගම ශ්‍රද්ධාව කියල.

## අධිගම ශ්‍රද්ධා

සෝවාන් ආදි මාර්ගඵල ලාභී උත්තමයන්ට පිහිටන මාර්ගඵල ප්‍රතිලාභයෙන් ලැබෙන ශ්‍රද්ධාව. මෙය මාර දිව්‍ය පුත්‍රයාටවත් සොලවන්නට බැහැ. අධිගම ශ්‍රද්ධාව.

මෙන්න මේ ශ්‍රද්ධාවේ අවස්ථා හය අතුරින් මෙතැන ගැනෙන්නේ ඕකප්පන ලක්ඛණ ශ්‍රද්ධාව. චිත්ත සම්පහන් සනයෙහි ඉසුරුමත් බවක් දරන බැවින් සති ඉන්ද්‍රිය කියන්නේ සති චෛතසිකයටයි. මේ සති චෛතසිකය බුදුරජාණන් වහන්සේ අප්‍රමාදය නමින් හඳුන්වල තියෙනවා.

"අප්පමාදේන භික්ඛවේ සම්පාදේථ" කියල සුගතෝ වාදය නමින් දේශනා කරල තියෙන්නෙ. අප්‍රමාදය නම් එලඹසිටි සිහිය යි. මේ සති චෛතසිකය කුසල් අරමුණු සිහිපත් කරවීමේ ප්‍රධාන බැවින් සති ඉන්ද්‍රිය නම් වෙනවා. සමාධි ඉන්ද්‍රිය නමින් හඳුන්වන්නේ ඒකාග්‍රතා චෛතසිකය යි. මෙය සර්ව චිත්ත සාධාරණ චෛතසික හතට අයත් එකක්, ඒකාග්‍රතාව මෙතැන දී හඳුන්වන්නේ ඉසුරුමත් බවට පැමිණියා වූ සමාධිය හෙවත් ඒකාග්‍රතාවයි. අවික්ෂේප අර්ථයෙහි ඉසුරුමත් බවක් දරන්නේ මේ සමාධි ඉන්ද්‍රිය යි. ප්‍රඥා ඉන්ද්‍රිය නමින් හඳුන්වන්නේ මෙතැන මුලින් සඳහන් කරන ලද සෝභන චෛතසික විසිපහ අතුරින් මුදුන්මල්කඩ වූ ප්‍රඥා චෛතසිකය යි.

මේ ඉන්ද්‍රිය ධර්ම පඤ්චකය යම් යම් ප්‍රමාණයකටද සත්ව සන්තානවල වැඩිල තිබෙන්නේ, ඒ ප්‍රමාණය මැනගන්නා වූ තීරණය කර ගන්නා වූ, ඥාණයටයි බුදුරජාණන් වහන්සේගේ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය, කියල හඳුන්වන්නේ.

දීර්ඝ සංසාරයේ බොහෝ දෙනෙක් නිවන් සුව පතාගෙන දාන, සීල, භාවනාදී කුසල් කරගෙන ඇවිත් තිබෙනවා. බුදුරජාණන් වහන්සේට ඒ කුසල් කළා වූ පුද්ගලයන් අරමුණු වෙනව බුදු

ඇසට.

සෑම දවසේම දින චරියාවක් සර්වඥයන් වහන්සේගේ පවත්වනු ලැබුව, දවස කොටස් පහකට බෙදාගෙන. එම කොටස් පහ නම්:

1. පුරේභත්ත කිච්ච, 2. පච්ඡාභත්තකිච්ච, 3. පුරිමයාම කිච්ච, 4. මජ්ඣිමයාම කිච්ච, 5. පච්ඡිමයාම කිච්ච.

උදේ වරුවේ ඉර උදාවූ තැන් පටන් ඉර මුදුන්වීම දක්වා කෙරෙන බුදුරජාණන් වහන්සේගේ කටයුතු පුරේභත්ත කිච්චය යි. ඉර මුදුන්වූ තැන් පටන් ඉර බැස යනතුරු සවස් වරුවේ කරන යහපත් කටයුතු පච්ඡාභත්ත කිච්චය යි. සවස 6 සිට රාත්‍රී 10 දක්වා පූර්ව යාමයේ දී කෙරෙන්නේ පුරිමයාම කිච්චය යි. රාත්‍රී 10 සිට 2 දක්වා පැය 4ක් මුළුල්ලේ කෙරෙන්නේ මජ්ඣිමයාම කිච්චය යි. රාත්‍රී 2 සිට පසුදා ඉර උදාවන තුරු කෙරෙන කටයුතු පශ්චිම යාම කිච්චය යි. මේවා හැමදාම සූර්ය මණ්ඩලයාගේ දින චරියාව වගේ අඛණ්ඩව පවත්වනු ලැබුවා. එයින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අලුයම් කාලයේ භික්ෂූන් වහන්සේලා වඩින තෙක් ගන්ධකුටියේ දොර විවෘත කරලා වැඩසිටිනවා. භික්ෂූන් වහන්සේලා පැමිණියාම සුගතෝවාදයෙන් අවවාද කරල පිඩුසිඟා වඩිනවා. එකලාවත් පිණ්ඩපාත චාරිකාවේ වඩිනවා. පිරිස පිරිවරාගෙනත් පිණ්ඩපාතෙ වඩිනවා. එසේ පිඩුසිඟා වැඩමකරලා, දන් වළඳලා, භුක්තානුමෝදනාව පවත්වල, ගන්ධ කුටියට පැමිණ, සමවත් සුවයෙන් වැඩ ඉන්නව භික්ෂූන් වහන්සේලා නැවත එකතු වනතුරු. භික්ෂූන් වහන්සේලා රැස් වූ විට, සුගතෝවාදයෙන් අවවාද කරල භාවනා කමටහන් වඩන්න පිටත් කරනවා. මේ පුරේභත්ත කිච්චය යි.

උන්වහන්සේ සවස් වරුවේ මහජනයා බණ අසන්න එන වේලාව දක්වාම සමාපත්තියෙන් වැඩ සිටිනවා. බණ පිරිස රැස්වුණාම, දම්සභා මණ්ඩපයට වඩමවා සවස පහ හය පමණ වනතුරු මහජනයාට ධර්ම දේශනා කරමින් කාලය ගෙවල, බණ පිරිස නැඟී ගියාට පසුව, ආනන්ද ස්වාමීන් වහන්සේ වැනි

උපස්ථායකයන් වහන්සේලා විසින්, පිළිගන්වන උණුපැන්, සිසිල් පැන්වලින් ගත සනසලා, මහාකරුණා සමාපත්තියට සමවදිනවා. භික්ෂූන් වහන්සේලා රුක් සෙවනවලින්, කුටි ගෙවල්වලින්, කමටහන් වඩල ආපසු ගන්ධකුටියට රැස්වන තුරු, දම්සභා මණ්ඩපයට එන තුරු, සමවත් සුවයෙන් වැඩ සිටිනවා. මෙයට කියනවා පච්චා භත්ත කිච්ච කියල.

භික්ෂූන් වහන්සේලා පැමිණියාම සමාපත්තියෙන් නැගිටලා රාත්‍රි 10 වනතුරු භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් කාලය ගෙවනවා. ධර්ම දේශනා කරමින්, භාවනා කමටහන් පිරිසිඳු කර දෙමින්, ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ශික්ෂාපද පනවන්න අවශ්‍ය නම් ශික්ෂාපද පනවමින්, කාලය ගෙවනවා. මේ විදිහේ කටයුතු සඳහා රාත්‍රි 10 දක්වා ගෙවනවා. මේ පූර්වයාම කිච්චය යි.

භික්ෂූන් වහන්සේලා කුටි සෙනසුන්වලට වැඩියාට පසු රාත්‍රි මධ්‍යම යාමයේ දෙවියෝ, බ්‍රහ්මයෝ, නාග, සුපර්ණ ආදීහු එනව බණ අහන්නට. ඔවුන් වෙනුවෙන් රාත්‍රි සිංහල පැයෙන් පැය 10ක්. ඔර්ලෝසු පැයෙන් පැය 4ක් ගත කරනවා 2 දක්වා, මේ මජ්ඣිමයාම කිච්චය යි.

මෙතෙක් වේලා දවසේ වැඩි වේලාවක් වාඩිවීමේ ඉරියව්වෙන් ගතකළ බැවින්, රාත්‍රි 2 සිට 3.20 දක්වා සර්වඥයන් වහන්සේ සක්මන් භාවනාවේ යෙදෙනවා. 3.20 සිට 4.40 දක්වා පැයකුත් විනාඩි 20ක් දකුණු ඇලයෙන් සිංහ සෙය්‍යාවෙන් සැතපී වදාරනවා සතෝ සම්පජානකාරීව. උට්ඨාන සඤ්ඤාව මෙනෙහි කරලා උන්වහන්සේ සමාපත්තියකට සමවැදුනාක් මෙන්, සැතපී වදාරනවා. මෙපමණයි ගන්න විවේකය.

ඉන්පසු 4.40 සිට හිරු උදාවන තුරු භික්ෂූන් වහන්සේලා උපදෙස් ලබා ගන්නට, අවවාද ලබා ගන්නට, රැස්වන තුරු දොළොස්කෝටි ලක්ෂවාරයක් මහාකරුණා සමාපත්තියට සමවදිනවා. ඉන්පසුව සමවතින් නැගී සිට බුදුඇසින් ලොව බලා වදාරනවා. සුගන්ධකුටියේ සිට දසදහසක් සක්වල එහා කෙළවර දක්වාම බුදුඇස විහිදුවල ඒ දවසේ මගඵල, නිවන්සුව ලබන්න

සුදුස්සන් සහ බණ ඇසිය යුතු පුද්ගලයන්, ඒ බුදුඇසට මැවී පෙනෙනවා.

සන්ධ්‍යාවේ දොළොස්කෝටි ලක්ෂවාරයක් මහාකරුණාවට සමවැදී බුදුඇසින් ලොව බලා වදාරලා, නැවතත් සනිටුහන් කර ගන්නව රාත්‍රි කාලයේ දී ධර්මදේශනා කළ යුතු ආකාරය.

මෙන්න මෙසේ උදේ පාන්දරම අර බුදුඇස විහිදුවීමෙන් කරන්නේ. ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණය, ආසය අනුසයේ ඤාණ දෙකට කියන්නේ "බුදු ඇස" කියලා. බුදුඇස කියන්නේ අවබෝධ කළ යුතු පුද්ගලයන්, තෝරාගන්නා ඤාණයටයි. ප්‍රඥා චක්ඛු පහක් තිබෙනවා සම්මා සම්බුදුරජාණන් වහන්සේට. ඒ අතුරින් මේ බුදුඇස, ඤාණ දෙකක්. ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණය සහ ආසය අනුසය ඤාණය යන ඤාණ දෙක එම ඤාණ චක්ඛු පහෙන් එකක්.

ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා කියන ඉන්ද්‍රිය ධර්ම පඤ්චකය, ඒ ඒ සත්ව සන්තාන තුළ කොපමණ දුරට වැඩී තිබෙනවා ද කියා වෙන කිසිම ඤාණයකින් තෝරාගන්නට බැහැ. ශාරිපුත්‍ර මහරහතන් වහන්සේටවත්, තෝරාගන්න බැහැ ඒ ඒ පුද්ගලයන්ගේ කොපමණ දුරට මේ ඉන්ද්‍රිය ධර්මයන් වැඩිල තිබෙනවාද කියල. එක දවසක් සැරියුත් මහ රහතන් වහන්සේ, ගෝල නමක් එක්කරගෙන වැඩිය බුදුරජාණන් වහන්සේ මුණ ගැහෙන්න. අසා සිටියා,

"ස්වාමීනි, මේ මගේ ශිෂ්‍යයෙක්. මාස හතරක් අසුභ කර්මස්ථාන වැඩුවා. කිසිම අධිගමයක් නැහැ. භාග්‍යවතුන් වහන්සේගෙන්වත් සුදුසු කමටහනක් ලැබේවා" කියල බාර දුන්නා. භාග්‍යවතුන් වහන්සේ වදාළා, ශාරීපුත්‍රය එහෙමනම්, සන්ධ්‍යාවේ අසවල් වේලාවට එන්න. එතකොට මේ රහත්වෙලා. එක්කරගෙන යන්න පුළුවන්.

උදේවරුවේ මේ කථාව, උදේ වරුවේ පිණ්ඩපාතේ වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ පිණ්ඩපාතෙන් අනතුරුව, මේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේට මවා දුන්නා රතු නෙළුම් මලක්. මේ කුටියේ

පිටුපස වැලිගොඩක් උඩ තියාගෙන බලාගෙන ඉන්නයි කියල අවසර දුන්නා. ඒ වගේම මල දෙස බලාගෙන හිටියා. මේ ස්වාමීන් වහන්සේට ටික වේලාවකින් ලෝහිත කසිණ සමාපත්තිය ලැබුණා. කසිණ භාවනාවක් වුණා නෙළුම්මල. නෙළුම් මලේ රතුපාට අරමුණු කරගෙන, ලෝහිත කසිණ භාවනාවෙන් ධ්‍යාන ලැබුණා.

ඒ ධ්‍යානයෙන් විදර්ශනාවට හැරුනා. විදර්ශනාවට හැරී සිටින වේලාවේ භාග්‍යවතුන් වහන්සේ බුදුරැස් මාලාවක් විහිදුවල ගාථාවකින් ධර්ම දේශනාවක් ද කළා. සතරපද ගාථාව අවසන් වෙනකොට ම, සතර මඟඵල පිළිවෙළින්, අර්හත්වයට පත්වී වදාළා. උන්වහන්සේ රහත්වෙලා බුදුරජාණන් වහන්සේට පූජා කරන්න ආව රහත් ගුණයෙන්.

ශාරීපුත්‍ර රහතන් වහන්සේ ද ඒ වෙලාවේ වැඩියා. අවසර දුන්නා. ශාරීපුත්‍රය! හාරමාසයක් වීරිය කරල විශේෂ අධිගමයක් නොලද මේ නම, එක වරුවක දී අර්හත්වයට පත්වුණා. දැන් බාරගන්න.

මේ මොන ආශ්චර්යයක් ද? ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණයේ ආශ්චර්ය යි. මේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ පෙර ආත්ම 500ක්ම රන්කරුවෙක්. රන්කරුවෙක් රන් කැබලි උණුකරන වේලාවේ නෙළුම් මලක ආකාරයෙන්නෙ ගිනි දල්වන්නේ, මෙසේ නෙළුම් මලක ආකාරය නිතර නිතර දැකල දැකල අරමුණු වෙලා භාවනාවක් වශයෙන් පුරුදු වෙලා තිබුණා. ඒක තථාගතයන් වහන්සේ පමණයි දන්නේ. සියල්ල දත් භාග්‍යවතුන් වහන්සේ මවාදුන් නෙළුම් මල අරමුණු කරගෙන එකම ඉරියව්වේ දී, සියලු කෙලෙස් නසා අර්හත්වයට පත්වන්න සමර්ථ වුණා. මෙන්න ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණයේ ආනුභාවය.

ඒ වාගේම එක්තරා කුලපුත්‍රයෙක් සැවැත්නුවර සිල්වත් භික්ෂූන් වහන්සේ නමක් දැකල පැහැදිලා උන්වහන්සේ වෙත ගොස් ඇසුවා, ස්වාමීනි, මටත් පින්කමක් කියල දෙන්න හැකි ද? ... උන්වහන්සේ වදාළා උපාසක තුමනි, එහෙම නම් දන්දීම ටික

ටික පුරුදු කරගන්න. තව ටික දවසකින් මෙයා කිව්ව. ස්වාමීනි, මට දැන් දන්දෙන්න පුළුවනි. ඊට වඩා පින්කමක් කියා දෙන්න කියල ආරාධනා කළා.

එහෙම නම් "තිසරණය" සමාදන් වෙන්නයි කියල උපදෙස් දුන්නා, තවත් දවසක් මෙතුමා පැමිණ කිව්වා, මම දැන් තිසරණය සමාදන්ව රකිනව. මේක බොහෝම ලෙහෙසියි. මීට වඩා තව පින්කමක් කියල දෙන්න, එහෙම නම් "පංචශීලය" සමාදන් වෙන්න, පංචශීලය සමාදන් වූ මෙතුමා, තවත් දවසක කිව්ව, මම පංචශීලය හොඳට රකිනව. මීටත් වඩා හොඳ පින්කමක් කියල දෙන්න,

එහෙම නම්, පොහොය "අටසිල්" සමාදන් වෙන්න, අටසිල් සමාදන් වෙලා මෙයා කිව්වා, මට දැන් අටසිල් බොහොම හොඳට රකින්න පුළුවන්. තවත් මීට වඩා හොඳ දෙයක් කියල දෙන්න,

එහෙම නම් ගහට්ඨ "දසසීලය" සමාදන් වෙන්න, එයද සමාදන් වූ මෙතුමා තවත් ටික දවසකින් කිව්වා මට දැන් ගහට්ඨ දස සීලය බොහෝම හොඳට ආරක්ෂා කරන්න පුළුවන්. මීට වඩා තව හොඳ පිළිවෙතක් මට කියල දෙන්න, එහෙම නම් පැවිදිවෙන්න, ඉතින් මේ උපාසකතුමා මහණවුණා. පැවිදිවෙලා ආචාර්යන් වහන්සේ ළඟට යන යන හැම වෙලාවේම කියන්නේ අභිධර්මය. උපාධ්‍යායන් වහන්සේ ළඟට යන යන හැම වෙලාවේම කියන්නේ විනය කර්ම, සියල්ල ගැඹුරුයි. අභිධර්මයත් ගැඹුරුයි. මතක තියා ගන්න බැහැ. විනය කර්ම අප්‍රමාණයි. මේක කැපයි, මේක අකැපයි, මේක කළ යුතුයි, මේක නොකළ යුතුයි, කිය කියා කෝටි ගණන් ශික්ෂාපද. මේ නවක භික්ෂූන් වහන්සේ භය වුණා. භයවෙලා කිව්ව, අනේ මම ගිහි කාලෙ නම් හොඳට පින්කම් කළා. දැන් නම් මට මේක බරපතලයි. මේ සිල් රකින එක පුළුවන්. මේවා මතක තියා ගන්නයි බැරි. ඒක නිසා මම ගිහිවෙන්න ඕනෑ කියල ආචාර්යන් වහන්සේට කිව්ව. ඉතින් ආචාර්යන් වහන්සේ භාවනාවක් දීල තිබුණා. ඒක හරිගියේ නැහැ. ගිහිගෙට යන්න හිතුව. පස්සේ බුදුරජාණන් වහන්සේ

ළඟට එක්කරගෙන ගියා. කියා සිටියා, ස්වාමීනි, මේ මගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නමක්. බොහෝම ශ්‍රද්ධාවෙන් පැවිදි වුණා. දැන් ගෙදර යන්න ඕනෑ කියනව.

භාග්‍යවතුන් වහන්සේ ඇසුවා, මොකද මහණ, අනේ ස්වාමීනි, මම බොහෝම ශ්‍රද්ධාවෙන් මහණ වුණේ. නමුත් ස්වාමීනි, මේ කෝටි ගණන් තියෙන ශික්ෂාපද මට මතක තියා ගන්න බැහැ. ඒක නිසා මට බයයි. හොඳයි, මේ කෝටි ගණන් තියෙන ශික්ෂාපද එකක් රැක්කොත් ඔක්කොම රැකෙනව. එකක් නොරැක්කොත් තමයි, සියල්ලම කැඩෙන්නේ. පුළුවන්ද මේ නමට එකක් රැකගන්න. එහෙමයි ස්වාමීනි, එකක් නම් පුළුවනි රැකගන්න. එහෙම නම් මේවා ඔක්කෝම රැකෙන්නෙ තමන්ගේ සිත ආරක්ෂා කර ගැනීමෙන් දරුව, තමන්ගේ හිතේ ලෝභයක්, ද්වේෂයක්, මෝහයක්, ඇති නොවන හැටියට සිහියෙන් ආරක්ෂා කර ගන්න. මෙන්න එයට සුදුසු කමටහන. චිත්තානුපස්සනාව දුන්නා. උන්වහන්සේ බොහෝම සතුටින් බාරගෙන භාවනා කළා. ඉතාම සුවසේ නොබෝ දවසකින් සියලු කෙලෙස් නසා අමා මහ නිවනට පත්වුණා. රහත් වුණා. මේ කවර ආශ්චර්යයක් ද? අර උපාධ්‍යායන් වහන්සේටවත්, ආචාර්යයන් වහන්සේටවත්, සොයාගන්න බැරි දැක්මක් ඒ සර්වඥයන් වහන්සේ දැක ගත්තා. මේ භික්ෂූන් වහන්සේගේ සිත බොහෝම දියුණු සිතක්. මේ භික්ෂූන් වහන්සේගේ ඉන්ද්‍රිය ධර්මයන්, මෙපමණ දුරට දියුණු වෙලා තියෙනවා කියලා. මේ ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්මයන්ගේ දියුණු තත්වය සම්මා සම්බුදු රජාණන් වහන්සේ පමණයි දැකගත්තේ. ඒ නිසා නිසි කමටහන ලැබුණා. ඒ කමටහන ඔස්සේ ඒ භික්ෂූන් වහන්සේගේ සිත සමාධිගත වුණා. විපස්සනා ඤාණ වැඩුනා. ඉතාම සුවසේ සතර මගඵල පිළිවෙළින් අර්හත්වය අවබෝධ වුණා.

මෙන්න මේ වාගේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ මගඵල නිවන්සුව ලබන්න සුදුසු පුද්ගලයන්ගේ ශ්‍රද්ධාව කොපමණ ද වැඩිල තිබෙන්නේ, විරිය කොපමණ ද වැඩිල තිබෙන්නේ, විරිය

කොපමණ ද දියුණුවෙලා තිබෙන්නේ, සතිය, සමාධිය, ප්‍රඥාව කොපමණ වැඩිල තියෙනවද කියල තුලාවකින් මැන බලන්නාක් මෙන් උන්වහන්සේ මැනල බලනව. මේ තැනැත්තාගේ ඉන්ද්‍රිය වැඩිල තියෙන්නේ සෝවාන් වෙන්න පමණයි. මේ තැනැත්තාට සකෘදාගාමී වෙන්න පුළුවන්. මේ තැනැත්තාට අනාගාමී වෙන්න පුළුවන්. රහත් වෙන්න පුළුවන්. ත්‍රිවිද්‍යා ලැබෙනවා. ෂට් අභිඥා ලැබෙනවා. සිවු පිළිසිඹියා ලැබෙනවා. මේ ආදි වශයෙන් ඒ ඒ පුද්ගලයන්ගේ සන්තාන තුළ, ශ්‍රද්ධා ආදි පංච ඉන්ද්‍රිය ධර්මයන්ගේ, උස්පහත් බව තේරුම් ගන්නා වූ ඥාණයටයි, ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය කියල හඳුන්වනු ලබන්නේ.

පරානිච, අපරානිච, පරාපරානි
පරාපරානං භාවෝ පරාපරියං
පරාපරානං භාවෝ පරාපරියං
පරාපරිය මෙව, පරෝ පරියත්තං, ඉන්ද්‍රියානං,
පරෝපරියත්තං ඉන්ද්‍රිය පරෝපරියත්තං.

මේ ආකාරයට මෙය සමාස විග්‍රහ වශයෙන් බෙදල තියෙනවා. උස් පහත් බව. කාගෙද? ඉන්ද්‍රියයන්ගෙ. ඉන්ද්‍රියයන්ගේ උස්පහත් බව මැනගන්නා වූ, දැන ගන්නා වූ, අවබෝධ කර ගන්නා වූ, ප්‍රඥාව ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය නම් වෙනව.

මෙතැනදී භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ යුගල ධර්ම පහක් ඉදිරිපත් කළා.

**1. අප්පරජක්ඛේ- මහාරජක්ඛේ**
**2. තික්ඛින්ද්‍රියේ - මුදින්ද්‍රියේ**
**3. ස්වාකාරේ - ද්වාකාරේ.**
**4. සුවිඤ්ඤාපයේ - දුවිඤ්ඤාපයේ**
**5. අප්පේකච්චේ - පරලෝකවජ්ජභයදස්සාවිනෝ**

**අප්පේකච්චේ න පරලෝකවජ්ජභයදස්සාවිනො** කියල යුගල යුගල වශයෙන් කොටස් පහක් දක්වා වදාළා, ප්‍රභේද වශයෙන් පනහක් වෙනව.

**අස්සද්ධෝ පුග්ගලෝ මහාරජක්ඛෝ**
**ආරද්ධ විරිය පුග්ගලෝ අප්පරජක්ඛෝ**
**කුසීතෝ පුග්ගලෝ මහාරජක්ඛෝ**
**උපට්ඨිතස්සති පුග්ගලෝ මහාරජක්ඛෝ**
**මුට්ඨස්සති පුග්ගලෝ මහාරජක්ඛෝ**
**සමාහිතෝ පුග්ගලෝ අප්පරජක්ඛෝ**
**අසමාහිතෝ පුග්ගලෝ මහාරජක්ඛෝ**
**පඤ්ඤවා පුග්ගලෝ අප්පරජක්ඛෝ**
**දුප්පඤ්ඤො පුග්ගලෝ මහාරජක්ඛෝ**

මේ උන්වහන්සේ බෙද බෙදා බලන හැටි. ශ්‍රද්ධා ඉන්ද්‍රිය උත්සන්න පුද්ගලයා, අල්ප රජස්කයි. ඒ කියන්නේ චිත්ත සන්තානයේ කෙලෙස් රජස් අඩුයි. "රජස්" කියල කියන්නේ කෙලෙස්වලට නමක්. "අක්ඛ" කියන්නේ චිත්ත සන්තානයේ "මනින්ද්‍රිය" මනින්ද්‍රියෙහි කෙලෙස් රජස් අඩු පුද්ගලයා ශ්‍රද්ධාවන්තයි. කෙලෙස් රජස් වැඩි පුද්ගලයා ශ්‍රද්ධාව අඩු පුද්ගලයෙක්. වීර්යවන්තයාගේ කෙලෙස් රජස් අඩුයි. කුසීත පුද්ගලයාගේ කෙලෙස් රජස් වැඩියි. එලඹ සිටි සිහිය ඇති පුද්ගලයාගේ කෙලෙස් රජස් අඩුයි. සිහි මුළා වූ පුද්ගලයාගේ කෙලෙස් රජස් වැඩියි. සමාහිත පුද්ගලයාගේ කෙලෙස් රජස් අඩුයි. අසමාහිත පුද්ගලයාගේ කෙලෙස් රජස් වැඩියි. ඥාණවන්ත පුද්ගලයාගේ කෙලෙස් රජස් අඩුයි. දුෂ්ප්‍රාඥයාගේ කෙලෙස් රජස් වැඩියි. මෙන්න භාග්‍යවතුන් වහන්සේ බෙදල බලන ආකාරය.

මේ මේ පුද්ගලයාගේ චිත්ත සන්තානයේ, මේ මේ කෙලෙස් බලපාන්නේ මේනම්, මේනම්, ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා ඉන්ද්‍රිය ධර්මයන් අඩු නිසයි, ශ්‍රද්ධා,විරිය, සති, සමාධි, ප්‍රඥා, ඉන්ද්‍රය ධර්මයන් වැඩි නිසයි, කියල මේ ශ්‍රද්ධා ආදි, පංච ඉන්ද්‍රිය ධර්මයන්, උන්වහන්සේ අල්ප රජක්ඛ, මහාරජක්ඛ යුගල අනුව බෙදල බලනව.

තික්ඛින්ද්‍රිය, මුදින්ද්‍රිය කියන එකත් මෙහෙමයි.

ශ්‍රද්ධාවන්තයා, තීක්ෂණ ඉන්ද්‍රිය ඇති කෙනෙක්.

අශ්‍රද්ධාවන්තයා, මෘදු ඉන්ද්‍රිය ඇති කෙනෙක්.

විරියවන්තයා, තීක්ෂණ ඉන්ද්‍රිය ඇති කෙනෙක්.

කුසීත පුද්ගලයා, මෘදු ඉන්ද්‍රිය ඇති කෙනෙක්.

එසේම, එළඹ සිටි සිහිය ඇති පුද්ගලයා තීක්ෂණ ඉන්ද්‍රිය ඇති කෙනෙක්. සිහිමුළා වූ පුද්ගලයා, මෘදු ඉන්ද්‍රිය ඇති කෙනෙක්. සමාහිත පුද්ගලයා තීක්ෂණ ඉන්ද්‍රිය ඇති කෙනෙක්. අසමාහිත පුද්ගලයා, මෘදු ඉන්ද්‍රිය ඇති කෙනෙක්. ඥාණවන්තයා, තීක්ෂණ ඉන්ද්‍රිය ඇති කෙනෙක්. දුෂ්ප්‍රාඥ පුද්ගලයා මෘදු ඉන්ද්‍රිය ඇති කෙනෙක්.

මෙසේ තික්ඛින්ද්‍රිය, මුදින්ද්‍රිය, යුගල වශයෙන් පුද්ගලයන් කොටස් දහයක් ඒ භාග්‍යවතුන් වහන්සේ දැන ගන්නව. මැන ගන්නව.

**"ස්වාකාරේ ද්වාකාරේ"**

ස්වාකාර කියන්නේ යහපත් පැවතුම් ඇති අය.

ද්වාකාර කියන්නේ අයහපත් පැවතුම් ඇති අය.

ශ්‍රද්ධාවන්තයා යහපත් පැවතුම් ඇති කෙනෙක්. අශ්‍රද්ධා වන්තයා අයහපත් පැවතුම් ඇති කෙනෙක්. මේ වාගේ විරිය, සති, සමාධි, ප්‍රඥාව, ඇති අය යහපත් පැවතුම් ඇති අය. ඒවායින් තොර පුද්ගලයා අයහපත් පැවතුම් ඇති පුද්ගලයෙක්.

මේ ආකාරයට ස්වාකාර, ද්වාකාර වශයෙන් පුද්ගලයන් කොට්ඨාශ දහයකට උන්වහන්සේ බෙදල දෙනවා. ඊළඟට තිබෙන්නේ,

**සුවිඤ්ඤාපයේ දුවිඤ්ඤාපයේ.**

සුවසේ අවබෝධ කළ හැකි පුද්ගලයා සුවසේ අවබෝධ කළ නොහැකි පුද්ගලයා කියා පුද්ගලයන් කොටස් දහයකට තථාගතයන් වහන්සේ බෙදා ගන්නවා.

ශ්‍රද්ධා ඉන්ද්‍රිය ඇති පුද්ගලයා සුවසේ අවබෝධ කළ හැකි කෙනෙක්. ශ්‍රද්ධා ඉන්ද්‍රිය නැති පුද්ගලයා සුවසේ අවබෝධ නොකළ හැකි කෙනෙක්. එසේම, විරිය, ස්මෘතිය, සමාධිය, ප්‍රඥාව ඇති පුද්ගලයා සුවසේ අවබෝධ කළ හැකි පුද්ගලයෙක්.

ඒවා අඩු පුද්ගලයා සුවසේ අවබෝධ නොකළ හැකි කෙනෙක්.

මෙසේ සුවසේ අවබෝධ කළ හැකි, නොකළ හැකි පුද්ගලයන් වශයෙන් දහ දෙනෙක් තෝරා ගන්නවා.

**අප්පේකච්චේ පරලෝකවජ්ජදහයදස්සාවිනෝ,**
**අප්පේකච්චේ න පරලෝකවජ්ජභයදස්සාවිනෝ.**

කියන එක තවත් යුගලයක්, මෙතැන දී පරලෝක කියන්නේ කුමක් ද? වජ්ජ කියන්නේ කුමක් ද? භය දස්සාවිනෝ කියන්නේ කුමක් ද? කියන එක අපි තෝරා ගනිමු.

**ලෝකෝති, ඛන්ධ ලෝකෝ, ධාතු ලෝකෝ, ආයතන ලෝකෝ, විපත්ති භව ලෝකෝ, විපත්ති සම්භව ලෝකෝ, සම්පත්ති භව ලෝකෝ, සම්පත්ති සම්භව ලෝකෝ,** කියා මේ ලෝකය උන්වහන්සේ බෙදා පෙන්වා දී තිබෙනවා.

ස්ඛන්ධ ලෝකය, ධාතු ලෝකය, ආයතන ලෝකය, කියල තුනයි. විපත්ති භව ලෝකය, විපත්ති සම්භව ලෝකය, කියල අකුසල විපාක දුක් විඳින ස්ථාන හා අකුසල කර්ම දෙකට බෙදනව සම්පත්ති භව ලෝකය, සම්පත්ති සම්භව ලෝකය කියා කුසල විපාක විඳින සුගතිය සහ කුසල කර්ම ලෝක නමින් මෙතැන දී පහදා වදාළා.

ලෝක කියන්නේ සංස්කාර ලෝකය යි. "ලෝක" කියන වචනයේ තේරුම හේතු ප්‍රත්‍යයන්ගෙන් හැදෙනවා, කැඩෙනව, බිඳෙනව, කැඩෙනව, බිඳෙනව කියන එකයි මෙතැන ලෝකය කියන්නේ.

ස්ඛන්ධ කැඩෙන බිඳෙන දේවල්. ධාතු කැඩෙන බිඳෙන දේවල්. සුගතිය, දුගතිය, කුසල්, අකුසල් මේවා සියල්ලම කැඩෙන බිඳෙන දේවල්. ඒ නිසා ඒ සියල්ලන්ට කියනවා, ලෝකය, ලෝකය කියල.

**ඒකෝ ලෝකෝ සබ්බේ සත්තා ආහාරට්ඨිතිකා**

සියලුම සත්ත්වයෝ ආහාරයෙන් යැපෙනවා කියා එක ලෝකයක් තියෙනවා.

**ද්වේ ලෝකා නාමඤ්ච - රූපඤ්ච**, නාම රූප කියා ලෝක දෙකක් තියෙනවා.

**තයෝ ලෝකා තිස්සෝ වේදනා.** වේදනා තුන නම් වූ ලෝක තුනක් තිබෙනවා.

**චත්තාරෝ ලෝකා, චත්තාරෝ ආහාරා**, සතර ආහාර නම් වූ ලෝක හතරක් තිබෙනවා.

**පංචලෝකා පංචුපාදානක්ඛන්ධා**, පංච උපාදාන ස්කන්ධය නම් වූ ලෝක පහක් තිබෙනවා.

**ඡ ලෝකා ඡ අජ්ඣත්තිකානි ආයතනානි.**

ආධ්‍යාත්මික ආයතන නම් වූ ලෝක හයක් තිබෙනවා. **සත්ත ලෝකා සත්ත විඤ්ඤාණට්ඨිතියෝ** සත්ත විඤ්ඤාණට්ඨිති නම් වූ ලෝක හතක් තිබෙනවා. **අට්ඨ ලෝකා, අට්ඨලෝකධම්මා.** අටලෝ දහම නම් වූ ලෝක අටක් තිබෙනවා.

**නවලෝකා නව සත්තාවාසා**, නවසත්තාවාස නම් වූ ලෝක නවයක් තිබෙනවා. **දසලෝකා, දස ආයතනානි**, දස ආයතන නම් වූ ලෝක දහයක් තියෙනවා. **ද්වාදස ලෝකා ද්වාදස ආයතනානි**, දොළොස් ආයතන නම් වූ ලෝක දොළහක් තිබෙනවා.

**අට්ඨාරස ලෝකා අට්ඨාරස ධාතුයෝ.**

අටලොස් ධාතු නම් වූ, ලෝක දහඅටක් තිබෙනවා.

මේ සියල්ලම ලුජ්ජන, පලුජ්ජන අර්ථයෙන් ලෝක නම් වෙනවා. මේ කියැවුණු දහම් පදයන් අතරට, ලෝකයට ඇතුළත් නොවන දෙයක් නැහැ. මේ සියල්ලම සංස්කාර ලෝකයට වැටෙනවා. මේ සංස්කාර ලෝකය ස්කන්ධ ලෝක, ආයතන ලෝක, ධාතු ලෝක නමින් මෙතැන හැඳින්වූවා.

අභිසංස්කාර වශයෙන්, කුසලාකුසල කර්මයන්ගේ විපාක විඳින ස්ථාන මෙතැන ගැනෙනවා.

කාමලෝක, රූප ලෝක, අරූප ලෝක, සඤ්ඤාලෝක, අසඤ්ඤා ලෝක, නේවසඤ්ඤානාසඤ්ඤා ලෝක, ඒකවෝකාර ලෝක, චතුවෝකාර ලෝක, පංචවෝකාර ලෝක, මේ සියල්ලම මෙතැන ගැනෙනවා. මේ තමයි ලෝකය.

හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් වෙනවා. කැඩෙනවා. බිඳෙනවා.

ඊළඟට වජ්ජ නමින් උන්වහන්සේ පහදා දුන්නා. **වජ්ජන්ති සබ්බේ කිලේසා වජ්ජා, සබ්බේ දුච්චරිතා වජ්ජා, සබ්බේ අභිසංඛාරා වජ්ජා, සබ්බේ භවගාමී කම්මා වජ්ජා.**

මෙන්න වජ්ජ නමින් සඳහන් කළ කොටස් හතර.

සබ්බේ කිලෙසා වජ්ජා, දස කෙලෙස් කියලා තිබෙනවා කොටස් දහයක් දස කෙලෙස් වස්තු. ඒවා බෙද බෙදී යනව 1500ක් ප්‍රභේද ගතවෙනවා. ඒ සියලුම කෙලෙස්වලට කියනවා වද්‍ය කියලා. වද්‍ය කියන්නේ "වරද" කියන එකයි.

සබ්බේ දුච්චරිතා වජ්ජා, කාය දුශ්චරිත, වාග්දුශ්චරිත, මනෝ දුශ්චරිත වශයෙන් තිබෙන සියලුම දුශ්චරිතයන්, වරද හැටියට පහදා වදාළා.

සබ්බේ අභිසංඛාරා වජ්ජා, සංසාර ගමන ඇති කරන, විසිනමයක් වූ චේතනා, පුණ්‍යාභිසංස්කාර, අපුණ්‍යාභිසංස්කාර, ආනෙඤ්ජාභි සංස්කාර, කියන කුසලා කුසල විසිනමයම වරද හැටියට පහදා දක්වල තිබෙනවා.

මෙන්න මේ ලෝකය ගැනත්, වරද ගැනත්,

**තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හෝති,**
**ඉති ඉමස්මිඤ්ච ලෝකේ, ඉමස්මිඤ්ච වජ්ජේ,**
**තිබ්බා භයසඤ්ඤා පච්චුපට්ඨිතා හෝති.**

මේ ලෝකය ගැනත්, මේ වරදවල් ගැනත්, යම් කෙනකුගේ හිතේ දැඩි ලෙස ඤාණසම්ප්‍රයුක්ත භයක් තිබෙනවා නම්,

සෙයයාපි උක්ඛිත්තාසිකේ වධකේ. කඩුවක් අමෝරාගත් වදකයෙකු පසුපස එන වෙලාවේ යම් භයක් වෙයි නම්, ඒ වාගේ සංසාරය ගැන, ලෝකය ගැන, වරදවල් ගැන, පාපයන් ගැන, භයක් ඇති අය වෙයි නම්, අන්න ඒ අයට කියනවා පරලෝක වජ්ජභයදස්සාවිනෝ කියලා. ඒ වගේම ලෝකය ගැනවත්, සංසාරය ගැනවත්, කෙලෙස් ගැනවත්, අකුසල් ගැනවත්, කිසිම භයක් නැත්නම්, යම් කෙනෙකුගේ තැති ගැනීමක් නැත්නම්, ඒ අයට කියනව න පරලෝකවජ්ජභයදස්සාවිනෝ කියලා. ඒ

වගේම ලෝකය ගැන, පරලෝකය ගැන, වරද ගැන, භයක් නැති, තැති ගැනීමක් නැති, අයට කියන්නේ "අභව්‍ය"පුද්ගලයෝ කියලා. පරලොව ගැන, පාපයන් ගැන, වරද ගැන, භය දක්නාසුලු පුද්ගලයාට කියන්නෙ "භව්‍ය" පුද්ගලයා කියලා. ඒ භව්‍ය පුද්ගලයන්ට තමයි ධ්‍යාන ලැබෙන්නේ. නිවන් අවබෝධ වන්නේ. අභව්‍ය පුද්ගලයන්ට ඒ කිසිවක් ලබන්න බැරි වෙනවා. සුගතියකටවත් යා ගන්න බැරිවෙනවා.

මෙන්න මේ ආකාරයට සම්මා සම්බුදු රජාණන් වහන්සේ සත්ව පුද්ගල කොට්ඨාසයන් පනහක් මෙතැන බෙදනු ලැබුවා.

ඉති ඉමාය පඤ්ඤාසාය ආකාරේහි පඤ්චින්ද්‍රියානි ජානාති අඤ්ඤාති පටිවිජ්ඣති ඉදං තථාගතස්ස ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණං.

භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ, මේ සම පනස් ආකාරයකින් ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්මයන් පිළිබඳව විවිධාකාරයෙන් බෙද බෙදා දකින ඤාණයෙන් සමන්වාගත වෙනවා.

මේ අති උත්තරීතර ඤාණයට කියනවා ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණය කියලා.

මේ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණය පිළිබඳව පටිසම්භිදා මග්ග පාලියේ එන සූත්‍ර පාඨයන් අනුව කෙටි හැඳින්වීමකුයි ඉදිරිපත් කරන්න යෙදුනෙ. මේ සම්බන්ධව දහම් කරුණු රාශියක් පැහැදිලි කරන්න තිබෙනවා. එම දහම් කරුණු පැය ගණනක් නොව, දවස් ගණනක් ප්‍රකාශ කළත් අවසන් කරන්නට බැහැ.

මේ ඉන්ද්‍රිය පරෝපරිය ඤාණයෙන් ආසයානුසායේ ඤාණයෙන් සමන්වාගත බැවින් සර්වඥයන් වහන්සේ බුදු ඇසින් ලෝක ධාතුව බලා වදාරා, දෙවියන් සහිත ලෝකයාට අමා දහම් වැසි වස්සවලා, සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් මාර්ගඵල පිළිවෙළින් අමාමහ නිවන අවබෝධ කරවා දෙනවා.

මෙසේ ලොවට වැඩ සැලසුවා වූ, සූවිසි අසංඛෙය්‍ය ගණන් ජනතාව අමාමහ නිවන් පුර පමුණුවා වදාළා වූ, සුදු බුදුරැස්

විහිදෙන දළදා ස්පර්ශ කරමින් සුවාසූ දහසක් ධර්ම ස්කන්ධය දේශනා කළා වූ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණයෙන් සහ ෂට් අසාධාරණ ඥාණයන්ගෙන් සමන්වාගත වූ දේවාතිදේව වූ ශක්‍රාති ශක්‍ර වූ, මාර පරාජය කළා වූ ත්‍රෛලෝක තිලක වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේට කයින් වචනයෙන් සිතිනුත් අපේ නමස්කාරය වේවා. ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ බුදු ඇසට අප ද පෙනේවා. උන්වහන්සේගේ බුදු ඇසින් දැක දේශනා කොට වදාළා වූ ශ්‍රී සද්ධර්මය අපට සුවසේ අවබෝධ වේවා.

ඒ භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය සහිත ෂට් අසාධාරණ ඥාණ ධාතූන්ගෙන් පෙරි පෙරී පිරිසිදුව දේශනා කළා වූ, සුවාසූ දහසක් ධර්මස්කන්ධයට සහ ආයයී මහා සංඝරත්නයට ද අපේ සිතින් කයින් වචනයෙන් නමස්කාර වේවා!

ඒ භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට අපේ ජීවිතය ද පූජා වේවා. උන්වහන්සේ දේශනා කළ අමා දහම් පදයක් පාසා අපට ධර්මඥාණය, භාවනාඥාණය දියුණු වී, අපි බලාපොරොත්තු වන ධ්‍යාන, විදර්ශනා, සෝවාන්, සකෘදාග ාමි, අනාගාමි, අර්හත් මාර්ගඵල පිළිවෙළින් ශාන්ත සදාකාලික අමාමහ නිවන් සුව සාක්ෂාත් වේවා යි ප්‍රාර්ථනා පිහිටුවා ගනිමු.

සාදු! සාදු!! සාදු!!!

**ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණ ධර්ම දේශනාව නිමි.**

# 2. ආසය අනුසය ඤාණ ධර්ම දේශනය

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස*

දුක්ඛේ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ නිරෝධේ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ නිරෝධ ගාමිනිපටිපදාය ඤාණං බුද්ධ ඤාණං
අත්ථ පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
ධම්ම පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
නිරුත්ති පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
පටිභාන පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණං බුද්ධ ඤාණං
සත්තානං ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං
යමක පාටිහාරියේ ඤාණං බුද්ධ ඤාණං
මහාකරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං
සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං
අනාවරණ ඤාණං බුද්ධ ඤාණං
ඉමානි චුද්දස බුද්ධ ඤාණානි, ඉමේසං චුද්දස
බුද්ධ ඤාණානං අට්ඨ ඤාණානි සාවක සාධාරණානි
ඡ ඤාණානි අසාධාරණානි සාවකේහීති.

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත් වූ, අර්හත් වූ, සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ **ෂට් අසාධාරණ ඤාණයි** ධර්ම දේශනය සඳහා මාතෘකා කරන්න යෙදුනේ.

සම්මා සම්බුදු රජාණන් වහන්සේ ඇඳින ගැනීමට ඇති එකම පිළිවෙතයි බුද්ධ ඤාණයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම. පටිසම්භිදාමග්ග පාලියෙහි ඤාණකථාවෙහි සර්වඥතා ඤාණය විවරණය කරන තැන මෙම සූත්‍ර පාඨය මෙසේ දකින්න ලැබෙනවා.

මෙම පටිසම්භිදා මග්ගපාළිය ඉතාමත් ගම්භීර ධර්මයන් රාශියක් ඇතුළත් ග්‍රන්ථයක්. ශාරීපුත්‍ර මහරහතන් වහන්සේ මෙම ධර්ම විවරණය ප්‍රකාශ කරලා තිබෙන්නේ, ලොවුතුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ බුදුබවට පත් වෙලා සත්සතියක් ගෙවල, අටවන සතියේ දී ධර්ම ගම්භීරත්වය සම්මර්ශනය කළා. තමන් වහන්සේ අධිගත කළාවූ ගම්භීර ධර්මය සම්මර්ශනය කරද්දී මන්දෝත්සාහී භාවයක් ද පැමිණ සිටියා. මේ ලෝක සත්වයා අවිද්‍යා අන්ධකාරයෙන් ගැවසී ගෙන, වැළඳ ගෙන, රාග, දෝස, මෝහ ආදි කෙලෙස් අඳුරින් අඳුරට පත් වී සිටින මොවුන්ට ධර්ම දේශනා කිරීම මට වෙහෙසක්, නිෂ්ඵල ක්‍රියාවක් නේද? කියල උන්වහන්සේ ලෝකය දෙස නොබලා ම ධර්ම ගම්භීරත්වය ගැන සැලකුවා.

සහම්පතී මහා බ්‍රහ්මයා ක්ෂණයකින් පැමිණ ආරාධනා කළා, ස්වාමීනි, ප්‍රඥා නමැති ප්‍රාසාදයක, මස්තකයට නැංගා වූ, භාග්‍යවතුන් වහන්ස, බුදු ඇසින් ලෝකය දෙස බලා වදාරණ සේක්වා, මේ ලෝකධාතුවෙහි මඟඵල නිවන් පසක් කර ගන්නට හේතු සම්පත් ඇත්තවුන් සිටිනවා. අනුකම්පාවෙන් ඔවුන් දෙස බලා ධර්ම දේශනා කරන සේක්වා කියා ආරාධනා කළා.

ඒ අවස්ථාවේ තමයි සර්වඥයන් වහන්සේ බෝධි මූලයේ දී අර්හත් මාර්ග ඤාණය ප්‍රතිලාභ කරන කොටම, තමන් වහන්සේගේ සන්තානයේ පහළ වූ බුද්ධ චක්ඛු කියන මේ ඉන්ද්‍රිය පරෝපරිය ඤාණය, ආසය අනුසය ඤාණය යන ඤාණ දෙකෙන් ලෝකධාතුව බලා වදාළේ. නෙලුම් පොකුණක, මානෙල් පොකුණක නෙලුම් කැකුළු, මානෙල් කැකුළු අවස්ථා හතරකින් තිබෙන ආකාරය උන්වහන්සේට අරමුණු වුණා. නෙලුම් මානෙල් විල්වල, මඩයට, දිය යට හටගෙන තිබෙන නෙලුම් මානෙල් කැකුළු සමහර ඒවා වතුරෙන් උඩට මතුවෙල, හිරුරැස් වැටෙන විටම පිපෙන්න සූදානමෙන් තිබෙනවා.

ඇතැම් නෙලුම් මානෙල් කැකුළු දිය මට්ටමට පවතිනවා. ඒවා දවසකින්, දෙකකින් නමුත් පිපෙන්ට පුළුවන්. තවත් සමහර ඒවා

දියේ යට තිබෙනවා. දින ගණනාවකින් හරි ඒවා පිපෙනවා. තවත් සමහර නෙලුම් මානෙල් කැකුළු තිබෙනවා විල් පතුලේම. ඒවා කවර කලෙක, කවර දිනෙක පිපෙයි ද කියා කියන්නට බැහැ.

ඒ වගේම මේ ලෝකධාතුවෙහි සත්වයන් කොට්ඨාස හතරකට උන්වහන්සේ දැක වදාළා.

**1. උග්ඝටිතඥ** **2. විපච්තඥ**

**3. ඤෙයය** **4. පදපරම.**

මේ තමා එම පුද්ගල කොට්ඨාස හතර.

- **උද්ඝටිතඥ කියන්නෙ** ධර්ම දේශනාවක් සඳහා ධර්ම පාඨයක්, ධර්ම ගාථාවක් මාතෘකා කළ පමණින් ඒ මාතෘකාව තුළින් එය දරාගෙන, නුවණින් කරුණු වටහා ගෙන, ඒ මොහොතේ ම මාර්ගඵල නිවන අවබෝධ කර ගන්නන්ට කියනවා උද්ඝටිතඥ පුද්ගලයෝ කියලා. ශාරීපුත්ත, මහ මුගලන්, දාරුචිරිය මහරහතන් වහන්සේලා වැනි උත්තමයෝ එම උද්ඝටිතඥ පුද්ගල සංඛ්‍යාවට ගැනෙනවා.
- තවත් සමහර අය ඉන්නවා ධර්ම මාතෘකාවක් කරලා එය විස්තරාත්මකව දේශනා කරද්දී මගඵල, නිවන්සුව අවබෝධ වෙනවා. ඒ උතුමන්ට කියන්නේ, "විපඤ්චිතඥ පුද්ගලයෝ" කියලා.
- තවත් සමහර කෙනෙක් ඉන්නවා ධර්මය ශ්‍රවණය කරලා එ තුළින් මාර්ගඵල නොලබා, සීලයක පිහිටා කෙලෙසුන් තුනී කරමින්, සල්ලේඛ ප්‍රතිපත්ති අනුගමනය කරමින්, සමථ විපස්සනා භාවනා වඩමින්, ඒ ජීවිතේ කවදාහරි මගඵල නිවන් ලබනවා. ඒ අයට කියනවා "ඤෙයය පුද්ගලයෝ" කියලා.
- තවත් සමහර අය ඉන්නවා, කොපමණ බණ ඇසුවත්, කොපමණ සිල් රැක්කත්, කොපමණ භාවනා කළත්, මගඵල නිවන් නොලබන අය. එවැනි අයට කියන්නේ "පදපරම පුද්ගලයෝ" කියලයි.

මෙම කොටස් හතරට අනුව කොටස් තුනක් ම මඟඵල නිවන් සුව ලබන්නට සුදුස්සන් බව දැනගත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සහම්පතී මහා බ්‍රහ්මයා හට ප්‍රතිඥා දුන්නා. ධර්ම ගම්භීරත්වය නිසා මම මන්දෝත්සාහී බවට පත්වූ නමුත්, මම දැන් ලෝකය දෙස නුවණින් විමසා බැලුවා. මඟඵල නිවන් ලබන්න සුදුස්සන් ලොව සිටිනවා. එනිසා තථාගතයන් වහන්සේ අමෘතද්වාරය දැන් විවෘත කරනවා. නුවණ ඇත්තෝ දෙසවන් ඇත්තෝ ඒ ධර්මය ශ්‍රවණය කරල, ලොවී ලොවුතුරා සම්පත් සාදාගනිත්වා යි උන්වහන්සේ ප්‍රතිඥා දුන්නා.

මෙන්න මේ දවසෙදි උන්වහන්සේ විහිදුවන ලද්දා වූ උතුම් ඤාණ ධාතු අතුරින් ඉන්ද්‍රිය පරෝපරිය ඤාණය, ආසය අනුසය ඤාණය යන දෙකටයි බුදු ඇස කියන්නේ. මෙම බුදුඇස සෑම දවසේ ම අලුයම් කාලයේත්, සවස් කාලයේත් දෙවාරයක් ම ලෝකධාතුව වෙත විහිදුවනවා. භාග්‍යවතුන් වහන්සේගේ දිනචරියාවෙ තිබෙනව පංචවිධ බුද්ධ කෘත්‍ය කියල දින චරියාවක්. එයින් රාත්‍රි කාලය කොටස් තුනකට බෙදෙනවා. **පූර්වයාමය, මධ්‍යම යාමය, පශ්චිම යාමය** කියල.

එම පශ්චිම යාමය ද කොටස් තුනකට බෙදා ගන්නවා. පශ්චිම යාමය පුරාණ සිංහල පැය දහයයි. ඔර්ලෝසු පැය හතරෙන් පැයකුත් විනාඩි විස්සක් සක්මන් භාවනාවේ යෙදෙනවා. ඒ කියන්නේ රාත්‍රි 2 සිට රාත්‍රි 3.20 දක්වා. 3.20 සිට 4.40 දක්වා පැයකුත් විනාඩි විස්සක් දකුණු ඇලයෙන් සිංහ සෙයයාවෙන් සතෝ සම්පජානකාරීව සැතපී වදාරනවා.

4.40 සිට පසුදා හිරු උදාවන තුරු දොළොස් කෝටි ලක්ෂ වාරයක් මහාකරුණා සමාපත්තියට සමවදිනවා. මහාකරුණා සමාපත්තියෙන් නැඟී ඉන්ද්‍රිය පරෝපරිය ඤාණයෙන් සහ ආසය අනුසයේ ඤාණයෙන් කියන බුදු ඇසින් දසදහසක් ලොව බලා වදාරනවා. මෙසේ ලෝකධාතුව විමසීමේ දී මඟඵල නිවන් ලබන්න සුදුස්සන්, දහම් දෙසීමට සුදුස්සන්, ඒ බුදුඇසට මැවී පෙනෙනවා. උදේ වරුවේ මෙසේ බුදුඇස විහිදුවලා ඒ දවසේ

කළයුතු වැඩ කටයුතු සනිටුහන් කර ගන්නවා. සවස් වරුවෙත් හිරු බැස යන්නට පෙර එලෙසින් ම දොළොස් කෝටි ලක්ෂ වාරයක් මහාකරුණා සමාපත්තියට සමවැදී නැවත බුදුඇසින් ලෝක ධාතුව බලා වදාරනවා. මෙන්න මේ **බුදුඇස කියන්නේ** මාර්ගඵල නිවන්සුව ලබන්න සුදුසු වේනෙය්‍ය ජනයන්, විනේය ජනයන් තෝරා ගන්නා වූ ඥාණ දෙකටයි බුදුඇස කියල කියන්නේ.

එයින් මෙතැන සඳහන් කරන්න අපි බලාපොරොත්තු වන්නේ දෙවන ඥාණය වන ආසය අනුසය ඥාණය පිළිබඳ දහම් කථාවයි. විශේෂයෙන් ම ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාණය, ආසයානුසයේ ඥාණ දෙක එකට සම්බන්ධයි. ඉන්ද්‍රිය පරෝපරිය ඥාණය, ආසය අනුසයේ ඥාණය, යමක ප්‍රාතිහාර්ය ඥාණය, මහාකරුණා සමාපත්ති ඥාණය, සර්වඥතා ඥාණය සහ අනාවරණ ඥාණය කියන මෙම ඥාණ ධාතු හයයි ෂට් අසාධාරණ ඥාණ නමින් හඳුන්වනු ලබන්නේ.

එයට මුලින්ම කියවුණා දුක්ඛෙ ඥාණය, දුක්ඛ සමුදයේ ඥාණය, දුක්ඛ නිරෝධේ ඥාණය, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ඥාණය කියන ආර්ය සත්‍ය ඥාණ හතරත්, අර්ථ ප්‍රතිසම්භිදා ඥාණය, ධර්ම ප්‍රතිසම්භිදා ඥාණය, නිරුක්ති ප්‍රතිසම්භිදා ඥාණය, ප්‍රතිභාන ප්‍රතිසම්භිදා ඥාණය යන ඥාණ හතරත්, ශ්‍රාවකයන් වහන්සේලාට ලැබෙනවා. එමනිසා මෙම ඥාණ අටට කියනවා ශ්‍රාවක සාධාරණ ඥාණ අට කියලා. එසේ නමුත් ශ්‍රාවකයන් වහන්සේලාට ලැබෙන ඥාණ ප්‍රමාණයට වඩා අසාමාන්‍ය ගුණයකින් සම්මා සම්බුදු රජාණන් වහන්සේට පිහිටනවා, මෙම ඥාණ.

සාමාන්‍යයෙන් රහතන්වහන්සේ නමකට හෝ පසේ බුදුරජාණන් වහන්සේ නමකට හෝ ලැබෙන මේ ආර්ය සත්‍ය ඥාණ හතරත්, ප්‍රතිසම්භිදා ඥාණ හතරටත් වඩා භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ආර්ය සත්‍ය හා ප්‍රතිසම්භිදා ඥාණ අතර, අහසට පොළොව මෙන් අසාමාන්‍ය තත්වයෙන් පවතිනවා.

සමීප කරන්න හැකියාවක් නැහැ. ඒක නිසා ඒ ඤාණධාතු අට ශ්‍රාවකයන් වහන්සේලාට සාධාරණ වුවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ සමඟ සන්සන්දනය කර ගැනීමේ දී අසාධාරණ මට්ටමක් තිබෙනවා.

එයින් මේ ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණ ආදි මේ ඤාණ හය කිසිම ශ්‍රාවකයන් වහන්සේ නමකට හෝ පසේ බුදුරජාණන් වහන්සේ නමකට හෝ නොලැබෙන්නා වූ, සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂ ගණන් සොළසා සංඛෙය්‍ය කල්ප ලක්ෂ ගණන් පාරමී පුරා සවාසනා සකල ක්ලේශයන් සෝදාහැර ලොව්තුරා බුදුවන සම්මා සම්බුදු රජාණන් වහන්සේලාට පමණක් ම ලැබෙන විශිෂ්ඨ ඤාණ ධාතු හයක් වෙනවා. එයින් මෙතැන අපි සඳහන් කරන්නේ " ආසය අනුසයේ ඤාණය" පිළිබඳව දහම් කරුණු ටිකක්.

දම් සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේ තරම් බුදුගුණ කථනය කළ ශ්‍රාවකයන් වහන්සේ නමක් වෙන ඇත්තේ නැහැ. වෙනත් ශ්‍රාවකයන් වහන්සේලාට වඩා සිය ගුණයෙන් දහස් ගුණයෙන් ශාරීපුත්‍ර මහ රහතන් වහන්සේ ප්‍රඥාවෙන් අග්‍රයි. එනිසා උන්වහන්සේ බොහෝ සෙයින් බුදුගුණ සජ්ඣායනා කරලා තියෙනවා. බුදුගුණ දේශනා කරල තියෙනවා.

පටිසම්භිදා මග්ග පාළිය, එසේම මහානිද්දේස පාළිය, චුල්ල නිද්දේස පාළිය, දීඝනිකායේ සම්පසාදනීය සූත්‍රය වැනි දේශනා තුළින් ශාරීපුත්ත මහරහතන් වහන්සේගේ බුද්ධ ගුණ පිළිබඳ තිබෙන අවබෝධය තේරුම් ගන්න හැකිවෙනවා.

මෙම තෙසැත්තෑ ඤාණ විවරණයේ දී උන්වහන්සේ මොන තරම් ආශ්චර්ය ලෙස මේ දේශනා පන්තිය පවත්වනු ලැබුවා ද කියන එක. පටිසම්භිදා මග්ග පාළියේ ආසයානුසයේ ඤාණය විවරණය කරමින් මෙවැනි දේශනා පෙළක් පවත්වා තිබෙනවා.

**කතමං තථාගතස්ස සත්තානං ආසයානුසයේ ඤාණං**

තථාගතයන් වහන්සේගේ සන්තානයේ පිහිටි සත්වයන් පිළිබඳ ආසයානුසයේ ඤාණය නම් කුමක් ද? මේ **කථේතු**

**කම්‍යතා පුච්ඡාම** ඉදිරිපත් කරල, තමන් වහන්සේ ම විස්තර කරනු කැමැත්තෙන් ප්‍රශ්න කරලා ඉන්පසුව පැහැදිලි කරලා එය දේශනා කොට වදාළා.

**ඉධ තථාගතෝ සත්තානං**
**ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං**
**ජානාති, අධිමුත්තිං ජානාති, භබ්බාභබ්බේ**
**සත්තේ පජානාති.**

මේ ආසයානුසයේ ඤාණයට මාතෘකාවයි. තථාගතයන් වහන්සේ ලෝක සත්වයාගේ ආසය දන්නවා. අනුසය දන්නවා. චරිතය දන්නවා. අධිමුත්තිය දන්නවා. භව්‍ය අභව්‍ය සත්වයන් දන්නවා. මෙම කොටස් හය උන්වහන්සේ විශේෂ ඤාණයෙන් දන්නවා. ඒ දන්නා වූ ඤාණය යි ආසය අනුසයේ ඤාණය කියා හඳුන්වනු ලබන්නේ.

මෙහිදී ආසය, අනුසය කියන වචන දෙකට චරිත අධිමුත්ති දෙකත්, භව්‍ය අභව්‍ය දෙකත් ඇතුළත් වෙනවා. එනිසා තමයි ආසයානුසයේ ඤාණය කියල මේ කෙටි වචනයෙන් හඳුන්වන්නේ. එසේ නැත්නම් චරිත, අධිමුත්ති, භව්‍ය, අභව්‍ය කියන කොටස් හතරත්, මේ වචන දෙකෙන් කියයුතු වෙනවා.

ශාරීපුත්ත මහ රහතන් වහන්සේ, ඊළඟට පැහැදිලි කරල තියෙන්නේ

**'සස්සතෝ ලෝකෝ ති වා, 'අසස්සතෝ ලෝකෝ' ති වා**
**'අන්තවා ලෝකෝ' ති වා, 'අනන්තවා ලෝකෝ' ති වා**
**තං ජීවං තං සරීරන්තිවා, අඤ්ඤං ජීවං අඤ්ඤං**
**සරීරන්තිවා, හෝති තථාගතෝ පරම්මරණාති වා න හෝති තථාගතෝ**
**පරම්මරණා' ති වා, හෝති ච න හෝති ච**
**තථාගතෝ පරම්මරණා' ති වා.**
**ඉති භවදිට්ඨිසන්නිස්සිතා වා සත්තා හොන්ති විභව දිට්ඨි සන්නිස්සි**
**තා වා.**

කියල මෙහෙම කොටසක් පහදල දුන්නා. ඒ කියන්නේ සත්වයන්ගේ ආසය පිළිබඳ විවරණය යි. පළමුවෙන් තේරුම්

කරගන්න ඕනෑ "ආසය" කියන්නේ කුමක් ද කියලා.

අපි හොඳට අහල පළපුරුදු වචන තියෙනවා නේ ද? ජලාශය, ගුහාසය, බිලාසය, අධ්‍යාසය, ඔය වගේ වචන තියෙනවා නේ. මේ ආසය කියන්නේ කුමක් ද? රැස්වෙන තැන, තැන්පත් වෙන තැන, නවතින තැන, ධර්මයට අනුව කියනවා නම් පරිභාවිත බව. ඒ කියන්නේ සිතේ පළපුරුද්ද. සිතේ පළපුරුද්දෙන් පිහිටාගෙන සිටින ස්ථානයට කියනවා "ආසය" කියලා.

යම්කිසි දෙයක් රැස්වෙලා තියෙනවා නම් එතැනටත් කියනවා ආසය කියලා. ජලාශය කියන්නේ ජලය රැස්වෙන ස්ථානය. ගුහාසය කියන්නේ යම්කිසි ගුහාවක් ආශ්‍රය කරන ගුහාවක් ඇති තැන. එහි වාසය කරන පුද්ගලයාට කියනවා ගුහාසයා කියලා. බිලාශය කියන්නෙත් එහෙමයි. යම්කිසි කෙනෙක් වාසස්ථානයක් හැටියට භාවිත කරනවා නම් ඒ ස්ථානයට කියනවා ආසය කියලා.

මෙතැන දී සත්තානං කියන්නේ, රූප, වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ කියන මේ ස්කන්ධ පහේ දැඩි සේ ඇලී ගත් පුද්ගලයන්ට තමයි "සත්තා" කියල හඳුන්වන්නේ.

**රූපේ බෝ රාධ යෝ ඡන්දෝ යෝ රාගෝ යා තණ්හා,**
**යා නන්දි තත්‍ර සත්තෝ තත්‍ර විසත්තෝ**
**තස්මා සත්තෝති වුච්චති**

මේ රාධ සූත්‍රයේ එන පාඨයක්, රාධය, මේ ලෝක සත්වයන්ගේ සන්තාන රූපස්කන්ධ පිළිබඳව ඡන්දයෙන්, රාගයෙන්, අතෘප්ති, තෘෂ්ණාවෙන්, ඇලීගෙන අතිශයින් ඇලීගෙන, එම රූපස්කන්ධය පිළිබඳව රාගයෙන්, ඡන්දයෙන්, තණ්හාවෙන්, නන්දියෙන්, දැඩි සේ ඇලීගත්ත අයට කියනවා, සත්වයෝ සත්වයෝ කියලා.

**වේදනා ගැන, තණ්හාව ගැන, සංස්කාර** ගැන, විඤ්ඤාණ ගැන යම් ඡන්දයක් වෙයි නම්, යම් රාගයක් වෙයි නම්, යම් තෘෂ්ණාවක් වෙයි නම්, යම් සප්‍රීතික තෘෂ්ණාවක් වෙයි නම්, එයින් ඇලීගත්තා වූ, එයින් බැඳී ගත්තා වූ පුද්ගලයන්ට කියනවා සත්වයෝ සත්වයෝ කියලා. එතකොට මේක පොදු

වචනයක්. මේක අන්වර්ථ වචනයක්. ලෝක සත්වයාට සත්වයෝ කියන්නේ ස්කන්ධ පහේ ඇලීගත්ත නිසයි. මේ ස්කන්ධ පහේ ඇලී නොගත්තේ කවුද? ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා. රහතන් වහන්සේලා ඒ සත්ව සම්මුතීන් ඉක්මවා ගියා.

උන්වහන්සේලා ස්කන්ධ ගැන කිසිම ඇලීමක්, බැඳීමක්, රාගයක්, ඡන්දයක්, තණ්හාවක්, නන්දියක් නැහැ. එසේ නමුත් උන්වහන්සේලා එතෙක් සත්ව කියන සංඥාවෙන් භාවිත වුණා. එතකොට මෙන්න මේ සත්වයන් පිළිබඳව යම්කිසි ආසයක් තිබෙනවා. පරිභාවිත ස්වභාවයක් තිබෙනවා. වාසය කරන ස්ථානයක් තිබෙනවා. හිත පවත්නා තැනක් තිබෙනවා. ඒ විදිහේ පවත්නා ස්ථාන සම්පිණ්ඩනය කොට ගත්තාම හතරක් තිබෙනවා.

**සස්සතුච්ඡේදදිට්ඨිච, ඛන්තිච්චානුලෝමිකා යථාභූතං ච යං ඤාණං ඒතං ආසය සද්දිතං.**

මෙන්න ආසය පිළිබඳ සම්පිණ්ඩනයක්. ආසය කියන කොටස ශාස්වත දෘෂ්ටිය නමැති ආසය, උච්ඡේද දෘෂ්ටි නමැති ආසය යථාභූත ඥාණය නමැති ආසය, අනුලෝම ශාන්තිය කියන ආසය සියල්ලම හතරයි. මෙම සූත්‍ර පාඨයේ එය තවදුරටත් විවරණය වෙනවා. සස්සතෝ ලෝකෝ ති වා, අසස්සතෝ ලෝකෝ ති වා, මෙන්න ආසය දෙකක්. සස්සතෝ ලෝකෝ කියන්නේ හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සියල්ලට කියනවා ලෝකය කියලා.

**පච්චයේහි සංකරියති ලුජ්ජති පලුජ්ජතීති ලෝකෝ,**

හේතු ප්‍රත්‍යයෙන් සකස් කරනු ලබන්නා වූ, කැඩෙන්නා වූ, බිඳෙන්නා වූ, නැසෙන්නා වූ, වැනසෙන්නා වූ සියල්ලට කියනවා "ලෝකය" කියලා.

මේ විදියට ලෝකය කියල කිව්වාම පණ ඇති, නැති සියල්ලම ලෝකය අවීචියේ පටන් භවාග්‍රය දක්වා තියෙන සියලුම හිත ඇති, හිත නැති, සංස්කාර ලෝකය නම් වෙනවා. එතකොට මෙතැන ලෝකය නමින් හඳුන්වන්නේ, ඒ විදියේ සංස්කාර

ලෝකය යි. සස්සතෝ ලෝකෝ, කිච්චාම මෙන්න මේ ලෝක තත්වය සදාකාලිකයි කියල යම් පිළිගැනීමක් තිබෙනවා, ඇතැම් විට එක ආත්මභාවයකින් රූප කය නවත්තල, නාම කය ගමන් කරනවා. නාම කය භවයෙන් භවයට නොනැසී පවතිනවා කියන මේ හැඟීමට, මේ දෘෂ්ටියට කියනවා "සාස්වත දෘෂ්ටිය" කියලා. එතකොට මේ ලෝක සත්වයා සදාකාලිකයි කියලා ගැනීම එක ආසයක්. ඒ සිත ගොස් තැන්පත් වෙන තැනක්. කොපමණ මේ ලෝකය පුරාම සිත හැසුරුවත් අන්තිමේදී ගොස් තැන්පත් වෙන්නේ ලෝකය සදාකාලිකයි කියන දෘෂ්ටියේ. මේක එක ආසයක්.

**"අසස්සතෝ ලෝකෝ'ති වා"** මේ තවත් ආසයක්. ඒ කියන්නෙ මේ ලෝක සත්වයා මේ ජීවිතයෙන් එහාට යන්නේ නැහැ. මේ ආත්මභාවය, මේ සත්ව පුද්ගල සන්තාන මින් එහාට යන්නේ නැහැ. මේ ආත්මභාවයේ දී යම් මරණයක් වෙයි නම්, යම් උපච්ඡේදයක් වෙයි නම්, එයින් පසු නැවත ඉපදීමක් නැහැ. උපච්ඡේදයට පත් වෙනවා.

මෙන්න මේ දෘෂ්ටියට කියනවා උච්ඡේද දෘෂ්ටිය කියල. අසාස්වත දෘෂ්ටිය, මෙහි ඇලී ගත්තා වූ පුද්ගලයා හැමදාම කොපමණ දේවල් අරමුණු කළත්, කොච්චර දේවල් කථා කළත්, අන්තිමේ දී ගිහින් නවතින්නේ මරණින් මතු ඉපදීමක් නැහැ කියන දෘෂ්ටිය තුළයි. ඒක නිසා ඒකට කියනවා උච්ඡේද දෘෂ්ටිය, ආසය කියලා. **"අන්තවා ලෝකෝ'ති වා අනන්තවා ලෝකෝ'ති වා"** ඒ කියන්නේ ධ්‍යානලාභීන් සම්බන්ධ කථාවක්. සමහර ධ්‍යාන ලාභීන් ඉන්නවා ඉතාම කුඩා කසිණ මණ්ඩලයක ධ්‍යාන උපදවාගෙන, ඒක ස්වල්ප ප්‍රමාණයක් කසිණ මණ්ඩලය විහිදුවනවා. නැතිනම් පටිභාග නිමිත්ත පැතිරීගෙන තිබෙන ප්‍රමාණය තුළ තමන්ගෙ සිත අරමුණු කරනවා. ඒ තමාගේ සිත එතකොට අන්තවත්, ඒ කියන්නේ කෙළවරක් සහිතයි. ඉන් එහාට නැහැ. ඒක නිසා "අන්තවා ලෝකෝති" මේ ආත්මභාවය සීමිත ප්‍රමාණයකට පමණයි පවතින්නේ කියලා පිළිගන්නවා. මෙයට කියනවා

ශාස්වත දෘෂ්ටිය නිමිති කොට ගෙන ඇති ආසයක්.

**අනන්තවා ලෝකෝ'ති වා** කියන්නේ තවත් සමහර ධ්‍යානලාභීන් විශාල ලෙසින් පටිභාග නිමිත්ත වඩනවා. මේ ලෝකධාතුව පුරාම නැත්නම් මේ සක්වල පුරාම පටිභාග නිමිත්ත විහිදුවනවා. පතුරුවනවා. ඒ තාක් විහිදී තිබෙන්නා වූ එම චිත්ත සන්තානය ආත්මයක් කොට ගෙන මේ ආත්මය අනන්තයි කියා පිළිග න්නවා. මෙයත් ශාස්වත දෘෂ්ටියේ ම කොටසක් මේකත් එක්තරා ආසයක්.

**තං ජීවං තං සරීරන්ති වා**

ඒ කියන්නේ ජීවයත්, ශරීරයත් එකත් කියලා ගන්නවා.

**අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා**

ජීවය අනිකක්, ශරීරය අනිකක්, වශයෙන් ගන්නවා.

**හෝති තථාගතෝ පරම්මරණාති' වා**

මරණින් මතු මේ ආත්මභාවය නැවත උපදින්නේ නෑ කියලා උච්ඡේද දෘෂ්ටිය ගන්නවා.

**හෝති ච න හෝතී ච, තථාගතෝ පරම්මරණා'ති වා**

මේ ආත්මභාවය මරණින් මතු කොටසක් උපදිනවා. කොටසක් උපදින්නේ නැහැ කියලා අමරා වික්ඛේප වශයෙන් ගන්නවා.

**නේ ව හෝති න න හෝති තථාගතෝ පරම්මරණා'ති වා**

මේ ආත්මභාවය මරණින් මතු උපදින්නේ නැහැ, උපදින්නේ නැත්තෙත් නැහැ කියල අමරාවික්ඛේප වශයෙන් ද ගන්නවා. මේ දසවස්තුක මිථ්‍යාදෘෂ්ටිය අනුව අර අන්ත දෙකටයි වැටෙන්නේ.

"ශාස්වත අන්තය, උච්ඡේද අන්තය" එතකොට මේ සත්වයා මාර්ගඵල නිර්වාණය අවබෝධ නොකර ගන්නා තුරු, පෘථුග්ජන සන්තාන ඇතිතාක්ම මෙන්න මේ අන්ත දෙකටයි වැටෙන්නේ. මේ අන්ත දෙකට වැටෙන නිසා මේකට කියනවා ශාස්වත අන්තය, උච්ඡේද අන්තය. මේක ආසය දෙකක්.

භවයක් පාසාම ඒ පුද්ගලයාට ඒ ආසය තමයි පිහිටන්නේ. එනිසා සන්තානයේ පරිභාවිත ස්වභාවය, පුරුදු වූ ස්වභාවය නිසා මේකට ආසය කියනවා.

**ඒතේ වා පන උභෝ අන්තේ අනුපගම්ම අනුලෝමිකා ඛන්ති පටිලද්ධා හෝති යථාභූතං වා ඤාණං.**

තව සමහර කෙනෙක් මේ ශාස්වත අන්තයට හෝ උච්ඡේද අන්තයට නොවැටී, අනුලෝම ක්ෂාන්තිය ලබනවා. අනුලෝම ක්ෂාන්තිය කියන්නේ විදර්ශනා ඥාණ පෙළේ සංඛාරුපෙක්ඛා ඥාණය දක්වාම වැඩිය යුතු ඥාණ පරම්පරාවයි, එය,

1. මෘදු අනුලෝම ක්ෂාන්තිය
2. මධ්‍යම අනුලෝම ක්ෂාන්තිය
3. තීක්ෂණ අනුලෝම ක්ෂාන්තිය කියා අවස්ථා තුනකට බෙදෙනවා. එ කියන්නේ, කංඛාවිතරණ විශුද්ධි අවස්ථාවට කියනව මෘදු අනුලෝම ක්ෂාන්තිය කියල. එතැනදී උදයව්‍ය ඥාණය ද ගැනෙනව.

භංගානුපස්සනා ඥාණ අවස්ථාවට කියනවා මධ්‍යම අනුලෝම ක්ෂාන්ති අවස්ථාව කියලා. සංඛාරුපෙක්ඛා ඥාණ අවස්ථාවට කියනව, තීක්ෂණ අනුලෝම ක්ෂාන්තිය කියලා. මේ අනුලෝම ක්ෂාන්තිය යම් කෙනෙක් ලබා ගත්තා නම්, විදර්ශනා ඥාණ වශයෙන්, මේ ජීවිතයේ දී මඟඵල නිවන් නොලැබුවත්, මතු ජීවිතයක ගොස් උපන්නත්, එතැන දී හිත වැඩ කරන්නේ ඒ අවබෝධය උඩයි.

යථාභූත ඥාණය නමින් විදර්ශනා ඥාණවලදීත් කියනව. මෙතැන දී යථාභූත ඥාණය නමින් හඳුන්වන්නේ මාර්ගඥාණය යි.

සෝවාන්, සකෘදාගාමි, අනාගාමී, අර්හත් කියන මාර්ගඥාණ හතරට කියනවා ආසය කියල. යම් කෙනෙක් සෝවාන් මාර්ග ඥාණ ලබාගත්තා නම්, ඒ ආර්යයන් වහන්සේ මතු ජාතියක උපන්නත්, එතුමාගේ හිත පවතින්නේ සෝවාන් මාර්ගඥාණය

ලබා ගත්ත අවබෝධය තුළයි. ඒක වෙනස් වෙන්නේ නැහැ. තමන් දන්නේ නැහැ. තමන් සෝවාන් කෙනෙක් කියලා. එසේ නමුත් භවාන්තරයේ දී පවා සෝවාන් ආර්ය කෙනෙකුගේ අවබෝධයට අනුරූප අවබෝධයක් ඇතිව ජීවත් වෙනවා. එතුමාගේ හිත පවතින්නේ ඒ මාර්ගඵල සම්බන්ධ පිහිටීම මතයි. මෙන්න මෙයට කියනවා යථාභූත ඥාණ ආසය කියලා.

**කාමං සේවන්තඤ්ඤේව ජානාති 'අයං පුග්ගලෝ**
**කාමගරුකෝ කාමාසයෝ කාමාධිමුත්තෝ'ති,**
**කාමං සේවන්තඤ්ඤේව ජනාති අයං පුග්ගලෝ**
**නෙක්ඛම්ම ගරුකෝ නෙක්ඛම්මාසයෝ**
**නෙක්ඛම්මාධිමුත්තෝ ති.**

මේ බුදුරජාණන් වහන්සේ පුද්ගලයන් ආසය අනුසයේ ඥාණයෙන් දකින ආකාරය යි.

ගිහි ජීවිතයක් ගත කරන කෙනෙක් කම්සැප විඳින කෙනෙක් දැකල උන්වහන්සේ දැනගන්නව, මේ පුද්ගලයා නම් ස්වභාවයෙන් ම, පස්කම් සැපය ගරු කරන්නෙක්. පස්කම් සැපයම තමාගේ සැපයක් යැයි ආසය වශයෙන් පිහිටා සිටින්නෙක්. කම් සැපය පිළිබඳ අදහස් ඇත්තෙක් කියල උන්වහන්සේ තෝරාගන්නව, දැක ගන්නව, හඳුනාගන්නවා.

**කාමං සේවන්තඤ්ඤේව ජානාති අයං පුග්ගලෝ**
**නෙක්ඛම්ම ගරුකෝ, නෙක්ඛම්මාසයෝ, නෙක්ඛම්මාධිමුත්තෝ ති.**

ගිහි ජීවිතයක් ගත කරන, ඉන්ද්‍රියයන් පිනවන ජීවිතයක් ගත කරන, පස්කම් සුව විඳින කෙනෙක් දැකල, උන්වහන්සේ නුවණින් දැන ගන්නවා. මේ පුද්ගලයා මෙහෙම ජීවිතයක් ගත කළත්, කම්සුව විඳිමින් සිටියත්, මොහුගේ සිතේ තිබෙන ගරුත්වය නම්, නෙක්ඛම්ම ගරුත්වය යි. නෙක්ඛම්ම ආසය යි. නෙක්ඛම්ම අදහස් මොහුගේ සිතේ තිබෙන්නේ, මොහු කවදාහරි නෙක්ඛම්ම ප්‍රතිපදාවෙන් දුක් කෙළවර කොට, නිවන්සුව ලබනවා කියල. ආසය අනුසය ඥාණයෙන් දැකගන්නවා.

**ව්‍යාපාද සේවන්තඤ්ඤේව ජානාති අයං**
**පුග්ගලෝ ව්‍යාපාද ගරුකෝ, ව්‍යාපාදාසයෝ, ව්‍යපාදාධිමුත්තෝ.**

බොහෝ සෙයින්ම කේන්ති බහුල, තරහ බහුල, පුද්ගලයෙක් දැකල, උන්වහන්සේ දැන ගන්නව මොහුගේ සිත සැමදාමත්, ව්‍යාපාදය ගරු කොට ඇත්තෙක්, ව්‍යාපාද ආසය ඇති පුද්ගලයෙක්. ව්‍යාපාද අදහස් ඇති පුද්ගලයෙක්. තවත් කෙනෙක් දැක ගන්නව, ව්‍යාපාදය බහුලව සිටියත්, ඔහුගේ සිත අව්‍යාපාදය කියන මෛත්‍රිය ගරු කරන්නෙක්. ඔහුගේ සිතේ වැඩ කරන්නේ මෛත්‍රිය සිත ආසය කොට ගෙනයි. ඔහුගේ සිත මෛත්‍රී අදහස් ඇති කෙනෙක් කියලා. ආසයානුසයේ ඤාණයෙන් දැකග න්නවා.

**ථීනමිද්ධං සේවන්තඤ්ඤේව ජානාති අයං**
**පුග්ගලෝ ආලෝකසඤ්ඤාගරුකෝ,**
**ආලෝකසඤ්ඤාසයෝ, ආලෝකසඤ්ඤාධිමුත්තෝ' ති.**

ථීනමිද්ධ ස්වභාවය ඇති පුද්ගලයෙකු දැකල නුවණින් දැන ගන්නව, මොහු ථීනමිද්ධයම ගරු කරන්නෙක්. ථීනමිද්ධය ආසය කොට ඇත්තෙක්. ථීනමිද්ධයම අදහස් කොට ඇත්තෙක්.
තවත් ථීනමිද්ධයේම ඉන්න පුද්ගලයෙකු දැකල, නුවණින් දැන ගන්නව, මොහු ථීනමිද්ධ ගරුක කෙනෙක් නොවෙයි, ආලෝක සඤ්ඤා ගරුක කෙනෙක්. ආලෝක සඤ්ඤා අදහස් ඇති කෙනෙක්. ආලෝක සඤ්ඤා ආසය ඇති කෙනෙක් කියල. උන්වහන්සේ තේරුම් කරගන්නවා.

**නෙක්ඛම්මං සේවන්තඤ්ඤේව ජානාති අයං පුග්ගලෝ,**
**නෙක්ඛම්මගරුකෝ, නෙක්ඛම්මාසයෝ, නෙක්ඛම්මාධිමුත්තෝ.**

සසුන්ගතව පැවිදිව සිටින හෝ ගිහිව නෙක්ඛම්ම පිළිවෙත් පුරන කෙනෙක් දැකල උන්වහන්සේ දැනගන්නවා, මොහු සැබෑම නෙක්ඛම්ම ගරු කරන්නෙක්, නෙක්ඛම්ම අදහස් ඇති කෙනෙක්, නෙක්ඛම්ම ආසය ඇත්තෙක්.

**නෙක්ඛම්මං සේවන්තඤ්ඤේව ජානාති අයං පුග්ගලෝ,**
**කාමගරුකෝ, කාමාසයෝ කාමාධිමුත්තෝ.**

සමහර විට පැවිදිවෙලා සිටියත් පිළිවෙත් පුරමින් සිටියත් මොහුගේ සිත කාම ගරුක සිතක්. කාම අදහස් ඇති සිතක් කියල උන්වහන්සේ දැනගන්නවා. නුවණින් තේරුම් ගන්නවා.

**අව්‍යාපාදං සේවන්තඤ්ඤේව ජානාති අයං පුග්ගලෝ,**
**අව්‍යාපාදගරුකෝ, අව්‍යාපාද ආසයෝ, අව්‍යපාදාධිමුත්තෝ.**

ඇතැම් කෙනෙක් සමහර විට මෛත්‍රී වඩනව. ඔහු හැබෑම මෛත්‍රී ගරු කරන්නෙක්, මෛත්‍රී ආසය ඇත්තෙක්, මෛත්‍රී අදහස් ඇත්තෙක් කියල දැනගන්නව. තවත් සමහර කෙනෙක් ඉන්නවා.

**ව්‍යපාදං සේවන්තඤ්ඤේව ජානාති අයං පුග්ගලෝ**
**ව්‍යාපාදගරුකෝ, ව්‍යාපාදාසයෝ, ව්‍යාපාදාධිමුත්තෝ.**

මෛත්‍රී භාවනාව කරනව වගේ හවනා කළත්, ඔහුගේ සිත ව්‍යාපාදය ගරුක සිතක්, ව්‍යාපාද අදහස් ඇති සිතක්, ව්‍යාපාද ආසය ඇති සිතක් කියල තෝරා ගන්නවා.

**ආලෝකසඤ්ඤං සේවන්තඤ්ඤේව ජානාති**
**අයං පුග්ගලෝ ථීනමිද්ධ ගරුකෝ**
**ථීනමිද්ධාසයෝ ථීනමිද්ධාධිමුත්තෝ.**

ඇතැම් විට ප්‍රබෝධ සිතක් ඇති කෙනෙක් වුනත්, ඔහුගේ සිත ස්වභාවයෙන් ම ථීනමිද්ධයට බරයි. ථීනමිද්ධ අදහස් ඇති කෙනෙක් ථීනමිද්ධ ආසය ඇති කෙනෙක් කියල තෝරා ගන්නවා.

මේවා සර්වඥතා ඥාණයෙන් නොව, ආසය අනුසය ඥාණයෙන් උන්වහන්සේ තෝරාගන්නා පිළිවෙළයි මේ සඳහන් වුණේ.

ඊළඟට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළා **අයං සත්තානං ආසයෝ** මෙන්න සත්වයන්ගේ ආසය.

**කතමෝච සත්තානං අනුසයෝ**

සත්වයන්ගේ අනුසය කුමක් ද? "සත්තානුසයා" අනුසය ධර්ම හතක් තිබෙනවා. **කාමරාගානුසයෝ, පටිඝානුසයෝ, මානානුසයෝ, දිට්ඨානුසයෝ, විචිකිච්ඡානුසයෝ, භව රාගානුසයෝ, අවිජ්ජානුසයෝ.** මේ තමා ඒ අනුසය ධර්ම හත.

**යං ලෝකේ පිය රූපං සාතරූපං එත්ථ සත්තානං කාමරාගානුසයෝ අනුසේති. යං ලෝකේ අප්පියරූපං, අමනාපරූපං, අසාතරූපං, එත්ථ සත්තානං පටිඝානුසයෝ අනුසේති. ඉති ඉමේසු ද්විසු ධම්මේසු අවිජ්ජා අනුපතිතා ........**

**මානෝ ච දිට්ඨි ච විචිකිච්ඡා ච දට්ඨබ්බා අයං සත්තානං අනුසයෝ.** "අනුසය" කියන්නේ සන්තානය තුළ නොනැසී, ප්‍රහීණ නොවී, අවස්ථානුකූලව පැන නැගීමට සුදුසු කෙලෙසුන්ට කියනව " අනුසය" කියල.

**අප්පහීනට්ඨේන අනු අනු සන්තානේ සෙන්තීති අනුසයා,** කියන්නේ ඒකයි. මාර්ග ඥාණයන්ගෙන් ප්‍රහීණ නොකළ හෙයින්, නැවත නැවත අවස්ථානුකූලව, "නයා පෙණේ කරන්නා" වාගේ මතුවන ස්වභාවය ඇති කෙලෙසුන්ට "අනුසය" කියල කියනව. අප්‍රහීණ අර්ථය කියන්නේ ඒකයි.

හරියට ලිඳක පතුලේ තැන්පත් වී තිබෙන්නා වූ රොන්මඩ වාගේ, වතුර ඇති ළිඳක සමහර විට උඩින්, මතුපිටින් වතුර පිරිසිදුව තිබෙන්නට පුලුවන්. නමුත් ලිං පතුලේ තියෙන රොන්මඩ ලී කැබැල්ලකින් හෝ ගල් කැටයකින් හෝ භාජනයකින් හෝ කැලැත්තුවොත් (කැළඹුණොත්) මුලු වතුරම බොර වෙනවා. අන්න ඒ වාගේ තමයි මාර්ගඵල නොලැබූ පෘථග්ජන සන්තාන අප්‍රහීනතාවෙන් පවත්නා වූ ශක්තිමත් භාවයට පත් වූ කෙලෙස් හතක් තිබෙනවා.

යම් අරමුණක් ලැබුණ වෙලාවේ "නයා" පෙණේ කරන්නා වාගේ, වහාම ඇවිත් තමන්ගේ ක්‍රියාකාරී බවට පත්වෙනවා. කෙලෙසුන්ගේ ක්‍රියාකාරී බවට පත්වෙනවා. පරියුට්ඨාන, වීතික්කම බවට පත්වෙනවා. ඒ තත්වයට පත්වීමට හැකි කෙලෙස් හතට තමයි.

1. කාමරාගානුසයෝ 2. පටිඝානුසයෝ 3. මානානුසයෝ 4. දිට්ඨානුසයෝ 5. විචිකිච්ඡානුසයෝ 6. භවරාගානුසයෝ 7. අවිජ්ජානුසයෝ කියල කියන්නේ.

**යං ලෝකේ පියරූපං සාතරූපං**

මේ සදොරින් ගන්න යම්තාක් ප්‍රියමනාප මිහිරි ස්වභාවය ඇති අරමුණක් වේ නම්, ඒ අරමුණෙහි සිතේ, කාමරාගානුසයෝ අනුසයති, කාමරාග කියන අනුසය ඇති වෙනව.

**යං ලෝකේ අප්පියරූපං අසාතරූපං එත්ථ**
**සත්තානං පටිඝානුසයෝ අනුසයති.**

මේ සදොරින් ගන්න අරමුණු අතුරින් යමක් යමක් තමාට අප්‍රිය නම් අමනාප නම්, එතැන දී සත්වයන්ගේ සන්තානවල පටිඝානුසය පහළ වෙනවා.

**ඉති ඉමේසු ද්වීධානේසු අවිජ්ජා අනුපතිතා.**

ඒ දෙතැනම ඒකාන්තයෙන් ම අවිද්‍යාව පහළ වෙනව.

**තදේකට්ඨෝ මානෝ ච, දිට්ඨි ච, විචිකිච්ඡා ච දට්ඨබ්බං.**

ඒ සමඟම ඒ අරමුණු කෙරෙහි මාන්නය ඇති වෙනවා. දිට්ඨිය ඇති වෙනව. විචිකිච්ඡාව ඇති වෙනවා. භවරාගයත්, කාම රාගයත් කාමරාගයටම සම්බන්ධයි. ලෝභය බැවින්, මෙන්න මේ ආකාරයට ලෝක සත්වයාගේ සන්තානවල පවත්නා වූ අප්‍රහීණ, ස්වභාවයෙන්ම පවත්නා වූ අනුසය ධර්ම මෙතෙක් මේ තැනැත්තාගේ උත්සන්නව තිබෙනවා. මෙතෙක් මෙතෙක් අනුසය මධ්‍යමව තිබෙනවා. මෙතෙක් මෙතෙක් අනුසය තුනීවෙලා තිබෙනවා. මේ සත්වයාගේ සන්තානයේ මේ මේ අනුසය දැඩිව තිබෙනවා කියලා. ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ දැකගන්නේ ආසය අනුසය ඤාණයෙන්.

**කතමං සත්තානං චරිතං**

සත්වයාගේ චරිතය කියන්නේ කුමක් ද?

**පුඤ්ඤාභිසංඛාරෝ අපුඤ්ඤාභිසංඛාරෝ**

**ආනෙඤ්ජාභිසංඛාරෝ - පරිත්තභූමකෝ වා, මහාභූමකෝ වා, ඉදං සත්තානං චරිතං.**

කාමාවචර භූමිවල ඉපදීමට හේතුවන්නා වූ ද, රූපාවචර, අරූපාවචර, භූමිවල ඉපදීමට හේතු වන්නා වූ ද, පුණ්‍යාභි

සංඛාර, අපුඤ්ඤාභිසංඛාර, ආනෙඤ්ජාභිසංඛාර කියන මේ කුසලා කුසල ධර්මය යි චරිතය කියල හඳුන්වන්නේ. පුඤ්ඤාභි සංඛාර කියන්නේ.

කාමාවචර මහා කුසල් සිත් අටත්, රූපාවචර කුසල් සිත් පහත් කියන කුසල් සිත් දහතුනට කියනව පුඤ්ඤාභි සංඛාර කියල.

අපුඤ්ඤාභිසංඛාර කියන්නේ අකුසල චේතනා දොළහයි.

ආනෙඤ්ජාභිසංඛාර කියන්නේ අරූපාවචර කුසල චේතනා

සම්මා සම්බුදු රජාණන් වහන්සේ ඒ ඒ පුද්ගලයන් පිළිබඳව ඈත අතීතයේ දී කරන ලද්දා වූ, කුසල කර්මයන් නුවණින් තෝරා ගන්නව. මේ පුද්ගලයා අසවල් කාලේ, අසවල් ආත්ම භවයේ දී මෙනම් මෙනම් කුසල් කරල තිබෙනවා. මෙනම් මෙනම් අකුසල් කරල තිබෙනවා. කියල සියල්ල තත්වාකාරයෙන් දැක වදාරන්නේ ආසය අනුසයේ ඤාණයෙන්. ඒකට කියනව "චරිත ඤාණය" කියල.

අධිමුක්ත කියල කියන්නේ,

**සන්ති සත්තා හීනාධිමුත්තිකා, සන්ති සත්තා පණීතාධිමුත්තිකා.**

මේ ලෝකයේ සත්වයෝ, කොටස් දෙකකට බෙදනවා.

**හීන අධිමුක්තික සත්වයෝ , ප්‍රණීත අධිමුක්තික සත්වයෝ** කියලා.

අධිමුත්ති කියන්නේඃ සිතේ සිතුම් පැතුම්, ප්‍රාර්ථනා අදහස්, සිතුම් පැතුම් ප්‍රාර්ථනා දෙයාකාරයි.

1. හීන අධ්‍යාසය 2. ප්‍රණීත අධ්‍යාසය

**හීනාධිමුක්තිකා සත්තා, හීනාධිමුක්තිකේ සත්තේ සේවන්ති, භජන්ති, පයිරුපාසන්ති.**

හීන අදහස් ඇත්තා වූ, "හීන අදහස්" කියන්නේ කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධය, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්චා කියන මේ නීවරණයන්ගෙන් ගහණ වූ අයහපත් සිතුම් පැතුම් ලෝභයෙන්, ද්වේෂයෙන්, මෝහයෙන්, විචිකිච්චාවෙන්, ක්‍රෝධයෙන්, වෛරයෙන්, මේ වාගේ සිතුම් පැතුම්වලින් යුක්ත පුද්ගලයාට කියනවා හීනාධිමුත්තිකයෝ කියලා.

"ප්‍රණීතාධිමුත්ත" කියල කියන්නේ ශ්‍රද්ධාව, ප්‍රඥාව, කරුණාව, මුදිතාව, වීර්යය, ස්මෘතිය, සමාධිය, මේ වාගේ උසස් ගුණ පිලිබඳව අදහස් ඇත්තා වූ පුද්ගලයෝත්, තවත් සතිපට්ඨාන, සම්‍යක් ප්‍රධාන, ඍද්ධිපාද, ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මග්ග කියන මේ බෝධිපාක්ෂික ධර්මයන් වඩන ඒ විදියේ අදහස් ඇති පුද්ගලයන්ට කියනවා, "ප්‍රණීතාධිමුක්තික පුද්ගලයෝ" කියල. එතකොට අතීත කාලෙත්, අනාගත කාලෙත් හීන අධිමුක්තික පුද්ගලයෝ නමැති අය පහත් අදහස් ඇති අයම ආශ්‍රය කරනවා. සේවනය කරනව. භජනය කරනව. පයිරුපාසානය කරනවා.

එක්තරා දිනෙක සම්මා සම්බුදු රජාණන් වහන්සේ ගිජ්ඣකූට පර්වතයෙහි වැඩ සිටි අවස්ථාවක, ගිජ්ඣකූට පර්වත පාමුල සක්මන් කරන රහතන් වහන්සේලාගේ පිරිස් දැක්කා. සැරියුත් මහරහතන් වහන්සේ 500ක් රහතන් වහන්සේලා සමඟ. මෙහෙම විශේෂ රහතන් වහන්සේලා තම තමන්ගේ පිරිස් සමඟ සක්මන් කරනව දැක්කා. දැකල බුදුරජාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේ අමතා වදාරනවා, ආනන්දය අර ශාරීපුත්ත ස්ථවිරයන් වහන්සේ පසුපසින් සක්මන් කරනව නේද? 500ක්. ඔය හැමදෙනාම ප්‍රඥාවන්තයෝ.

අර බලන්න, මුගලන් ස්ථවිරයන් වහන්සේ පසුපසින් 500ක් භික්ෂූන් සක්මන් කරනව නේද? ඔය හැම දෙනාම ඍද්ධිවන්තයෝ. අර මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ සමඟ 500ක් සක්මන් කරනව නේ ද? ඔය හැමදෙනාම ධුතාංගධාරී අය. ඔය විදියට එක එක රහතන් වහන්සේලා ඇසුරු කරන අය උන්වහන්සේලාගේ ගුණයට සම්බන්ධ අය බව පහදා දුන්නා. මේ ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ අධිමුත්ති ඤාණය පිළිබඳ කථාවක්, ඒ කියවුණේ.

මේක අතීතයේත්, අනාගතයේත්, වර්තමානයේත් එහෙමයි. ප්‍රාණඝාත කරන කෙනා ප්‍රාණඝාත කරන කෙනාට ඇලුම් කරනවා. ආශ්‍රයට කැමති වෙනවා. අදින්නාදාන, කාමමිච්ඡාචාර, මුසාවාද, පිසුනාවාචා, පරුෂාවාචා, සම්ඵප්‍රලාප, සුරාපාන

අභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡාදිට්ඨි, මේ එක එක ගති පැවතුම් ඇති අය ඒ සමාන ගති පැවතුම් ඇති පුද්ගලයන් ආශ්‍රය කරන්න, භජනය කරන්න, පයිරුපාසනය කරන්න කැමති වෙනවා.

එසේම ප්‍රාණඝාතයෙන් වැළකුණු සීලවන්තයා සිල්වතෙක්ම ආශ්‍රය කරන්න කැමති වෙනවා. සමාධි වඩන්නා සමාධි වඩන්නකු ඇසුරු කරන්න කැමති වෙනවා. විදර්ශනා ඤාණ වඩන්න, විදර්ශනා වඩන්නෙකු ඇසුරු කරන්නට කැමති වෙනවා. ධුතාඞ්ග පරිහරණය කරන්නා, ධුතාඞ්ග පරිහරණය කරන්නෙකු ඇසුරු කරන්නට කැමති වෙනවා. මෛත්‍රී වඩන්නා, මෛත්‍රී වඩන්නෙකු ඇසුරු කරන්නට කැමති වෙනවා. බුදුගුණ වඩන්නා, බුදුගුණ වඩන්නෙකු ඇසුරට කැමති වෙනවා. මේ වාගේ යහපත් ගතිපැවතුම් ඇති පුද්ගලයා යහපත් ගතිපැවතුම් ඇති පුද්ගලයන් ඇසුරු කරන්නට කැමති වෙනවා. මෙන්න මෙයට කියනවා අධිමුත්ති ඤාණය පිළිබඳ අවබෝධය.

මේ අධිමුත්තිය පිළිබඳවයි උන්වහන්සේ මෙතැන දේශනා කළේ. එතකොට, අතීත, අනාගත, වර්තමාන යන තුන් කාලයම ඒ ඒ පුද්ගලයන් ආශ්‍රය, භජනය, පයිරුපාසනය කරන්නෙ, අධිමුත්තිය හෙවත් අභ්‍යාසයට අනුරූපවයි කියන එක පහදා දුන්නා.

**කතමෙ සත්තා අභබ්බා.**
**යෙ තෙ සත්තා කම්මාවරණේන සමන්නාගතා,**
**විපාකවරණේන සමන්නාගතා, කිලේසාවරණේන සමන්නාගතා,**
**අස්සද්ධා, අච්ඡන්දිකා, දුප්පඤ්ඤා අභබ්බා නියාමං**
**ඔක්කමිතුං කුසලේසු ධම්මේසු සම්මත්තං.**

අභව්‍ය පුද්ගලයෝ කියන්නෙ කවරහුද? මඟඵල නිවන් ලබන්න නුසුදුසු හේතු සම්පත් නැති අය අභව්‍ය නමින් හඳුන්වනවා. කර්මාවරණ කියන්නේ: පංච ආනන්තරීය කර්ම කරගත් අය, අභව්‍ය අය.

කිලේසාවරණ කියන්නේ, නියත මිථ්‍යාදිට්ඨි ගත්ත අය අභව්‍ය පුද්ගලයෝ.

විපාකාවරණ කියන්නේ, අහේතුක, ද්විහේතුක, ප්‍රතිසන්ධි, ඇති අය මඟඵල නිවන් ලබන්න අභව්‍ය යි.

අස්සද්ධා කියන්නේ: තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නැති අය මඟඵල නිවන්සුව ලබන්න අභව්‍ය යි.

අච්ඡන්දිකා කියන්නේ, උතුරුකුරු දිවයින්වාසී මනුෂ්‍යයන් වාගේ, මඟඵල නිවන් ලබන්න ඕනෑකමක් නැති අය අභව්‍යයි.

දුප්පඤ්ඤා කියන්නේ, ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය නැති අය මඟඵල නිවන් ලබන්න අභව්‍යයි.

**ඉමේ තෙ පුග්ගලා අභබ්බා**

මෙන්න මේ විදිහේ ලක්ෂණ ඇති අය මඟඵල නිවන් ලබන්න නුසුදුස්සෝ, අභව්‍ය පුද්ගලයෝ නම් වෙනවා.

**කතමේ තේ පුග්ගලා භබ්බා.**

භව්‍ය පුද්ගලයෝ කියන්නේ කවුද?

**යෙ තෙ පුග්ගලා න කම්මාවරණේන සමන්නාගතා**
**න කිලේසාවරණේන සමන්නාගතා.**
**න විපාකාවරණේන සමන්නාගතා.**
**සද්ධා, ඡන්දිකා, පඤ්ඤාවන්තෝ, භබ්බා නියාමං**
**ඔක්කමිතුං කුසලේසු ධම්මේසු සම්මත්තං.**

යම් පුද්ගලයෙක් පංච ආනන්තරීය කර්ම කරගෙන නැහැ. යම් පුද්ගලයෙක් නියත මිසදිටු ගෙන නැහැ. යම් පුද්ගලයෙක් අහේතුක, ද්විහේතුක, ප්‍රතිසන්ධියක් නැහැ. ත්‍රිහේතුක ප්‍රතිසන්ධියෙන් ඉපදිලා තිබෙනවා. එසේම තුනුරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව තිබෙනවා. මඟඵල නිවන් ලැබීමේ දැඩි ඡන්දයක් තිබෙනවා. එයට සුදුසු ප්‍රඥාවක් තිබෙනවා. කුසල ධර්ම සංඛ්‍යාත මාර්ගඵල නිවන් පිළිබඳව බැස ගැනීමට හේතු සම්පත් ඇති බැවින්, ඒ අයට කියනවා භව්‍ය පුද්ගලයෝ කියලා. මෙන්න මේ ආකාරයට ඒ ඒ සත්වයන් පිළිබඳ ආසය, අනුසය චරිතය, අධිමුකත්තිය, භව්‍ය, අභව්‍ය කියන අවස්ථා සියල්ල දැනගන්නා වූ යම් ඥාණයක් වෙයි නම්, **ඉදං තථාගතස්ස සන්තානං ආසයානුසයේ ඤාණං.**

මෙන්න මේ ඤාණයට කියනවා, තථාගතයන් වහන්සේගේ සන්තානයේ පිහිටියා වූ, වෙන කිසිම ශ්‍රාවක කෙනෙකුට නො පිහිටියා වූ, ෂට් අසාධාරණ ඤාණයන්ට ඇතුළත් වූවා වූ "ආසය අනුසය ඤාණය" නමින් හඳුන්වනවා, කියන එක දම් සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේ මෙහෙම ප්‍රකාශ කොට වදාළා.

ආසය අනුසයේ ඤාණය පිළිබඳව දැන ගැනීමෙන් අපට තේරුම් ගන්න හැකිවෙනවා, ලොව්තුරා සම්මා සම්බුදු කෙනෙක් හැර කිසිම රහතන් වහන්සේ නමකට හැකියාවක් නැහැ වේනෙයා පුද්ගලයන්ගේ ආසය, අනුසය, චරිත, අධිමුත්ති, භව්‍ය, අභව්‍ය, තත්වයන් තේරුම්ගෙන ඒ ඒ පුද්ගලයන්ට සුදුසු උපදෙස් දීල අවවාද කරල, මඟඵල නිවන් ලබා දෙන්න හැකියාවක් නැහැ රහතන් වහන්සේලාටවත්.

රහතන් වහන්සේලා අනුමාන වශයෙන්, ධර්ම නියාම වශයෙන් කල්පනා කරලයි, පුද්ගලයෙකුට අවවාද කරන්නේ. ලොවුතුරා බුදුරජාණන් වහන්සේ පහදා දී ඇති මාතෘකාවන් අනුව උන්වහන්සේලා පුද්ගලයන් තේරුම් ගන්නවා මිස, මේ ආසය අනුසය ඤාණයෙන් දැකගෙන නොවෙයි.

ඒ නිසා තමයි දම්සෙනෙවි සැරියුත් මහරහතන් වහන්සේටත් තමන්ගේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට අර්හත්වය ලබා දෙන්න නොහැකි වී බුදුරජාණන් වහන්සේට පවරල තිබෙන්නේ. එනිසා ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේට පමණක් ලැබෙන අනන්‍ය සාධාරණ වූ, අතිශ්‍රේෂ්ඨ වූ, ආසයානුසය ඤාණය පිළිබඳව අපි නැවත නැවත සාකච්ඡා කරන්නට ඕනෑ.

මේ කරුණු තව තවත් අපි පැහැදිලි කර ගන්නට ඕනෑ. බණ පොත් කියවමින් තවත් වැඩිහිටි උගත් උතුමන් සමඟ සාකච්ඡා කරමින්, මේ පිළිබඳව අවබෝධය නිවැරදි කරගන්නට අපි බලාපොරොත්තු වෙන්නට ඕනෑ.

ඒ නිසා සම්මා සම්බුදු රජාණන් වහන්සේ දෙතිසක් මහා පුරුෂ ලක්ෂණ, අසූවක් අනුව්‍යඤ්ජන ලක්ෂණ, ව්‍යාමප්‍රභා, කේතුමාලාලංකාර, නීල, පීත, ලෝහිත, ඕදාත, මාංජේෂ්ඨ, ප්‍රභාෂ්වර

යන ෂට්වර්ණ ඝන බුදුරැස් මාලාවකින් බබළනවා. අතිශයින්ම අනන්‍ය සාධාරණ වූ, උත්තම වූ, රූපකාය සම්පත්තියකින් සහ ඤාණකාය සම්පත්තියකින් බබළනවා. එසේම ඉන්ද්‍රිය පරෝපරිය ඤාණ, ආසය අනුසයේ ඤාණ, යමක මහා පාටිහාරියඤාණ, මහාකරුණා සමාපත්ති ඤාණ, සබ්බඤ්ඤුතඤාණ, අනාවරණ ඤාණ කියන ෂට් අසාධාරණ ඤාණයන්ගෙන් අතිශ්‍රේෂ්ඨ වූ ධර්මකාය සම්පත්තියෙන් දෙවියන්ට වඩා අතිශ්‍රේෂ්ඨ වූ බ්‍රහ්මයන්ට වඩා අතිශයින්ම ශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ දිවා රාත්‍රි දෙකේ බබළනවා. මෙසේ රූපකාය සම්පත්තියෙන් සහ ධර්මකාය සම්පත්තියෙන් දෙවියන්ට වඩා අතිශ්‍රේෂ්ඨ වූ බ්‍රහ්මයන්ට වඩා අතිශයින්ම ශ්‍රේෂ්ඨ වූ, අග්‍රගණ්‍ය වූ, දශබලධාරී වූ, සම්මා සම්බුදු රජාණන් වහන්සේට අපේ කයෙන්, වචනයෙන්, සිතිනුත් නමස්කාරය වේවා! අපේ ජීවිතය ද ඒ භාග්‍යවතුන් වහන්සේට පූජා වස්තුවක් මෙන් පූජා වේවා! ඒ භාග්‍යවතුන් වහන්සේ දේශනා කොට වදාළ සුවාසූ දහසක් ධර්මස්කන්ධය අපේ නුවණට වැටහේවා! ඒ ධර්මානුධර්ම ප්‍රතිපදාවේ යමින්, අපටත් ඒ සර්වඥයන් වහන්සේ පහදා වදාළ දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග චතුරාර්ය සත්‍යාවබෝධයෙන් ශාන්ත නිවන්සුව සුවසේ අවබෝධ කර ගන්නට ලැබේවා කියා ප්‍රාර්ථනා කර ගනිමු.

මෙතෙක් වේලා ශීලයක පිහිටාගෙන බුදුරජාණන් වහන්සේගේ අසාධාරණ ඤාණ හය අතුරින් දෙවන ආසය අනුසය ඤාණය පිළිබඳව දේශනා කළ ධර්ම දේශනයට සවන් දීමේ උදාර පුණ්‍යානුභාව බලයෙන් සැම දෙනාටම ශතවර්ෂාධික කාලයකට නිරෝගිසුව දීර්ඝායු අත් වී සපිරිවරින් පැතූ උතුම් බෝධි ඤාණයන්ගෙන් ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුව සුවසේ අවබෝධ කර ගැනීම පිණිස ම හේතුවේවා! වාසනා වේවා!

සාදු! සාදු!! සාදු!!!

**ආසය අනුසය ඤාණ ධර්මදේශනාව නිමි.**

# 3. යමක ප්‍රාතිහාර්යඥාණ ධර්ම දේශනය

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස*

**කතමං තථාගතස්ස යමකපාටිහීරේ ඤාණං**

ඉධ තථාගතෝ යමකපාටිහීරං කරෝති අසාධාරණං සාවකේහි, උපරිම කායතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. හෙට්ඨිමකායතෝ උදකධාරා පවත්තති. හෙට්ඨිමකායතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. උපරිම කායතෝ උදකධාරා පවත්තති. පුරත්ථිම කායතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. පච්ඡිම කායතෝ උදකධාරා පවත්තති. පච්ඡිම කායතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. පුරත්ථිම කායතෝ උදකධාරා පවත්තති. දක්ඛිණක්ඛිතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. වාමක්ඛිතෝ උදකධාරා පවත්තති. වාමක්ඛිතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. දක්ඛිණක්ඛිතෝ උදකධාරා පවත්තති. දක්ඛිණ කණ්ණසෝතතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. වාමකණ්ණසෝතතෝ උදකධාරා පවත්තති. වාම කණ්ණ සෝතතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. දක්ඛිණ කණ්ණසෝතතෝ උදකධාරා පවත්තති. වාම නාසිකා සෝතතෝ උදකධාරා පවත්තති. වාම නාසිකා සෝතතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. දක්ඛිණ නාසිකා සෝතතෝ උදකධාරා පවත්තති. දක්ඛිණංසකූටතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. වාමංසකූටතෝ උදකධාරා පවත්තති. වාමංසකූටතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. දක්ඛිණංසකූටතෝ උදකධාරා පවත්තති. දක්ඛිණ හත්ථතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. වාම හත්ථතෝ උදකධාරා පවත්තති. වාම හත්ථතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. වාම හත්ථතෝ උදකධාරා පවත්තති. දක්ඛිණ පස්සතො උදකධාරා පවත්තති. වාමපස්සතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. දක්ඛිණ පස්සතෝ උදකධාරා පවත්තති. දක්ඛිණ පාදතෝ අග්ගිකඛන්ධෝ පවත්තති. වාමපාදතෝ උදකධාරා පවත්තති. වාමපාදතෝ අග්ගිකඛන්ධෝ

පවත්තති. දක්ඛිණපාදතෝ උදකධාරා පවත්තති. අඞ්ගුලඞ්ගුලේහි අග්ගික්ඛන්ධෝ පවත්තති. අඞ්ගුලන්තරිකාහි උදකධාරා පවත්තති. අඞ්ගුලන්තරිකාහි අග්ගික්ඛන්ධෝ පවත්තති. අඞ්ගුලඞ්ගුලේහි උදකධාරා පවත්තති. අඞ්ගුලඞ්ගුලේහි අග්ගික්ඛන්ධෝ පවත්තති. ඒකේක ලෝමතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. ඒකේක ලෝමතෝ උදකධාරා පවත්තති. ලෝමකූපතෝ ලෝමකූපතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති. ලෝමකූපතෝ ලෝමකූපතෝ උදකධාරා පවත්තති. ඡන්නං වණ්ණානං නීලානං, පීතානං, ලෝහිතකානං, ඕදාතානං, මඤ්ජිට්ඨානං පභස්සරානං.

භගවා චඞ්කමති නිම්මිතෝ තිට්ඨති වා, නිසීදති වා. සෙය්‍යං වා කප්පේති. භගවා තිට්ඨති නිම්මිතෝ චඞ්කමති වා තිට්ඨති වා නිසීදති වා නිම්මිතෝ චඞ්කමති භගවා තිට්ඨති වා සෙය්‍යං වා කප්පේති, නිම්මිතෝ තිට්ඨති නිසීදත් වා සෙය්‍යං වා කප්පේති, නිම්මිතෝ තිට්ඨති භගවා චඞ්කමති වා තිට්ඨති වා, සෙය්‍යං වා, කප්පේති, නිම්මිතෝ නිසීදති, භගවා චඞ්කමති වා තිට්ඨති වා, සෙය්‍යං වා, කප්පේති, නිම්මිතෝ සෙය්‍යං කප්පේති භගවා චඞ්කමති වා, තිට්ඨති වා නිසීදති වාති.

ඉදං තථාගතස්ස යමකපාටිහීරේ ඤාණන්ති.

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත් වූ, අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජෝත්තමයන් වහන්සේගේ සන්තානයෙහි පහළවන අසාධාරණ ඤාණ හය අතුරින් තුන්වන යමක ප්‍රාතිහාර්ය ඤාණය සඳහා මාතෘකාවයි ඉදිරිපත් කරන්න යෙදුනෙ.

ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ අසාධාරණ ඤාණ හය අතරින් තුන්වන ඤාණය, යමක මහා ප්‍රාතිහාර්ය ඤාණය. ඒ යමක ප්‍රාතිහාර්ය ඤාණයෙන් සර්වඥයන් වහන්සේ ලොවට යමාමහ පෙළහර පා වදාළ අවස්ථා කිහිපයක් තිබෙනවා.

ඒ යමාමහ පෙළහර පෑමෙන් බලාපොරොත්තු වන්නේ පුද්ගල සන්තානවල ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් අවදි කරවලා,

ඒමඟින් චිත්ත ප්‍රසාදය ඇති කරවලා චිත්ත සමාධියත්, විපස්සනා ඥාණයන් පහළ කරවමින් මාර්ගඵල නිවන් අවබෝධ කරවා දීමයි.

ඒ විදියේ යමක මහාප්‍රාතිහාර්ය පළමුවෙන් ම පවත්වා වදාළේ ලොවට ධර්මානුසාසනා කරන්නට හෝ ධර්මාවබෝධ කරවන්න නෙවෙයි දෙවියන්ගේ සැක දුරුකරන්ටයි. ඒ තමයි බෝධිමූලයේ දී බුදුවීමෙන් දෙවන සතිය අන්තයේ බුදුවීමෙන් 14වන දවසේ දී බෝධිමූලයේ දී යමාමහ පෙළහර පා වදාළ අවස්ථාව.

එයට හේතුව වූයේ, පළමුවන සතියේ පර්යංකය නොලිහා නිවන් සැපම විඳිමින් වැඩහිටිය බෝධිමූලයේ දී, වජිරාසනයේ දී දෙවන සතියේ දී කළගුණ සැලකීම් ශීර්ෂයෙන් ඒ වජිරාසනයෙන් බිමට වැඩම කරලා බෝධීන් වහන්සේටත්, වජිරාසනයටත්, අනිමිස ලෝචන පූජාවෙන් පූජා කළා දින හතක් ම. මෙය දුටුවා වූ දෙවියෝ ද, බ්‍රහ්මයෝ ද සිතුවා, සිද්ධාර්ථයන් වහන්සේගේ අභිප්‍රාය තාම සඵල වෙලා නෑ නේද කියලා. මේ බෝධීන් වහන්සේ දිහාවෙත් වජිරාසනය දිහාවෙත් බලාගෙන ඉන්නේ ඒ නිසා නේද කියලා සැක හිතුවා. ඒ අයට බුදුරජාණන් වහන්සේගේ මාර්ගඵල දකින්න බැහැනේ. තවමත් බුදුවෙලා නැහැ කියලයි ඔවුන් හිතුවේ.

ඒ නිසා ඔවුන්ගේ සැකය දැනගත් තථාගතයන් වහන්සේ, 14 වන දවසේ දී බෝධීන් වහන්සේට ඉහළින් අහසට පැන නැඟී, රුවන් සක්මනක් මවා, යමාමහ පෙළහර පා වදාළා. එයින් මේ දෙවියන්ගේ බ්‍රහ්මයන්ගේ සැකය දුරු වී සර්වඥයන් වහන්සේ බුදුබවට පත් වුණා නේද කියලා සියල්ලෝම පිළිගත්තා.

දෙවෙනි වරට යමාමහ පෙළහර පෑම සිද්ධ වුණේ ඥාති සමාගමේ දී. ඒ කියන්නේ "කාළුදායි" මහ රහතන් වහන්සේගේ මාර්ග වර්ණනාවන් අනුව, සුදොවුන් මහරජතුමාණන්ගේ ආරාධනය නිසා, රජගහනුවර වේළුවනාරාමයේ සිට විසිදහසක් මහ රහතන් වහන්සේලා සමඟ කපිලවස්තු නුවරට වැඩම කරන්න පටන් ගත්තේ මැදින් මස පුරපසළොස්වක පොහෝ

දවසේ. දවස් හැටකින් එම ස්ථානයට වැඩියා. එම ස්ථානයේ මවුපස ඥාතීන් අසූදහසක්, පියපස ඥාතීන් අසූදහසක් පිරිස විශාල ජනසමූහයක් එක්කාසු වී සිටියා නිග්‍රෝධාරාමයට. " බේමක" කියන ශාක්‍ය රජතුමාගේ "නිග්‍රෝධ" කියන උයන බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට එදා සඟසතු කොට පූජා කළා. ඈත අතීතයේ පහළ වූ සර්වඥයන් වහන්සේලා ඥාති සමාගමේ දී ඥාතීන්හට බුදුමහිමය දක්වනු පිණිස යමාමහ පෙළහර පෑම සිදුකර ඇති බව දැනගත් තථාගතයන් වහන්සේ ද, අහසට පැන නැඟී රුවන් සක්මනක් මවා, නිර්මිත බුදුරුවක් මවා, සවනක් ඝන බුදුරැස් විහිදුවමින්, ප්‍රශ්නෝත්තර සාකච්ඡාවක් ද කරමින්, ඉරියව් මාරුකරමින්, ශ්‍රී ශරීරයෙන් ගිනිකඳ, ජලකඳ නිකුත් කරමින් යමාමහ පෙළහර සිද්ධ කළා. වෙස්සන්තර ජාතකය ද, එදා දේශනා කළා. මහපොළොව ද කම්පා වුණා. පොකුරු වැසි වැස්සා.

එදා දිනයේ දී කෝටි ලක්ෂයක්, දෙවියන් රහත් වුණා. අසංඛෙය්‍ය අසංඛෙය්‍ය බැගින් පිරිස සෝවාන් වුණා. සකදාගාමී වුණා. මේ තමයි දෙවෙනි යමාමහ පෙළහර පෑමේ අවස්ථාව. මේ ඥාති සමාගමේ දී යමාමහ පෙළහර පෑම සියලු සර්වඥයන් වහන්සේලාගේ ධර්මතාවක්, චාරිත්‍රයක්.

තුන්වැනි යමාමහ ප්‍රාතිහාර්ය සිදුවුණේ බුදුවීමෙන් හත්වැනි අවුරුද්දේ ඇසළ පුර පසළොස්වක පොහෝ දවසේ. මේ තමයි තීර්ථක මාන මර්දනය සඳහා පා වදාළ ප්‍රාතිහාර්යය. මෙයත් සියලුම සර්වඥයන් වහන්සේලා පවත්වනු ලබන ප්‍රාතිහාර්යයක්. ඒ කියන්නේ සියලුම සර්වඥයන් වහන්සේලා බුද්ධත්වයෙන් හත්වන වර්ෂයේ ඇසළ පුර පසළොස්වක පොහෝ දවසේ, තව්තිසා භවනට වැඩම කරවන්නේ, තෙමසක් අභිධර්ම දේශනය සඳහා, සමහර බුද්ධ ශාසන කාලයන්හි දී තීර්ථකයන් ඇත්තේම නැහැ. නමුත් අර චාරිත්‍රය සම්පූර්ණ වනු පිණිස සියලුම සර්වඥයන් වහන්සේලා ඒ දවසේ දී යමාමහ පෙළහර පවත්වලයි තව්තිසාවට වැඩම කරන්නේ.

අපේ සම්මා සම්බුදු රජාණන් වහන්සේට ඒ දවස්වල තීර්ථකයන්ගෙන් අභියෝගයක් සිද්ධ වුණා. තරඟෙට පෙළහර පානවා කියලා. ඒකට මුල් ආරම්භයක් වුණේ "පිණ්ඩෝල භාරද්වාජ මහරහතන් වහන්සේ" රජගහ නුවර සිටුවරයා හට දැක්වූ ප්‍රාතිහාර්ය යි. ඒක දිග කතාවක්. කෙටියෙන් මෙහෙමයි.

එම රජගහනුවර මහසිටුවරයෙක් ගංගානම් ගඟ හරහා විශාල දැලක් දාගෙන වතුර නෑම පිණිස ගියා ගඟට. එක දවසක් විශාල හඳුන් හරයක් මේ දැලේ පැටලුණා. මේක ගොඩ අරගෙන එහි වටිනාකම බොහෝම උතුම් නිසා, මේකෙන් ලෝකයේ රහතන් වහන්සේලා ගැන පරීක්ෂණයක් කරනු පිණිස හඳුන් පාත්‍රයක් ලියෙව්වා. මේ හඳුන් පාත්‍රය හැට රියනක් උසට උණ ලී බැඳලා, ඒ උණ ලී කෙළවර මෙය රඳවල, ප්‍රසිද්ධ කළා. ලෝකයේ රහතන් වහන්සේලා ඇතොත්, මේ හඳුන් පාත්‍රය අහසින් පැමිණ ගනිත්වා කියලා.

දවස් හතක් ම ඉක්මිලා ගියා. කිසිවෙක් මෙය ගත්තේ නෑ. පූර්ණ කාශ්‍යප ආදි ශාස්තෘවරු හයදෙනා පේළියට දවස් හයකදී ආවා. කිසි කෙනෙකුට බැරිවුණා මේක ගන්ට. හයවන දවසේ දී නිඝණ්ඨනාථ පුත්ත ඇවිත් බොහෝම යාච්ඤා කළා. උඩට නඟින්නත් හැදුවා. ඒත් බැරිවුණා ගන්න. මේ අතර හත්වැනි දවසේ දී මුගලන් මහ රහතන් වහන්සේත්, පිණ්ඩෝල භාරද්වාජ මහරහතන් වහන්සේත් ගිජ්ඣකූට පර්වතයෙන් බැහැල පිණ්ඩපාතේ වඩිනු පිණිස ගල්තලාවක සිවුරු පෙරවද්දී සුරාසොඬුන්ගේ කථාවක් ඇහුණා මේ වගේ.

මේ ලෝකේ රහතන් වහන්සේලා ඉන්නව කිව්වට කෝ තවත් නැනෙ, රහතන් වහන්සේ කෙනෙක් දකින්නවත්. අද හත්වෙනි දවස, අර අසවල් සිටුවරයාගේ හඳුන් පාත්‍රය උණ ලීයක තියල, තවම කිසි රහත් කෙනෙක් ඒක ගත්තෙ නෑනෙ. ඒක නිසා රහතන් වහන්සේලා ලෝකේ නැතුව ඇති කියලා ඔවුන් කථා කළා.

මේ කතාව ඇසුණ මුගලන් ස්වාමීන් වහන්සේ පිණ්ඩෝල භාරද්වාජ මහරහතන් වහන්සේට පැවරුවා, අහසෙන් වැඩල අර සඳුන් පාත්‍රය ගන්න කියලා. පිණ්ඩෝල භාරද්වාජ ස්වාමීන් වහන්සේ තුන් යොදුනක් වට ප්‍රමාණ ඇති, ගල්තලාවක් කකුලේ මහපටඟිල්ලෙන් අහසට අරගෙන මුලු මහත් රජගහ නුවර පියනක් වැහුවා වගේ වහගෙන, පෙළහර පෑවා. මෙය දුටු රජගහ නුවර සිටුවරයා විස්මිත වෙලා බිම දිගාවෙලා වැඳලා කිව්වා අනේ ස්වාමීනි, බිමට වඩින සේක්වා! තවත් පෙළහර පාලා බිමට වැඩම කරන වෙලාවේ මේ හඳුන් පාත්‍රය බිමට අරගෙන චතුමධුර පුරවලා පූජා කළා. එදා තමයි මෙතුමා බෞද්ධයෙක් බවට පත් වුණේ. ඉන්පසු මේ පෙළහර නොදුටු බොහෝ දෙනා ස්වාමීන් වහන්සේ වෙත පැමිණ, ස්වාමීනි, අපටත් පෙළහරක් පාන සේක්වා කියලා ආරාධනා කළා.

මෙසේ වේළුවනාරාමයට වඩිද්දී, ස්වාමීන් වහන්සේ පෙළහර පාමින් අහසින් වැඩම කළා. මේ ජනතාව විසින් කරන සාදු නාදය සර්වඥයන් වහන්සේට ඇහිල, ආනන්ද මාහිමියන් සමඟ එය සාකච්ඡා කළා. පිණ්ඩෝල භාරද්වාජ මහරහතන් වහන්සේ ගෙන්වා ගෙන, එසේ ප්‍රාතිහාර්ය පෙන්වීමේ වරද පෙන්වල, ඒ සඳහා ශික්ෂා පදයක් පැනෙව්වා. කිසි කලෙක ප්‍රාතිහාර්ය මහජනයා හට නොපෑව යුතුයි කියලා.

ඉතින් මේ සිද්ධිය ආරංචි වුණා තීර්ථකයින්ට. තීර්ථකයන් අභියෝගයක් කළා අපේ රහත්බව අපි ඇඟෙව්වේ නැහැ. මේ භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ රහත්බව ඇඟෙව්වා. හොඳයි, දැන් මින්පසු අපි තරගෙට ප්‍රාතිහාර්ය පානව කියලා අභියෝගයක් කළා. හේතුව ශික්ෂා පදයක් පනවනු බව දැනගත්තා. ශික්ෂා පද ජීවිත හේතුවෙන් වත් භික්ෂූන් වහන්සේලා නොකඩන බව දන්න නිසා මේ අභියෝගය කළේ. මේ බව ආරංචි වුණා බිම්බිසාර රජ්පුරුවන්ට.

රජතුමා පැමිණ සර්වඥයන් වහන්සේගෙන් ඇහුවා, අනේ ස්වාමීනි, ශික්ෂා පදයක් පැනෙව්වා කියල ආරංචි. ඉතින් මේ

තීර්ථකයන් අභියෝග කරනවා නේද? තරඟෙට පෙළහර පානව කියා ... දැන් කුමක් ද කරන්නෙ ? සර්වඥයන් වහන්සේ වදාළා ...

ඔව් මහරජ, ශික්ෂා පදයක් පැනෙව්වා. හැබැයි මහරජ, රජ උයනේ අඹ ගහක අඹ ගෙඩි කන්නට තහනම් කරන්නේ මහජනයාට නේද? රජතුමාට තහනමක් නෑ නේද? ඒ වගේ මේ ශික්ෂාපදය තථාගතයන් වහන්සේට බලපාන්නේ නැහැ. .... මහරජ තීර්ථකයන් පෙළහර පාන්න ආවොත්, මමත් සූදානම්, මේක ආරංචි වුණා තීර්ථකයන්ට. රජ්ජුරුවෝ ඇහුවා ස්වාමීනි, කොහේ ඉඳලද මේ පෙළහර පා වදාරන්නේ? කවදාද? මහරජ තව දින හතකින් සැවැත්නුවරදී. ඉතින් මේ ආරංචිය තීර්ථකයන් දැනගෙන, ඔවුන් වේලාසනින් රජගහනුවරින් සැවැත් නුවරට ගිහින්, සමූහ සමූහ වෙලා, කතිකා කරගෙන, පෙළහර පාන්නට විශාල මණ්ඩපයක් ද ඉදිකළා. ලක්ෂයක් මුදල් වැය කළා. ඔවුන්ගේ දායකයන්ගේ මුදල් එක්කාසු කරලා, විශාල මණ්ඩපයක් ඉදි කළා.

ඒ අතර සර්වඥයන් වහන්සේගෙන් අහන්න ලැබුණා, මේ පෙළහර පෑම සිදු කරනු ලබන්නේ අඹ ගහක් සමීපයේ කියලා. මේක දැනගත්ත තීර්ථකයෝ විශාල පිරිස් යොදවලා මුලු සැවැත්නුවර ම අඹ ගස් කැප්පෙව්වා. බොහෝ සෙයින් ඒ අතරට කුඩා අඹ පැල පවා උදුරලා දැම්මා. දැන් අඹ ගහක් පේන්න නෑ. ඉතින් මේ බව බුදුරජාණන් වහන්සේ දන්නව.

ඉතින් උන්වහන්සේ හත්වන දවසේ දී උදෑසන පිණ්ඩපාතේ වඩින ගමන් රජතුමාගේ උයනේ "ගණ්ඩ" කියන උයන් පාලකයා ඉතාම ලොකු අඹ ගෙඩියක් දිඹිති කැදැල්ලක් අතර සැඟවිලා ඉදිලා තිබිල, මහ රජ්ජුරුවන්ට ගෙන යන කොට, හිතුව, මේක රජතුමාට දුන්නොත් මට මුදලක් ලැබෙයි. ඊට වඩා මේක පූජාවක් කළොත් මට ලොකු පිනක් ලැබෙනවා නේද කියලා, අතරමඟදී හමුවුණ සර්වඥයන් වහන්සේට මේක පූජා කළා. උන්වහන්සේ එතැනදීම ඒක වැළඳුවා. අඹ ඇටේ රෝපණය කරන්ට උයන් පාලක තුමාට නියමම කළා. සර්වඥයන් වහන්සේගේ ශ්‍රී හස්තය

දෝවනය කළා. මේ අඹ ඇටය රෝපණය කළ තැනම බුද්ධ අධිෂ්ඨාන බලයෙන් සියක් රියනක් උස ඇති, විශාල අඹ ගහක් ඒ මොහොතේම පැන නැඟුනා. මේ අතරට කොසොල් රජතුමා මේක දැනගෙන මේක ආරක්ෂා කරන්න සැලසුවා.

ආරක්ෂා නොදුන්නත්, ඒ අඹ ගහ කපන්න සමතෙක් නැහැ. තීර්ථකයෝ යනකොට අඹ ගහ පේන්න නැහැ. උදේ වරුවේ පිණ්ඩපාත කටයුතු නිමවා, සර්වඥයන් වහන්සේ ගන්ධ කුටියට වැඩමවා, සමවත් සුවයෙන් වැඩ ඉඳලා, මහජනයා එකතුවන අවස්ථාවේ දී නියමිත වේලාව සලකා පාත්‍ර චීවර ධරව, දැන් තව්තිසාවට වඩින ගමනක් බැවින්, ඒ වඩින ගමනට ගන්ධ කුටියෙන් පිටවීමට සූදානම් වන කොටම, ඉබේම පාත්‍රය අතට ආවා. ශ්‍රී පාදය දිගු කරන කොටම ගන්ධ කුටියේ දොර විවෘත වුණා. ගන්ධ කුටියෙන් පිටට වඩින කොටම හාත්පසින් බුදුරැස් විහිදෙන්න පටන් ගත්තා. ඒ අවස්ථාවේ දී අහස පුරා පියාසර කරන පක්ෂීහු බිමට බැහැලා නාද කළා. අශ්වයෝ හේෂාව කළා. ඇතුන් කුංචනාද කළා. මනුෂ්‍යයන් පැළඳි ආභරණ නාද කළා. මනුෂ්‍යයන්ගේ තූර්ය භාණ්ඩ තිබු තිබූ තැන්වලදීම ඉබේටම නාදවෙන්න පටන් ගත්තා. එදා ලක්ෂ කෝටි සංඛ්‍යාත පිරිසක් එක්කාසු වුණා මේ පෙළහර දකින්න.

ඒ කියන්නෙ දොළොස් යොදුනක් වට ප්‍රමාණය ඇති ප්‍රදේශයේ පිරුණා හැමතැනම සෙනඟ. අහස පුරා දෙව් දේවතාවන් රැස්වුණා.

සර්වඥයන් වහන්සේ මේ ගන්ඩබ්බ මූලයට වඩිනකොට, පේනතෙක් මානයේ ජනතාව එක්රොක් වෙලා සිටියා. මේ අතර පුදුම පෙළහරක් සිද්ධ වුණා තීර්ථකයන්ගේ මණ්ඩපයට. ඒ කියන්නේ සක්දෙව් රජ අණින් දිව්‍ය පුත්‍රයෝ කීප දෙනෙක් මේ පෙළහරට උදව් කළා තීර්ථකයන්ට.

පළමුවෙන්ම විශාල රස්නයක් (උණුසුමක්) ඇති කළා සූර්ය මණ්ඩලයෙන්. සූර්ය දිව්‍යරාජයාගේ විධානයෙන්. ඊළඟට සුළි සුළඟක් ඇති කෙරෙව්වා, මොවුන්ගේ මණ්ඩපය අහසට

ඔසවාගෙන ගියා. ඊගට විශාල වැසි බිඳු වැස්සෙව්වා, වස්ස වළාහක දෙවියෝ. දැන් මේ තීර්ථකයෝ තැන් තැන්වල භීතියෙන් පෙලීගෙන ඉන්න අතරට මේ සුළි සුළඟින් දූවිලි නැවිලා ඉන්න අතරට මේ වැහි බින්දුවලින් කබර ගැහිලා ඇඟවල් එහෙම පිටින්ම අවලක්ෂණ බවට පත්වෙලා. සීසීකඩ පැනල ගියා. නොයෙක් තැන පැන ගියා. ඔවුන් කිසිවෙකුට තථාගතයන් වහන්සේගේ බුදුරැස් මාලාවක්වත් දකින්න ලැබුණේ නැහැ. පූර්ණ කාශ්‍යපයා දුවගෙන ගියා අචිරවතී ගඟ දිහාවට. ඔහුගේ දායකයෙක් මුණගැසුණ ගොවියෙක් මඟදී, ඔහු අතේ තිබුණු ලණුවකුයි, වතුර ගෙන යන කළයකුයි දෙකක්. මේවා උදුරගෙන ගිහින් බෙල්ලේ බැඳගෙන ඒ තැනැත්තා, ගඟට පැනල ඒ කළේ බෙල්ලේ බැඳගෙන දියේ ගිලිලා පෙළහර පාලා අවීචි මහා නරකයට ගියා. මේ වාගේ පෙළහර පෑම නිමා වුණා ඔවුන්ගේ.

ඒ අතරට සර්වඥයන් වහන්සේ වඩින මේ විලාශය දුටුවා වූ දෙනෝ දහසක් දෙනා මහත් හඬින් සාධුකාර දීලා පිළිගත්තා. "සරණී" කියන අනාගාමී උපාසිකාවක් ඇවිල්ල වැඳලා කිව්ව, අනේ ස්වාමීනි, මේ දුර්ජන තිඝණ්ඨයින් පළවා හරින්න ඔබවහන්සේ වෙහෙසෙන්න එපා. මට අවසර දෙන්න, මම පෙළහර පාන්නම් කිව්වා. ඊළඟට චූල අනාථපිණ්ඩික සිටුවරයා ඇවිල්ල කිව්වා, ස්වාමීනි, වෙහෙසෙන්න එපා, මම පෙළහර පාන්නම්. එක්තරා හත් හැවිරිදි සාමණේරින් වහන්සේ නමක් ඇවිල්ල වැඳල කිව්ව, අනේ ස්වාමීනි, මම ළපටි වුණාට මේ තීර්ථකයන්ගේ මාන මර්දනය කරන්න මෙම පෙළහර පාන්නම්, අභිඤ්ඤාලාභී හත් හැවිරිදි සාමණේරී නමක් එසේ කිව්වේ.

චුන්ද කියල සත් හැවිරිදි සාමණේරයන් වහන්සේ නමක් වැඳල කිව්ව, අනේ ස්වාමීනි, මම පෙළහර පාන්නම්. ඊළඟට උත්පලවණ්ණා රහත් මෙහෙණින් වහන්සේ ඇවිල්ලා ආරාධනා කළා. මහමුගලන් රහතන් වහන්සේ ද ආරාධනා කළා. මේ හැමදෙනා ලවා තම තමන් පවත්වනු ලබන පෙළහර ගැන විස්තර මහජනයාට ඇහෙන්න සැලැස්වුවා. ඒ හැම දෙනාටම

ඒ ශක්තිය තිබෙන බව තථාගතයන් වහන්සේ ප්‍රකාශ කරලා අන්තිමට ප්‍රතිඥා දුන්නා. මේ පෙළහර පෑම ඔය හැමටම පුළුවනි. නමුත් මම අද පෙළහර පානවා කියලා උන්වහන්සේ ප්‍රතිඥා කරන කොට, සක්දෙව් රජතුමා හාත්පස විශාල සුදු වලාකුළුවලින් අහස පුරවල මුළු මහත් සක්වලවල නැත්නම් මහපොළොව තලයේ බටහිර දෙස සිට නැගෙනහිර දෙස දක්වා එකම ස්වර්ණමය වූ, සක්මන් මළුවක් මැව්වා. අහසේ මවා පෑවා. සර්වඥයන් වහන්සේ අහසට පැන නැග, මේ රුවන් සක්මනට ගොඩවී, නිර්මිත බුදුරුවක් මවා පෑවා. ඒ අතරින් තථාගතයන් වහන්සේ සක්මන් කරනවා. නිර්මිත බුදුරුව හිටගෙන හෝ වාඩි වී හෝ සයනගතව හෝ වැඩ ඉන්නවා.

සර්වඥයන් වහන්සේ වාඩි වී සිටින විට, නිර්මිත බුදුරජාණන් වහන්සේ සක්මන හෝ සිටීම හෝ සයනගතව සිටිනවා. එසේම සර්වඥයන් වහන්සේ වාඩි වී සිටින විට, නිර්මිත බුදුරජාණන් වහන්සේ වෙන ඉරියව් පවත්වනවා. එසේම නීල, පීත, ලෝහිත, ඕදාත, මාංජේෂ්ඨ, ප්‍රභාස්වර කියන ෂට්වර්ණ ඝණ බුදුරැස් ද විහිදුවනවා. සර්වඥයන් වහන්සේ ප්‍රශ්නයක් අහනවා, නිර්මිත බුදුරජාණන් වහන්සේ එයට පිළිතුරු දෙනවා.

නිර්මිත බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න අහනවා. සර්වඥයන් වහන්සේ පිළිතුරු දෙනවා. මේ විදියට දෙදෙනා වහන්සේ ප්‍රශ්න කිරීමත් යුගලයක්, ඉරියව්වත් යුගලයක් වශයෙන් සහ තමන් වහන්සේගේ ශ්‍රී දේහයෙහි නාභි මණ්ඩලයෙන් උඩ කොටසින්, අකනිටා බඹතලය දක්වා දස දහසක් සක්වලට පෙනෙන සේ ගිනිකඳ නිකුත් කළා.

නාභියෙන් යට ශරීර ප්‍රදේශයෙන් ජලකඳ නිකුත් කළා. එසේම යට කයෙන් ගිනිකඳ, උඩු කයෙන් ජලකඳ නිකුත් කළා. එසේම ශ්‍රී දේහයේ ඉදිරිපසින් ගිනිකඳ, පිටුපසින් ජලකඳ, නැවත පසු පසින් ජලකඳ, ඉදිරිපසින් ගිනිකඳ විහිදුවනවා.

දකුණු ඇසින් ගිනිකඳ, වම් ඇසින් ජලකඳ, නැවත වම් ඇසින් ගිනිකඳ, දකුණු ඇසින් ජලකඳ, නිකුත් කරනවා. දකුණු

කන් සිදුරින් ගිනිකඳ, වම් කන්සිදුරින් ගිනිකඳ, දකුණු කන්සිදුරින් ගිනිකඳ විහිදුවනවා. දකුණු නාසිකා සිදුරින් ජලකඳ, වම් නාසිකා සිදුරින් ගිනිකඳ, නැවත වම් නාසිකා සිදුරින් ගිනිකඳ, දකුණු නාසිකා සිදුරින් ජලකඳ නිකුත් කරනවා.

දකුණු උරහිසෙන් ගිනිකඳ, වම් උරහිසෙන් ජලකඳ, වම් පාර්ශ්වයෙන් ගිනිකඳ, දකුණු පාර්ශ්වයෙන් ජලකඳ විහිදුවනවා.

දකුණු ශ්‍රී පාදයෙන් ගිනිකඳ, වම් ශ්‍රී පාදයෙන් ජලකඳ, වම් ශ්‍රීපාදයෙන් ගිනිකඳ, දකුණු ශ්‍රී පාදයෙන් ජලකඳ එසේම දෑතේ සහ දෙපාවල එක එක ඇඟිලි අඟින් ගිනිකඳ, ඇඟිලි අතරින් අතර ජලකඳ, නැවත ඇඟිලි අතරින් ගිනිකඳ, ඇඟිලි අඟින්, අගින් ජලකඳ, එසේම ශ්‍රී දේහයෙහි නව අනූදහසක් රෝම කූපයන් තියෙනවා නම්, ඒ එක එක රෝමයකින් ගිනිකඳ, රෝම කූපයකින් රෝම කූපයකින් ජලකඳ, මේ විදියට පුදුමාකාර ආශ්චර්ය්‍ය ජනක ප්‍රාතිහාර්යයක් පා වදාළා.

මේ ප්‍රාතිහාර්ය පාමින් ම සර්වඥයන් වහන්සේ ප්‍රශ්න කරනවා, නිර්මිත බුදුරුව පිළිතුරු දෙනවා. නැවත නිර්මිත බුද්ධ රූපය ප්‍රශ්න කරනවා. තමන් වහන්සේ පිළිතුරු දෙනවා. එසේම ඉරියව් මාරු කරනවා. සවණක් ඝණ බුදුරැස් විහිදුවනවා. මේ සියල්ල සිදු කරන්නේ ඉතා ආශ්චර්ය විලාසයෙන්. මෙය දුටුවා වූ විසි කෝටියක් දෙනා මාර්ගඵල නිවන් අවබෝධ කළා. මේ පෙළහර දැකල අනේ මටත් බුදුබව ලැබේවා! කියල නොපැතූ පෘථුජ්ජන කෙනෙක් නෑ. ඒ සා විශාල පිරිසේ ඒ තරමට චිත්ත ප්‍රසාදය ඇති වුණා. මෙන්න මේ විදියේ මෙම යමක ප්‍රාතිහාර්ය තුන්වන වරටයි පැවැත්වුණේ. ගන්ධබ්බ රුක්බමූලයේ දී තීර්ථකයන්ගේ මානය මර්දනය කරනු පිණිස, තවත් යමක ප්‍රාතිහාර්යයන් පාල තියෙනවා විශාලා මහනුවර පාඨක සමාගමේ දී.

පරිනිර්වාණයෙන් පසුව යමාමහ පෙළහර පෑම සිදුවුණේ, ශ්‍රී ලංකාවේ බුද්ධ අධිෂ්ඨාන බලයෙන් ථූපාරාම චෛත්‍යය රාජයාණන් වහන්සේ තුළ. දකුණු අකුධාතුන් වහන්සේ නිදන් කරන උත්සවයේ දී. ඒ ධාතුන් වහන්සේ අහසට පැන නැඟී

යමාමහ පෙළහර පෑම සිද්ධ වුණා.

නැවත රුවන්වැලි චෛත්‍ය රාජයාණන් වහන්සේ තුල ද්‍රෝණයක් සර්වඥ ධාතූන් නිධන් කරන උත්සවයේ දී, එලෙසින් ම නිර්මිත බුදුරුවක් මැවී මේ සක්වලටම පෙනෙන හැටියට යමාමහ පෙළහර පෑම සිද්ධ වුණා. ඒ අතුරින් ථූපාරාම චෛත්‍යයේ පැවැත්වූ ප්‍රාතිහාර්යයෙන් සිංහල කුල දරුවෝ තිස් දාහක් දෙනා පැවිදි වී සිව්පිළිසිඹියා ඤාණලාභීව අර්හත්වයට පත් වුණා.

රුවන්වැලි චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ධාතු නිධාන දවසේ දී, දැක්වූ ප්‍රාතිහාර්ය දැකල දෙවියන්, බ්‍රහ්මයන්, මනුෂ්‍යයන් අතුරින් දොළොස් කෝටියක් දෙනා සිව්පිළිසිඹියා ඤාණලාභීව අර්හත්වයට පත්වුණා.

මේ විදියේ ප්‍රාතිහාර්යයන් අවස්ථා පහක දී පවත්වා ඇති බව සඳහන්ව තිබෙනවා. ජීවමාන කාලයේ දී අවස්ථා තුනයි. පිරිනිවන් පෑමෙන් පසු අවස්ථා දෙකයි. සියල්ල පහයි.

දැන් මේ මාතෘකා කළ සූත්‍ර පාඨයේ තේරුම, බොහෝ සෙයින් කියවුණා (සඳහන් වුනා)

**කතමං තථාගතස්ස යමකපාටිහීරේ ඤාණං**

සර්වඥයන් වහන්සේගේ, යමාමහ පෙළහර පෑමේ ඤාණය නම් කුමක් ද?

ඉධ තථාගතෝ යමකපාටිහීරං කරෝති අසාධාරණං සාවකේහි

මේ බුද්ධ ශාසනයේ, සර්වඥයන් වහන්සේ, ශ්‍රාවකයන් හට සාධාරණ නොවන යමාමහ පෙළහර පෑම සිදු කරනවා.

**උපරිමකායතෝ අග්ගික්ඛන්ධෝ පවත්තති.**
**හෙට්ඨිමකායතෝ උදකධාරා පවත්තති.**

නාභියෙන් උඩ උඩුකයෙන් ගිනිකඳ නිකුත් කරනවා. යටි කයෙන් ජලකඳ නිකුත් කරනවා. නැවත යටි කයෙන් ගිනිකඳ නිකුත් කරනවා. මෙහි විස්තර මුලින් සඳහන් වුණා. මේ අතර අපි සලකා බලන්න ඕනෑ කොහොමද මෙය සිද්ධ කරන්නෙ කියලා.

ඒ කියන්නේ සර්වඥයන් වහන්සේගේ සිතේ පවත්නා ආශ්චර්යයි. සාමාන්‍ය කෙනෙකුගේ ජවන් වීථි අතරට, භවාඞ්ග පතිත වෙනවානේ සිත. ඒ ගැන චිත්ත වීථියක් හඳුන්වන්න වෙනවා. දැන් අපි යම්කිසි චිත්ත වීථියක්, ජවන් වීථියක් පවත්වන වේලාවේ දී, අපි සිතමු, මනෝද්වාරික ජවන් වීථියක් දුවනව කියලා, යම්කිසි ධර්මාරම්මණයක් නිමිති කරගෙන. මනෝද්වාරාවජ්ජන චිත්තයට අනතුරුව ජවන් සිත් හතක් දුවනව. සමහර විට 2ක් ලැබෙන්නත් පුළුවන්. තදාරම්මණ සිත් එතකොට මින් අනතුරුව, ඊළඟ ජවන් වීථියක් පහළ වෙන්න භවාඞ්ග සිත් කෝටි ගණනක් යනව අපට. සාමාන්‍ය ජනතාවට. කොටින් කියනවා නම් අසුරු සැණක් ගහන කෙටි කාලෙදි, ඇසිපිය හෙලන තරම් කෙටි කාලෙදි, චිත්ත වාර කෝටි ලක්ෂයක් පහළ වෙනවා. එතකොට කොච්චර ඈතද ඊළඟ ජවන් චිත්තය පහළ වෙන්න. හැබැයි සිතේ තිබෙන චිත්තක්ෂණය බොහෝම කෙටියි. එනිසා අපට හිතෙනවා අපි මේ වේග වේගයෙන් සිතනව. වේග වේගයෙන් අපි කථා කරනවා කියලා. නැහැ. ඒක භවාඞ්ග වීථියක් අතරට ඊළඟ ජවන් වීථිය ලැබෙන්න ඉස්සරවෙලා භවාඞ්ග සිත් පෙළ කෝටි ලක්ෂ ගණන් සාමාන්‍ය ජනතාවට පහළ වෙනවා.

නමුත් සර්වඥයන් වහන්සේට එහෙම නොවෙයි. ජවන් වීථියකට අනතුරුවයි. ඊළඟ ජවන් වීථියට අතරේ, ලැබෙන්නේ භවාඞ්ග චිත්තක්ෂණ දෙකයි. මොන තරම් ශීඝ්‍රගාමී ද, සර්වඥයන් වහන්සේගේ මේ වීථි චිත්ත ප්‍රවාහය. එනිසා සර්වඥයන් වහන්සේට මෙබඳු වූ කටයුතු කිරීමේ දී, ශ්‍රාවකයන්ට කළ නොහැකි සේ මේ යමාමහ පෙළහර පා වදාරන්නට පුළුවන්.

අපි සලකා බලමු. සර්වඥයන් වහන්සේ කොහොමද ගිනිකඳ නිකුත් කරන්නේ? කොහොමද ජලකඳ නිකුත් කරන්නෙ? කියල. උන්වහන්සේ තේජෝ කසිණ සමාපත්තියට සමවදිනවා. තේජෝ කසිණ සමාපත්තියෙන් චතුත්ථ ධ්‍යානයට සමවදිනවා. ඉන් අනතුරුව ධ්‍යානාංග මෙනෙහි කරල, එයින් නැඟී සිට ඊළඟට ආවර්ජනා කරනවා. ඒ කියන්නේ දැන් මේ ධ්‍යානාංග අනුව චතුත්ථ

ධ්‍යානය තමන් ආවර්ජනය කරලා, ඉන්පසු පරිකර්ම කරනවා. පරිකර්ම කියන්නේ අධිෂ්ඨානයක්. ඒ කියන්නේ මීළඟට මාගේ උඩු කයෙන් ගිනිකඳ නිකුත් වේවා කියල අධිෂ්ඨාන කරල තමන් වහන්සේ නැවත තේජෝ කසිණ චතුත්ථ ධ්‍යානයට සමවදිනව. ඒ සමවදින කොටම, අභිඥා සිත එක චිත්තක්ෂණය යි, ඒ ඒක චිත්තක්ෂණය පහළ වෙන කොටම, මෙන්න උඩු කයෙන් ගිනිකඳ නිකුත් වෙනවා. වේලාසනින් අධිෂ්ඨාන කරනව දස දහසක් සක්වලට පෙනේවා කියල. ඒ අධිෂ්ඨානය පරිද්දෙන් උඩු කයෙන් ගිනිකඳ නිකුත් වෙනවා. ඊළඟට තමන් වහන්සේ ජලකඳ නිකුත් කරන්න ආපෝ කසිණ චතුත්ථ ධ්‍යාන සමාපත්තියට සමවදිනවා. ඉන් නැඟී සිට ධ්‍යානාංග සම්මර්ශනය කරල, නැවතත් චතුත්ථ ධ්‍යානයට සමවැදිලා, ඊළඟට පරිකර්ම සිතින්, ඒ කියන්නේ කාමාවචර සිතින් සිතනව, දැන් මාගේ යටි කයෙන් මෙතෙක් දුරට පෙනෙන සේ ජලකඳ නිකුත් වේවා කියල. මෙහෙම අධිෂ්ඨාන කරලා නැවත ආපෝ කසිණ චතුත්ථ ධ්‍යානයට සමවදිනවා. මෙයට සමවදින කොට එක චිත්තක්ෂණය යි. ඒ චිත්තක්ෂණය පහළ වෙන කොටම හැබැයි වේලාසනින් අධිෂ්ඨාන කරනවනේ මෙපමණ වේලාවක් පවතීවා කියල. එසේ වේලාවක් පවතීවා කියලයි අර අභිඥාවට සමවදින්නේ. එතකොට අභිඥාව එක චිත්තක්ෂණය වුනාට ඒ කලින් කළ අධිෂ්ඨානය පරිද්දෙන් ශ්‍රී දේහයේ යටි කයෙන් දස දහසක් සක්වලට පෙනෙන සේ ජලකඳ නිකුත් වෙනවා.

හැබැයි මේ ගින්නෙන් වත්, ජලයෙන් වත් කුරා කුඹියෙකුටවත් හිංසාවක් පීඩාවක් නෑ. ඒ විදිහේ පුදුම ප්‍රාතිහාර්යයක්. එතකොට ඒ අතරට නැවත වරක් යටිකයෙන් ගිනිකඳ, උඩුකයෙන් ජලකඳ නිකුත් කරනව. හරියට වේගය වැඩිකම නිසා දෙක එකට පෙනෙනවා. බලාගෙන ඉන්න අයට ගිනිකඳයි, ජලකඳයි දෙකම එකවර නිකුත් කරන ආකාරයෙන් තමයි මනුෂ්‍යයන්ට පෙනෙන්නේ. නමුත් මේක වාර හතරක් නේ.

උඩුකයෙන් ජලකඳ නිකුත් කරන්න වෙනම ධ්‍යාන
යටිකයෙන් ජලකඳ නිකුත් කරන්න වෙනම ධ්‍යාන
නැවත යටිකයෙන් ගිනිකඳ නිකුත් කරන්න වෙනම ධ්‍යාන
නැවත උඩුකයෙන් ජලකඳ නිකුත් කරන්න වෙනම ධ්‍යාන.

මොනතරම් ශීඝ්‍රයෙන් මේ අභිඥාවට සමවදින්න ඇද්ද. තමන් වහන්සේ නීල කසිණ සමාපත්ති චතුත්ථ ධ්‍යානයට සමවැදී, අර වගේම ධ්‍යානාංග සම්මර්ශනය කරල, ඊළඟට ශ්‍රී දේහයෙන් නීලවර්ණ රශ්මි විහිදුවනව.

ඒකත් කරන්නේ නීල කසිණ චතුත්ථ ධ්‍යාන අභිඥාවෙන්. එසේම පීත, ලෝහිත, ඕදාත, මාංජේෂ්ට, ප්‍රභාෂ්වර කියන මේ වර්ණ සියල්ලම වෙන වෙනම නිකුත් කරනව තමන් වහන්සේ අධිෂ්ඨාන කරමින්, එයින් පීත කසිණයට සමවැදීමෙන් පීත, වර්ණ කහපාට, ලෝහිත කසිණ සමාපත්ති ආනුභාවයෙන්, ලෝහිත වර්ණ රතුපාට, ඕදාත කසිණ චතුත්ථ ධ්‍යාන සමාපත්ති ආනුභාව බලයෙන් ඕදාත වර්ණ සුදුපාට, මදටිය වර්ණය, මිශ්‍ර වර්ණය, මේවා වෙන වෙනම අධිෂ්ඨාන කරමින්, ඒ කසිණ සමාපත්තිවලට සමවැදී ඉන් නැඟී අභිඥාවෙන් එම වර්ණයෙන් විහිදුවනව.

එසේම තමන් වහන්සේ ඉරියව් මාරු කිරීමත්, අර වගේම වෙන වෙනම ඉරියව් මාරු කරනව. නිර්මිත බුදුරජාණන් වහන්සේ මවන්නටත් වෙනම ම පඨවි කසිණ හෝ මේ සෑම තැනකදීම ඒ ඒ කසිණ ධ්‍යාන නැතහොත් චතුත්ථ ධ්‍යානයන්ට සමවදිමින්, ධ්‍යානාංග සම්මර්ශනය කරමින්, පරිකර්ම සිතින් අධිෂ්ඨාන කරමින්, අභිඥාවට සමවදිමින්, මෙසේ වෙන වෙනම කරන්නට ඕනෑ. එක වරම කරන්න බැහැ. දැන් මෙතැනදී අපට සලකා බලන්නට පුළුවන් මෙතැන තිබෙනවා මේ ගිනිකඳ නිකුත් කරන භූමි එකොළහක්.

ඒ කියන්නේ උඩුකය, යටිකය එක යුගලයක්. ඊළඟට ඉදිරි කය, පසුකය, තවත් යුගලයක්. දැන් දෙකයි. දකුණු ඇස, වම් ඇස, තුනයි. දකුණු කන් සිදුර, වම් කන් සිදුර හතරයි. නාසිකා සිදුරු දෙක, පහයි. උරහිස් දෙක, හයයි. දෑත, හතයි. දෙපස,

අටයි. දකුණු පාර්ශ්වය, වම් පාර්ශ්වය. නවයයි. ඇඟිලි සහ ඇඟිලි අග සහ ඇඟලි අතර, දහයයි. එක එක රෝම කූපයක් ගානේ, එකොළහයි. මේ විදියට මේ ස්ථානවලින් එකවරට මේ සියල්ලෙන් ගිනිකඳ, ජලකඳ නිකුත් කරනව වාගේ තමයි ලෝ වැසි ජනතාවට පෙනෙන්නේ.

සර්වඥයන් වහන්සේ ගිනිකඳ ජලකඳ යන සවණක් ඝන බුදුරැස් විහිදුවමින් ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා කරමින්, ඉරියව් මාරු කරමින්, පවත්වන මේ පෙළහර දුටුවා වූ, කවර නම් කෙනෙකුගේ චිත්ත ප්‍රසාදය ඇති නොවන්නේ ද?

එපමණක් නොවෙයි. ඒ ප්‍රාතිහාර්ය දැකීමේ දී තමාගේ සන්තානයේ නීවරණ ධර්ම යටපත් වෙලා සිත සමාධිගත භාවයට පත් වෙනවා. මේ ප්‍රාතිහාර්ය විලාශය දකින්ට දකින්ට තමාගේ සන්තානයේ පුදුමාකාර චිත්ත ප්‍රසාදය තුළින් සිත සමාධිගත වෙනවා. එයින් බුද්ධ ගුණය අරමුණු කර ගත්තා නම්, උපචාර සමාධියෙන් සිත සමාධිගත වෙනවා. ඒ අතරට මේ නිල්පාට, කහපාට, සුදු පාට, රතුපාට, මදටිය පාට යන පාට අරමුණු කළාම කසිණ ධ්‍යාන පහළ වෙනවා. කසිණ ධ්‍යාන අරමුණු කර ගත්තා නම්, අෂ්ට සමාපත්ති උපදවා ගන්නට පිහිට වෙනවා. හැකි වෙනවා.

මේ අතරට සර්වඥයන් වහන්සේ ධර්මදේශනා පවත්වනව නේ. තැනට සුදුසු පරිද්දෙන් ප්‍රශ්න කරමින්, තමන් ධර්ම දේශනා කරනවා. තමන් වහන්සේ ප්‍රකාශ කරමින්, නිර්මිත බුදුරුව ලවා ධර්මදේශනා කරනවා. මේ සියල්ලම කරන්නේ ධ්‍යාන මාර්ගඵල නිර්වාණාවබෝධයට උපනිශ්‍රය වන හැටියටයි. ඒ වේලාවේ දී චිත්ත සමාධිය, චිත්ත ඒකාග්‍රතාව ලබා ගන්න මහජනතාවට විපස්සනා ඥාණය පහළ වේවි. මේ තරම් විසිතුරු ප්‍රාතිහාර්ය මැද්දේ දැන් තමන් හරියට ධර්මය නමැති ජලාශයක ගිලීගෙන නේ ඉන්නේ. මේ බුදුරැස් දහරාව මැද්දෙන් ඔකඳ වෙමින් මේ සදහම් අමා විඳිමින්, හේතු සම්පත් ඇති උතුමන් මාර්ගඵල පිළිවෙළින් අමාමහ නිවන සාක්ෂාත් කර ගන්නවා.

මෙන්න මේකයි මේ යමාමහ පෙළහර පෑමේ බලාපොරොත්තුව. බුදු මහිමය දැක්වීම පමණක්ම නොව ඒ ඒ පුද්ගලයන්ට මාර්ගඵල නිවන අවබෝධ කරවමින් ප්‍රාතිහාර්ය සිද්ධ කරනු ලබන්නේ.

මෙන්න මේක නිසා ඒ යමාමහ පෙළහර පෑම සම්බන්ධව අපි සිහිකරන කොට, අපේ චිත්ත සන්තානවලටත් ඒ වාගේ ප්‍රාර්ථනා ඇති වෙන්න පුළුවන්.

අනේ අපිත් පෙර ජාති ජාතිත් පෙර බුදු සසුන්වල දී මේ වාගේ පෙළහර දැකල ඇති. සමහර විට ඒ කොතෙක් දැක්කත්, අපිට මාර්ගඵල නිවන් නොලැබුණේ ඒ අවස්ථාවට අපේ පාරමී ධර්මයන් සපුරාගෙන නොතිබුණ නිසයි. ඒ නිසා අපට මේ වාගේ බුදු සසුනක් ලැබුණා. මේ අවස්ථාවේ දී අපි කරන දාන, සීල, භවනා ප්‍රතිපත්ති ගුණධර්මයන්ගෙන් උපනිශ්‍රය ශක්තිය ලැබිල සවණක් ඝන බුදුරැස් දකිමින් ම යමාමහ පෙළහර පාන සර්වඥ උතුම් බුද්ධ විලාශය නුවණින් දකිමින්, අපටත් නිවන් සුව ලබන්නට යම් දවසක වාසනා ලැබේවා කියා ප්‍රාර්ථනා තබා ගනිමු.

එපමණක් නෙවෙයි අපි මේ සිදු කරන දාන, සීල, භාවනා කුසලානුභාවයන් ඒ යමාමහ පෙළහර පෑම වැනි ප්‍රතිහාර්ය පාමින් ලොවට සෙත සැලසූ ශාන්ති නායකයාණන් වහන්සේගේ ශාසනයේ ඒ සර්වඥයන් වහන්සේ විසින් දේශනා කළ සතර සතිපට්ඨානය, ආදි සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගෙන් ද, අපේ සන්තානවලත් ඒ ඉන්ද්‍රිය බල බොජ්ඣඞ්ග ධර්ම දියුණු කරමින්, ධ්‍යාන, අභිඥා, විපස්සනා, මාර්ගඵල පිළිවෙළින් ඒ ශාන්ති නායකයාණන් වහන්සේ විසින් අවබෝධ කොට වදාළ, ශාන්ති ලක්ෂණ අමාමහ නිර්වාණ ධාතුව අවබෝධ කර ගන්නට අප සැමදෙනාට ද අද අදම වාසනා වේවා කියා ප්‍රාර්ථනා පිහිටුවා ගනිමු.

සාදු! සාදු!! සාදු!!!

**යමක ප්‍රාතිහාර්යඥාණ ධර්ම දේශනාව නිමි.**

# 4. මහාකරුණා සමාපත්තිඤාණ ධර්ම දේශනය

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස*

දුක්ඛේ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ නිරෝධේ ඤාණං බුද්ධ ඤාණං
දුක්ඛ නිරෝධ ගාමිනිපටිපදාය ඤාණං බුද්ධ ඤාණං
අත්ථ පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
ධම්ම පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
නිරුත්ති පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
පටිභාන පටිසම්භිදේ ඤාණං බුද්ධ ඤාණං
ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඤාණං බුද්ධ ඤාණං
සත්තානං ආසයානුසයේ ඤාණං බුද්ධ ඤාණං
යමක පාටිහාරියේ ඤාණං බුද්ධ ඤාණං
මහාකරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං
සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං
අනාවරණ ඤාණං බුද්ධ ඤාණන්ති
ඉමානි චුද්දස බුද්ධ ඤාණානි, ඉමේසං
අට්ඨ ඤාණානි සාවක සාධාරණානි
ඡ ඤාණානි අසාධාරණානි සාවකේහීති.

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත් වූ, අර්හත් වූ, සම්‍යයක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේගේ සන්තානයෙහි පහළවන්නා වූ, චුද්දස බුද්ධ ඤාණයි ධර්ම දේශනාව සඳහා මාතෘකා කරන්න යෙදුනේ. මෙම දේශනය පටිසම්භිදාමග්ග පාලියෙහි, ඤාණ කථා නිර්දේශයෙහි සර්වඥතා ඤාණය විවරණය කරන තැන, ධර්මදේශනාධිපති සැරියුත් මහරහතන් වහන්සේ ප්‍රකාශ කළ සූත්‍ර පාඨයක්.

දුක්ඛේ ඤාණය, දුක්ඛ සමුදයේ ඤාණය, දුක්ඛ නිරෝධේ ඤාණය, දුක්ඛ නිරෝධ ගාමිනිපටිපදාය ඤාණය යන මේ හතරට කියනව ආයර්‍ය සත්‍ය ඤාණ කියලා.

අත්ථ පටිසම්භිදේ ඤාණය, ධම්ම පටිසම්භිදේ ඤාණය, නිරුත්ති පටිසම්භිදේ ඤාණය, පටිභාන පටිසම්භිදේ ඤාණය යන මේ ඤාණ හතරට කියනව ප්‍රතිසම්භිදා ඤාණ කියලා.

ඉන්ද්‍රියපරෝපරියත්තේ ඤාණය, සත්තානං ආසයානුසයේ ඤාණය, යමක පාටිහාරියේ ඤාණය, මහාකරුණා සමාපත්ති ඤාණය, සබ්බඤ්ඤුත ඤාණය, අනාවරණ ඤාණය යන හයට කියනව ෂට් අසාධාරණ ඤාණ කියලා.

මේ ඤාණ දාහතර ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේලාට ලැබෙන විශේෂ ඤාණ දාහතරක්. බුද්ධත්වය සංකේත කරන ඤාණ දාහතරක්, චුද්දස බුද්ධ ඤාණ, ඉමේසං අට්ඨ ඤාණානි සාවක සාධාරණානි, මේ ඤාණ දාහතර තුළින් සත්‍ය ඤාණ හතරත්, ප්‍රතිසම්භිදා ඤාණ හතරත්, යන අට ශ්‍රාවකයන් වහන්සේලාට ද ලැබෙනවා. ඡ ඤාණානි අසාධාරණානි සාවකේහි, අගින් තිබෙන ඤාණ හය ශ්‍රාවකයන් වහන්සේලාට නොලැබෙන, සර්වඥ සම්මා සම්බුදු රජාණන් වහන්සේලාට පමණක් ම ලැබෙන අසාධාරණ ඤාණ වෙනවා කියන එකයි සූත්‍ර පාඨයේ කෙටි තේරුම.

මේ දේශනාවේ සඳහන් වෙන ඤාණ දාහතර අතුරෙන් අසාධාරණ ඤාණයන්ට අයත් වන, හතරවන මහාකරුණා සමාපත්ති ඤාණය පිළිබඳවයි අද ධර්මදේශනාව පැවැත්වෙන්නේ. මහාකරුණා සමාපත්ති ඤාණය කියාපුවාම අපේ සන්තානවලට ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මැවී පෙනෙනව. ඒ කුමක් නිසාද?

දිනපතා සූවිසි කෝටි ලක්ෂ වාරයක් ලොවුතුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහාකරුණා සමාපත්තියට සමවදිනවා. භාග්‍යවතුන් වහන්සේගේ තිබුණ, පංචවිධ බුද්ධ කෘත්‍ය කියල දිනචරියාවක්. මේක සැමදාම අඛණ්ඩව පැවැත්වුවා. පංචවිධ

බුද්ධ කෘතියෙහි දවසේ අන්තිම පශ්චිම යාමය කොටස් තුනට බෙදාගෙන තිබුණා. රාත්‍රි දෙකේ සිට 3.20 දක්වා සක්මන් භාවනාව, 3.20 සිට 4.40 දක්වා සැතපී විවේක ගැනීම. 4.40 සිට ඉර උදාව දක්වා මහාකරුණා සමාපත්තියට දොළොස්කෝටි ලක්ෂ වාරයක් සමවැදීම. සෑම දවසේම මේ මහා කරුණා සමාපත්තියට සමවදිනවා. උදේ පාන්දර දොළොස්කෝටි ලක්ෂ වාරයක්, ඉන් අනතුරුව ඉන්ද්‍රිය පරෝපරිය, ආසය අනුසය ඤාණ දෙකෙන් දස දහසක් ලෝකධාතුව බලා වදාරනවා. ඒ ඤාණ දෙකට කියනව බුදු ඇස කියලා.

මඟඵල නිවන් ලබන්න හේතු සම්පත් ඇති අය ඒ බුදු ඇසට මැවී පෙනෙනව. මේ බුදු ඇසින් බලා, දවසේ වැඩ සටහන සනිටුහන් කරගන්නව. නැවත සන්ධ්‍යාවේ ධර්ම දේශනාවෙන් පසුව, බෞද්ධයන් විහාරස්ථානයෙන් පිටව ගියාට පසුව පැන්පහසු වෙලා, භික්ෂු සංඝයා විහාරස්ථානයට රැස්වන තුරු සන්ධ්‍යාවේ ද දොළොස් කෝටි ලක්ෂ වාරයක් මහා කරුණා සමාපත්තියට සමවදිනව. ඉන් අනතුරුව නැවතත් බුදු ඇසින් දස දහසක් ලෝකධාතුව බලා වදාරනවා. මේ විදියට දොළොස් කෝටි ලක්ෂ වාර ගණන් දිනකට දෙවාරයක්, සූවිසි කෝටි ලක්ෂ වාරයක් මහාකරුණා සමාපත්තියට සමවදිමින්, ලොව්තුරා සම්බුදු රජාණන් වහන්සේ අවුරුදු හතළිස් පහ මුළුල්ලේ ලෝකයාට ශාන්ත වැඩ සටහනක් පවත්වා වදාළා.

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සන්තානයේ තිබෙන කරුණාව, මහා කරුණාව නමින් හඳුන්වනවා. කරුණාව කියන්නේ කුමක් ද? කියන එක පළමුවෙන් තෝරාගන්ට ඕනෑ.

**පරදුක්ඛේ සති සාධුනං හදේ කම්පනං කරෝතීති කරුණා**

ඒ අර්ථ කථාවේ දැක්වෙන තේරුමක්. අනුන්ගේ දුකක් දුටු තැන, සත්පුරුෂයන්ගේ හදවත උණුවන ස්වභාවයට තියනවා කරුණාව කියලා. කිරිබොන දරුවෙක් ඉන්න අම්මා කෙනෙකු දරුවා හඬන වේලාවේ අම්මාට කිරි උණනවා. කිරි එරෙනවා. ඒ

කුමක් නිසාද? ඒ දරුවා දුකින් මුදා ගැනීමේ පරම කරුණාවෙන්. මනුෂ්‍යයන්ට පමණක් නොවෙයි. තිරිසන්ගත සතුන්ට පවා මේ තමන්ගේ දරුවන් ගැන පුදුම උණුවීමක් තිබෙනවා. එක දවසක් දඩයමේ ගිය වැද්දෙක්, වෙන දඩයමක් නැතිව කිරි පොවමින් සිටිය එළදෙනකට "තෙබකින් " දමා ගැසුවා. ඒ දෙනගේ හිතේ දරුවා කෙරෙහි තිබුන කරුණාව වේගය නිසා ඒ තෙබේ උල කැඩිල ගියා. තුවාලයක්වත් නොවී ඒ දෙනත්, වසු පැටියත්, ආරක්ෂා වුණා. මේක විසුද්ධි මාර්ග අට්ඨකථාවේ දක්වල තිබෙන්නේ. ඒ කිරි දෙනගේ සිතේ තිබුණ මෛත්‍රියත්, කරුණාවත් නිසා. ඒ ආයුධය ශරීරගත නොවී ගියා.

මේ තරම් තිරිසන්ගත සතුන්ට පවා තමන්ගේ පැටවුන් කෙරෙහි බලවත් උණුවීමක්, කරුණාවක්, මෛත්‍රියක් තියෙනවා. ඒ වාගේ තමයි සෑම සත්වයන් වෙත දුකට පත් වූ සත්වයන් වෙත අනුන්ගේ හිතේ උණුවෙන ස්වභාවයක්, අනුන්ගේ හිතේ ඇතිවන අනුකම්පා ස්වභාවයක් වෙයි නම්, මේකට කියනව කරුණාව කියලා.

**කීනාතිවා පරදුක්ඛං හිංසතීතිවා කරුණා**

තවත් තේරුමකින් කරුණාව හඳුන්වනවා. අනුන්ගේ දුක නසන්නෙමුයි, කරුණාව නම් වේ. අනුන්ගේ දුක නසන ආකාරයෙනුයි හිතේ කරුණාව පහළ වෙන්නේ.

**කිරියතිවා දුක්ඛිතේසු ඵරණවසේන පසාරි යතීති කරුණා**

දුක්ඛිත සත්වයන් වෙත, මෛත්‍රිය වඩන්නාක් මෙන් වඩන බැවින් ද, කරුණාව කියල හඳුන්වනවා. මෙන්න මේ කරුණා කියන අකුරු තුනේ වචනයේ තේරුම අට්ඨ කථාවල හඳුන්වල තිබෙනවා. පනස් දෙකක් වූ චෛතසිකයන් අතුරින්, කරුණාව අයිති වෙන්නේ, සෝභන චෛතසික රාශියටයි. ඒ අතුරෙන් දෙකක් තිබෙනවා අප්පමඤ්ඤා කියලා. "කරුණා සහ මුදිතා" එයින් ඒ කරුණා චෛතසිකය ශෝභන චෛතසිකයක්. මේ කරුණා චෛතසිකය සිතේ පහළ වෙන්නේ සත්පුරුෂයන්ගේ

සන්තානවලයි. ඒ සත්පුරුෂයන්ගේ සිත්වල පහළ වන කරුණාවෙන්, තමන් දුකින් මිදී, අන් අය දුකින් මුදවා ගැනීමේ ආකාරයෙනුයි පවතින්නේ කරුණාව. එයින් ලෝක සත්වයන් වෙත පවත්වන කරුණාව අතුරෙන්,

කෝටියක් මව්වරුන්ගේ කරුණාවට වඩා,

කෝටියක් පියවරුන්ගේ කරුණාවට වඩා,

කෝටියක් බ්‍රහ්මයන්ගේ කරුණාවට වඩා,

කෝටියක් දෙවියන්ගේ කරුණාවට වඩා,

ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ කරුණාව පිහිටා තිබෙනවා. පැතිරීම් වශයෙන් විශාල බැවිනුත්, සන්තාන වශයෙන් විශාල බැවිනුත්, භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ සන්තානයේ පහළවන කරුණාවට කියනව "මහා කරුණාව" කියලා.

සැබැවින් ම මේ කරුණාව නිසයි ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේලා ලොව පහළ වෙන්නේ.

දීපංකර පාදමූලයේ දී, අනිච්චාවත සංඛාරා කියන ගාථාව වැනි සතර පද ගාථා මාත්‍රයක් ඇසූ කෙණෙහි, සිව්පිළිසිඹියා ඤාණ සහිතව මහා රහත් භාවයට පත් වීමේ භාග්‍යය සුමේධ තාපසයන් වහන්සේට තිබුණා. එදා උන්වහන්සේ කල්පනා කළා,

**කිම්මේ ඒකේන තිණ්ණේන පුරිසේන ථාම දස්සිනා**
**සබ්බඤ්ඤුතං පාපුණිත්වා තාරෙම් ජනතං බහුං**

එක්කෙනෙක් වූ මම, මේ දුකෙන් මිදීමේ ඇති තේරුම කුමක් ද? දෙවියන් සහිත ලෝකයා ද දුකෙන් මුදවන්නට මම මතු බුදුවෙම්වා කියලා උන්වහන්සේගේ සිතේ කරුණාව පහළ වුණා. එදා උන්වහන්සේ,

**මනුස්සත්තං ලිඞ්ගසම්පත්තිං හේතු සත්ථාරදස්සනං**
**පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරෝ ච ඡන්දතා,**
**අට්ඨධම්මසමෝධානා අභිනීහාරෝ සමිජ්ඣති**

1. මිනිසත් බව, 2. පුරුෂ ආත්මභාවය, 3. රහත්වීමේ හේතු සම්පත්තිය, 4. ශාස්තෘන් වහන්සේ නමක් දැකීම, 5. පැවිදි වී

සිටීම, 6. ධ්‍යාන අභිඥ්ඥාලාභීව සිටීම, 7. ජීවිත පූජාවෙන් බුද්ධ පූජාවක් පැවැත්වීම සහ 8. බුද්ධත්වය ලැබීමේ දැඩි ඡන්දතාවය කියන කරුණු අට සම්පූර්ණ වීමෙන් එදා බුද්ධ රාජ්‍යය පිණිස පියවර තැබුවේ, අනන්ත අපරිමාණ ලෝක සත්වයා වෙත පතළ මහා කරුණාවෙන්, මේ අෂ්ඨ ධර්ම සමවධානයෙන් එදා නියත විවරණ ලබා ගත් මහා බෝධි සත්වයන් වහන්සේ, දාන පාරමිතා, දාන උප පාරමිතා, දාන පරමත්ථ පාරමිතා යනාදි පිළිවෙළින් සමත්‍රිංසත් පාරමී ධර්මයන් පුරා වදාළේ මහා කරුණාවෙන්, පංච මහා පරිත්‍යාග ත්‍රිවිධ අර්ථ චර්යා පිරුවේ මහා කරුණාවෙන්.

**සෝ සාගරේ ජලධිකං රුධිරං අදාසි**
**භූමිං පරාජිය සමං සමදාසි දානං**
**මේරුප්පමාණාමධිකඤ්ච සමෝලිසීසං**
**ඛෙ තාරකාදිකතරං නයනං අදාසි.**

අහසේ තරු කැටවලට වඩා නෙත් දන් දුන්නා, මහා කරුණාවෙන්, මහ පොළොවේ පාංශුවලට වඩා ශරීර මාංශය දන් දුන්නා මහා කරුණාවෙන්, මහාමේරු පර්වතයට වඩා උස්වන තරම් හිස දන් දුන්නා මහා කරුණාවෙන්, වෙසතුරු අත්බවේ පිහිටා ඇලිඇතා දන් දුන්නේ, මහා කරුණාවෙන්, සත්ත සතික මහා දානය දුන්නේ මහා කරුණාවෙන්, රාජ්‍යය පරිත්‍යාග කළේ මහා කරුණාවෙන්, නෙත් දෙක වැනි දරු දෙදෙනා දන් දුන්නේ මහා කරුණාවෙන්, සත් වාරයක් මහා පෘථිවියට දරා ගන්නට බැරිව පොළොව කම්පා වුණේ මහා බෝධිසත්වයන් වහන්සේගේ මහාකරුණා බල මහිමය නිසා, පිරූ පාරමී ධර්ම ආනුභාවයෙන්.

මේ අයුරින් විසි අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ අතරක් නැර, පිරූ පාරමී බලෙන් බෝමුල අරා වැඩ ඉඳගෙන, සපරිවාර මාර පරාජය කොට සවාසනා සකලක්ලේශයන් සෝදා හැර, දසබල ඥාණ, චතුර් වෛශාරද්‍ය ඥාණ, ආදි අනන්ත ඥාණ ධාතු සම්භාරයක් පරිවාර කොට ඇතිව, සර්වඥතා ඥාණය ප්‍රතිලාභ කොට වදාළේ මහා කරුණාවේ ආනුභාවයෙන්, උන් වහන්සේ අවුරුදු හතළිස් පහක් මුළුල්ලේ ලොවට සැලසූ මහා

කරුණා සේවය අසීමිතයි. මේ රජගෙදර ය, මේ දුප්පත් පැල්පත ය, කියල වෙනසක් නැතිව දෙවියන් සහිත, මනුෂ්‍යයන් සහිත සමස්ත ලෝකයා වෙත පතළ මහා කරුණාවෙන් අහසේ දිස්වෙන පුන්සඳ මඬල ගෙම්දුලක් පාසා පෙනී යන්නාක් මෙන්, මුළු මහත් ජම්බුද්වීප තලය සිසාරා වැඩම කරමින්, චාරිකාවේ යෙදෙමින්, දුගී මගී අසරණ අනාථයින්ටත්, රජ දරුවන්ටත්, දෙවියන්ටත්, බ්‍රහ්මයන්ටත්, සදේවක ලෝකවාසීන්ටත්, ධර්ම සේවයක් සලසා වදාළේ මහා කරුණාවෙන්.

නරකාදියට වැඩම කරල, ගිනි නිවල, මොහොතක් ඔවුන්ට දර්ශනය වෙලා, ඔවුන්ට කුසල් සිත් පහළ වෙන්නට සැලැස්සුවේ මහා කරුණාවෙන්. සෝපාක, සුනීත වැනි අසරණයින්ට පිහිට වුණේ මහා කරුණාවෙන්. අංගුලිමාල වැනි දාමරිකයන්ට පිහිට වුණේ මහා කරුණාවෙන්. බකබ්‍රහ්ම ශක්‍රයා වැනි අයට පිහිට වුණේ මහා කරුණාවෙන්. සෝණදණ්ඩ, කූටදණ්ඩ ආදි බ්‍රාහ්මණයන්ට පිහිට වුණේ මහාකරුණාවෙන්. පටාචාරා, රජ්ජුමාලා වැනි විපතට පත් වූවන්ට පිහිට වුණේ මහා කරුණාවෙන්. ඒ සර්වඥයන් වහන්සේ සෑම දවසේ ම මේ මහා කරුණා සමාපත්තියට සමවැදිලා, ලෝකය දෙස බුදු ඇසින් බලා ලෝ වැඩ සලසා වදාළේ, මහා කරුණාවෙන්.

**බෝධනෙය්‍යං ජනං දිස්වා සතසහස්සේපි යෝජනේ**
**ඛණේන උපගන්ත්වාන බෝධේතිතං මහාමුනි.**

බුදු ඇසින් බලා, යොදුන් ලක්ෂයක්, කෝටියක් ඈත හරි යම් කෙනෙක් මඟඵල නිවන් ලබන්නට සමතෙක් ඉන්නවා නම්, හේතු සම්පත් ඇති කෙනෙක් දැක්කා නම්, ක්ෂණයකින් එම ස්ථානයට වැඩම කරලා, ඔවුන්ට ධර්ම දේශනා කරල අමාමහ නිවන් අවබෝධ කරනවා.

අවුරුද්දට මාස තුනක් පමණ එක්තැන්ව වස් වසල, වස් පැවරුනායින් පසුව, නව මාසයක් ගමින් ගම, නගරයෙන් නගරය, ජනපදයෙන් ජනපදය, රටින් රට වඩිමින් ලෝකයාට සැලසූ කරුණා සේවය අසීමිතයි. මේ විදියට අවුරුදු හතළිස්

පහක් මුළුල්ලේ පැවැත්වූ උදාර මහා කරුණා සේවය නිසා, මහා සමාගම් විසිහතරක දී ම, සූවිසි අසංඛෙය්‍යයක් ජනතාව අමාමහ නිවනට පත්වුණා. අනාගතය බලා වදාළ සර්වඥයන් වහන්සේ, මහා කරුණාවෙන් ම, සුවාසූ දහසක් ධර්ම ස්කන්ධය දේශනා කොට වදාළා. අන්තිම වරටත් පරිනිර්වාණ මංචකයේ වැඩ හිඳගෙන මහා කරුණාවෙන් මහාසංඝයාට අවවාද දීලා, උන්වහන්සේ අපුනර්භව සංඛ්‍යාත අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් අමාමහ නිවන් පුර වැඩියහ.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ කරුණා ගුණය සිහිපත් කරන, සිහිපත් කරන වාරයක් පාසා දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කිරීමට අපට භක්තිය, ආදරය, ගෞරවය පහළ වන්නේ, උන් වහන්සේ පැවැත්වූ කරුණා සේවයේ තිබෙන උදාරත්වය නිසයි. ඒ නිසා අපි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පැවැත්වූ මහා කරුණා සමාපත්තිය සිහිපත් කරමින් සැමදාම අලුයම් කාලයේ මොහොතක් කරුණා භාවනාව වඩන්නට පුරුදු වෙන්ට ඕනෑ. ඒ කරුණා භාවනාව වැඩීමෙන් අපටත් කවදා හරි මහා කාරුණික වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ කරුණාවෙන් දේශනා කළ සතර මග, සතර ඵල පිළිවෙළින් සිදුවන ශාන්ත අමාමහ නිවන සාදා ගැනීමට ඒකාන්තයෙන් වාසනාවන්ත වෙනවා.

මාතෘකා කරන්නට යෙදුන සූත්‍ර පාඨය තුළින් ෂට් අසාධාරණ ඤාණ අතර හතර වැන්න වූ, මහා කරුණා සමාපත්ති ඤාණය සාරිපුත්ත මහරහතන් වහන්සේ ඉතා විස්තරාත්මකව පටිසම්භිදාමග්ග පාළියේ දේශනා කරල තියෙනවා. කරුණු 89ක් වශයෙන් දක්වා ඇති මේ මහා කරුණා සමාපත්ති ඤාණය මෙසේ විස්තර වෙනවා.

**කතමං තථාගතස්ස මහාකරුණා සමාපත්තියා ඤාණං**

තථාගතයන් වහන්සේගේ, මහාකරුණා සමාපත්ති ඥාණය නම් කවරේද?

**බහුකේහි ආකාරේහි පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තේසු මහාකරුණා ඔක්කමති.**

බොහෝ ආකාරයෙන් මෙනෙහි කරන්නා වූ, භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට සත්වයන් කෙරෙහි මහාකරුණාව පහළ වෙනව.

**ආදිත්තෝ ලෝකසන්නිවාසෝ'ති පස්සන්තානං බුද්ධානං භගවන්තානං සත්තේසු මහාකරුණා ඔක්කමති.**

මෙන්න පළමුවන මහා කරුණා සමාපත්තියට සම වැදීමේ අරමුණ, ආදිත්තෝ ලෝක සන්නිවාසෝ.

ලෝක සන්නිවාස කියන්නේ, මෙතැන ලෝක සත්වයාට නමක්, ලෝක කියන්නේ කවුද? කුමක් ද?

**පච්චයේහි, සංකරියති, ලුජ්ජති, පලුජ්ජතීති, ලෝකෝ.**

හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් වන, හේතු ප්‍රත්‍යයන්ගේ ශක්තියෙන් ම කැඩි කැඩී, බිඳි බිඳී, නැති වෙවී යන සංස්කාර රාසියට කියනව ලෝකය කියලා. ඒ මේ ලෝකයට ම අයත් බැවින්, සියලුම සත්වයෝ ද, පුද්ගලයෝ ද, ලෝක සන්නිවාස නමින් හඳුන්වනව. ඒ මේ ලෝක සත්වයා ආදිත්තෝ, ගින්නෙන් දැවෙනවා. මේ ලෝක සත්වයා ගින්නෙන් දැවෙනවා. මේ ගින්න නිවන්නට මා හැර කවුද වෙන ඉන්නේ. මේ ගින්න නිවන්න මා ඉදිරිපත් විය යුතුයි කියල මහාකරුණා සමාපත්තියට සමවදිනවා.

**උයයුත්තෝ ලෝකසන්නිවාසෝ**

මේ ලෝක සන්නිවාස හෙවත්, ලෝක සත්වයා, නිරන්තරයෙන් අතරක් නැර දුකක් විඳීමේ පීඩාවකින් ඉන්නව. උයයුත්තෝ කියන්නේ, උත්සහයකින් නිතර දුකට පිළියම් කරනව. උදේ අවදි වූ තැන් පටන්, නැවත නින්දට යන තුරු නිරන්තරයෙන් ම

මේ දුකට පිළියම් කිරීමේ විශාල ව්‍යායාමයක යෙදී සිටිනවා. " දවල් කාලේ ගිනිගෙන දිලිසෙනවා. රාත්‍රි කාලේ දුමනව" කියල "තුඹසක්" ගැන පින්වතුන් අහල ඇති.

රාත්‍රි කාලයේ දුම දානවා කියන්නේ. හෙට කෙරෙන්න තියෙන වැඩ ගැන නිතරම විතර්ක කරනවා, රාත්‍රි කාලේ. උදේ අවදි වූ තැන් පටන් ඒ විතර්ක කළා වූ කරුණු සම්බන්ධව, මහත් වෙහෙසෙන්, ආයාසයෙන්, උත්සාහයෙන්, දවස ගෙවනව. දුකට පිළියම් කරනව, දත් මදිනව, මුහුණ සෝදනව, ඇඳුම් අඳිනව, ශරීර ප්‍රතිජග්ගන කරනව, වතුර නානවා, තේ පැන් හදනවා, කෑම බීම උයනවා, පිහනවා, ලිප ගිනි මොලවනවා, මිදුල් අමදිනවා, ඇඳුම් සෝදනවා, හරක් බලනවා, ගොවිතැන් කරනවා, වෙළඳම් කරනවා, බර උස්සන්නට යනවා, වාහන පදවන්න යනවා, දවස පුරාම මේ කරන කටයුතු මොනවාද? ක්‍රීඩා පිටියකට ගියත්, එය මහත් උත්සාහයෙන් දුකට පිළියම් කිරීමක් නේ ද?

දවස පුරාම අර ගිනි ඇවිලගෙන දිලිසෙනවා වගේ දුකට පිළියම් කිරීම නේද? කරන්නේ. දුකට පිළියම් කිරීමේ විශාල ව්‍යායාමයක මේ සත්වයා වැටී සිටිනවා. අහෝ මේ සත්වයාගේ මේ දුකට පිහිට වෙන්නට වෙන කවුද ඉන්නේ. වෙන කිසිවකු නැති බැවින් මම පිහිට වෙන්නට ඕනෑ කියල ලොවුතුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහා කරුණාවට සමවදිනවා.

**පයාතෝ ලෝකසන්නිවාසෝ,** මේ ලෝක සත්වයා නිරන්තරයෙන් ජරාමරණයන්ට පවරල තියෙනවා. උපන් දා පටන් ජරාමරණයන්ට පවරල තියෙනවා. හරියට මරණ සහතිකයක් වගේ. බලවත් රාජ අපරාධකාරයෙකු හට, අසවල් දවසේ අසවල් තැනදී අසවල් විනාඩියට එල්ලා මරන්නට ඕනෑ කියල නියමයක් කරල තියෙන්නා වගේ, මේ ලෝක සත්වයා උපන් දා පටන් ජරාවට මරණයට කැප වෙලා ඉන්නවා. ජරාවට මරණයට හිමිකාරයෙක් වෙලා ඉන්නවා.

මෙන්න මේ කරුණ ගැන සිතන කොට ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේට මහාකරුණාව පහළ වෙනවා.

**කුම්මග්ග පටිපන්නෝ ලෝකසන්නිවාසෝ .....**

මේ ලෝක සත්වයා වැරදි මාර්ගයකට පිළිපැද ගමන් කරනවා. නිවන් මඟට යන මාර්ගයේ ගමන් කරන්නේ නැහැ. නරකාදියට යන මාර්ගයේ ගමන් කරනවා. තිරිසන් අපායට යන මාර්ගයේ ගමන් කරනවා. ප්‍රේත අපායට යන මාර්ගයේ ගමන් කරනවා. පිට සක්වලට යන මාර්ගයේ ගමන් කරනවා. මිනිසත් බවට යන මාර්ගයේ ගමන් කරනවා. ඉතා ටික දෙනෙක් දේවත්වයට යන මාර්ගයේ ගමන් කරනවා.

මිථ්‍යා දෘෂ්ටි, මිථ්‍යා සංකප්පාදි වූ මිථ්‍යා මාර්ගයේ ම ගමන් කරනවා. අවවාදයක් කළත් ඒක නොමඟින් තමයි පිළිගන්නේ. නිවැරදි මාර්ගයෙන් නෙවෙයි පිළිගන්නේ. බණක් ඇසුවත් ඒ බණ දේශනයේ වැරදි පැත්තක් තමයි බලන්නේ. හොඳ පැත්ත බලන්නේ නැති තත්වයෙන් ජීවත් වෙනවා.

ගොවිතැනක් කළත් වැරදි ලෙස ගොවිතැන් කරනවා. වෙළඳාමක් කළත් වැරදි ලෙස වෙළඳාම් කරනවා. රැකියාවක් කළත් වැරදි ලෙස රැකියාව කරනවා. ජීවත්වීම සම්පූර්ණයෙන් ම අධර්ම ජීවිකාවකට හරවාරගෙන ජීවත් වෙනවා. මෙන්න වැරදි මාර්ගයේ ගමන් කිරීම.

මේ නිසා ලෝක සත්වයා ජරාමරණාදී දුකෙන් පෙළනවා. මේ සත්වයා වැරදි මාර්ගයෙන් ගොඩ ගෙන, නිවැරදි මාර්ගයට යවන්නට මා ඉදිරිපත් විය යුතු යයි කියා ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ, මහාකරුණා සමාපත්තියට සමවදිනවා.

**උපනීයති ලෝකෝ අද්ධුවෝ ........**

මේ ලෝක සත්වයා උපන් දා පටන්, ජරා මරණ වෙත ඇදීගෙන යනවා. උපනීයති කියන්නේ පමුණුවනු ලබනවා. වධකස්ථානයට ගෙන යන හරකෙකු තබන තබන පියවරක් පාසා වධක ස්ථානයට සමීප වෙන්නා වගේ, එසේම මරන්නට නියම වූ වරදකරුවෙකු තබන තබන පියවරක් පාසා ඔහුගේ මරණයට සමීප වෙන්නා වාගේ, ළඟා වෙන්නා වාගේ, උපන් දා

පටන් අවුරුද්දෙන් අවුරුද්ද, මාසයෙන් මාසය, සතියෙන් සතිය, පැයෙන් පැය, විනාඩියෙන් විනාඩිය, තත්පරයෙන් තත්පරය, චිත්තක්ෂණයෙන් චිත්තක්ෂණය, මේ ආත්මභාවය ජරා, මරණ වෙත ඇදීගෙන යනවා. උදේ උදා වූ සූර්ය මණ්ඩලය මොහොතක් එක තැන නොසිට, පැය දොළහක් ඇතුළත අස්තයෙන් අස්තයට බැසගෙන යනවා. අවරට යනවා. මේ වාගේ සෑම සත්වයෙක් ම ජරා මරණ වෙත ඇදීගෙන යනවා. මේ සත්වයා හට මා හැර වෙන කෙනෙක් නැහැ නේ ද පිහිට වෙන්ට කියා ලොවුතුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහාකරුණා සමාපත්තියට සමවදිනවා.

**අතාණෝ ලෝකෝ අනභිස්සරෝ .....**

මේ ලෝක සත්වයා තමාගේ යැයි කියන ලද සියල්ල හැර දාල අනාථව පරලොව යනව. හරිහම්බ කළ වස්තුවත් මගේ මගේ කියමින් හදාවඩා ගත්ත මේ ශරීර කූඩුවත් මහ පොළොව මත හැර දාල, අනාථව පරලොව යන්න සිදුවෙනවා. මේ බව සලකා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහාකරුණා සමවතට සමවදිනවා.

**ඌනෝලෝකෝ අතිත්තෝ තණ්හාදාසෝ ති .....**

මේ ලෝක සත්වයා සැමදාම, නොපිරුණු කළයක් වාගේ තෘෂ්ණාවෙන් සෑහීමකට පත් නොවී අතෘප්තිකර ජීවිතයක් ගෙවනවා. තෘෂ්ණාවට වහල් වෙලා ජීවත් වෙනවා. මොවුන්ට මා හැර වෙන කෙනෙක් පිහිට වෙන්නෙ නෑ කියලා මෙනෙහි කරමින් මහාකරුණා සමවතට සමවදිනවා.

රට්ඨපාල මහරහතන් වහන්සේගෙන් කෝරව්‍ය මහරජතුමා ප්‍රශ්න හතරක් ඇසුව. ඒ ප්‍රශ්න හතරට රට්ඨපාල මහරහතන් වහන්සේ දුන්න පිළිතුරු හතරත් මෙන්න මේ දහම් කරුණු හතරයි.

**උපනීයති ලෝකෝ අද්ධුවෝ - අතාණෝ ලොකෝ අනභිස්සරෝ**

**අස්සකෝ ලෝකෝ සබ්බං පහාය ගමනීයං - ඌනෝලෝකෝ අතිත්තෝ තණ්හාදාසෝ ති.**

මේ දහම් පද හතර එදා උන්වහන්සේ රජතුමාට පහදල දුන්නා. රජතුමා ඇසුවා, ස්වාමීනි, මට මේවා තේරෙන්නේ නැහැ. තෝරල දෙන්න .... මේ රහතන් වහන්සේ ඇසුව මහරජතුමාගේ වයස කීයද ? .... මට දැන් වයස අවුරුදු අසූවයි. හොඳයි අවුරුදු විසිපහ, තිහ කාලෙදි තිබුණ කාය ශක්තිය දැන් තියෙනවද? ඉන්ද්‍රිය සම්පත්තිය දැන් තියෙනවද? නැහැ ස්වාමීනි, මම වයස අවුරුදු තිහේදී පමණ වූ තරුණ වයසේ දී ඍද්ධිවන්තයෙක් වාගේ මට පුදුම කාය ශක්තියක් තිබුණා. අහසට පැනනැඟී කරනම් ගසමින් සටන් කරන්නට මට හැකියාව ඒ කාලෙදි තිබුණා. හා හොඳයි, දැන් කොහොමද? .... අනේ ස්වාමීනි, දැන් මගේ ඇස් පේන්නේ නැහැ. කන් ඇහෙන්නේ නැහැ ... කථා කරන්නටත් හරියට බැහැ. කටහඬත් වෙනස් වෙලා. අත් පා වෙව්ලනවා. අත්පා සියල්ල අවසඟ වෙලා. පය තබන්න ඕන තැන නොවෙයි තියවෙන්නේ. නැගිට්ටාම වාඩි වෙන්න බැහැ. වාඩි වුනාම නැගිටින්න බැහැ. නිදාගත්තාම නැගිටින්න බැහැ. මම මේ හැම ආකාරයකින් ම අබල දුබල වෙලා ඉතාම අසරණ ජීවිතයක් ගෙවනවා.

මහරජ මෙන්න මේක නිසා තමයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වදාළේ උපනීයති ලෝකෝ අද්ධුවෝ. මේ ලෝක සත්වයා උපන් දා පටන් ජරා මරණ වෙත ඇදී ගෙන යනවා කියලා.

ඒ වාගේම මහරජ, ඔබතුමාගේ වයස දැන් අවුරුදු අසූවයි නම්, යම්කිසි නිධන්ගත රෝගයක් එහෙම නැද්ද ? .... තියෙනවා ස්වාමීනි, මට වාතාබාධයක් තියෙනවා. ඒ වාතාබාධය හැදුනාම මට නැගිටින්න බැහැ. කථාකරන්න බැහැ. කෙඳිරිගානවා. ඒ වේදනාවෙන් මම මිරිකෙනවා. ස්වාමීනි, ඒ වේලාවේ මගේ නෑදෑයෝ, දූ දරුවෝ, ඇමති මඬුල්ල, හිතමිතුරන් ඇවිල්ල ඇඳ වටේට සුසුම් හෙලනවා.

ඉතින් බැරිද මහරජ ඒ වේලාවේ මෙහෙම කියන්න. අනේ දරුව! අනේ අක්කේ! අනේ නංගියේ! මේ මගේ වේදනාවෙන් ටිකක් බෙදා ගන්න. ටික ටික අරගන්න, මට මේ වේදනාවෙන් ටිකක් සැනසිල්ල ලැබෙන්න, මගේ මේ වේදනාව ටික ටික බෙදාගන්න කියල දෙන්න බැරිද? වේදනාව බෙදල ...

බැහැ ස්වාමීනි, ඒ වේදනාව වෙන කාටවත් බෙදාගන්න බැහැ, මා විසින්ම ඒ වේදනාව විඳින්න ඕනෑ. මහරජ මෙන්න මේකයි ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ වදාළේ, **අතාණෝ ලෝකෝ අනභිස්සරෝ ...**

මේ ලෝක සත්වයාට පිහිටක් නැහැ.

තමා කළ කර්මයේ විපාක තමාම විඳින්න ඕනෑ.

තමන්ගේ පඤ්චස්කන්ධයේ දුක තමන්ම විඳින්න ඕනෑ.

වෙන කෙනෙක් ඒ දුක බෙදාගන්න සමතෙක් නැහැ. තමන් විසින් කරගත් කර්මයේ විපාක තමන් ම විඳින්න ඕනෑ. ඒ නිසා තමාට තමාවත් නෑ. අනාථයි, අසරණයි, කියන ඒක පහදා දුන්නා.

**අස්සකෝ ලෝකෝ සබ්බං පහාය ගමනීයං**

කිව්වේ කුමක් ද? කියල කෝරව්‍ය රජතුමා රට්ඨපාල මහරහතන් වහන්සේගෙන් ඇසුව. මහරජ දැන් ඔබතුමා මේ සශ්‍රීක රාජධානියක රජකම් කරනව නේද? දැන් වයස අවුරුදු 80 යි. තව ටික දවසකින් පරලොව ගියාම ආයෙමත් මේ රජ ගෙදරම රාජ කුමාරයෙක් වෙලා උපදිනවද ? නැහැ ස්වාමීනි, මම ඉතින් කර්මානුරූපව කොහේ හරි උපදියි. මගේ දායාදයෝ මේවා හිමි කර ගනියි. ඒක තමයි මහරජ, බුදුරජාණන් වහන්සේ වදාළේ. මගේ මගේ කියන සියල්ලම අත්හැරල දාල යන්න වෙනව. මගේ කියල කිසිවක් නෑ. ඒ බව උන්වහන්සේ රජතුමාට පහදා දුන්නා.

**ඌණෝ ලෝකෝ අතිත්තෝ තණ්හාදාසෝ ති**

මහරජ, ඔබ දැන් මේ කුරුරටට අධිපතිව රාජ්‍යය කරනව නේද? ඔබේ හිත මිතුරෙක් නැගෙනහිර දිසාවෙන් ඇවිත් කියනවා .... දේවයන් වහන්ස, දේවයන් වහන්ස, අසවල් ප්‍රදේශයේ නැගෙ

නහිර ප්‍රදේශයේ තියෙනවා ඉතාම සශ්‍රීක රාජධානියක්. මැස්සන් නැති මී වදයක් වගේ බොහෝම ලේසියෙන් අත්පත් කරගන්න පුළුවන්. මෙහෙම කිවුවොත් මොකද කරන්නේ..... එහෙමයි ස්වාමීනි, මම ගිහින් යුද්ධ කරලා ඒක අරගන්නවා, අල්ලගන්නව. හොඳයි, මහරජ, දකුණු දිසාවෙන්, බටහිර දිසාවෙන්, උතුරු දිසාවෙන්, මුහුදින් එතෙරින් ඒ වාගේ මිත්‍රයෝ පස් දෙනෙක් ඇවිල්ල කිව්වොත් මොකද කරන්නෙ? ස්වාමීනි, මම ගිහින් ඒ රටවල් පහම යුද්ධ කරලා අල්ල ගන්නව. මා සතු කර ගන්නව.

මහරජ, මේ විදියේ රටවල් හයකට නායකකම් කළා කියලා, රජවුණා කියලා, එක වාරයකට බත් තලි හයක් අනුභව කරනවද? එක අවස්ථාවකට ඔටුනු හයක් පළඳිනවද? එක වාරයකට රාජාභරණ කට්ටල හයක් දරාගන්නවාද? එක වාරයකට ඇඳන් හයක නිදා ගන්නවද? නැහැ නේද? එහෙම නම්, මේ එක දුක්ඛ සත්‍යයට පිළියම් කරන මේ ආත්මභාවය සඳහා එක රටකින් සෑහීමකට පත් නොවී රටවල් හයක් අයිති කර ගන්න සිතුවේ කුමක් නිසාද? අතෘප්තිකර නිසා නොවේ ද? තෘෂ්ණාවට වහල් නිසා නොවේ ද? මෙන්න මේකයි, ලෝක සත්වයා තණ්හාවට යටත් වෙලා තෘප්තියක් නැතිව ජීවත් වෙනව කියන්නේ, කියන එක එදා රට්ඨපාල මහරහතන් වහන්සේ විසින් කෝරව්‍ය රජතුමාට පහදා දුන්නා. ලොව්තුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මේ එක එකක් ගානේ මෙනෙහි කරමින් මහාකරුණා සමාපත්තියට සමවදිනව.

**අතායණෝ ලෝකසන්නිවාසෝ .....** ලෝක සන්නිවාස හෙවත් මේ ලෝක සත්වයාට ආරක්ෂා වෙන්නට තැනක් නැහැ. හැමතැනම තියෙනවා, මේ සංසාර වධබන්ධන. ඒක නිසා ලෝක සත්වයාට ආරක්ෂා වෙන්නට තැනක් නැහැ කියන කාරණය සිහිපත් කරමින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මහාකරුණා සමවතට සමවදිනවා.

**අලේණෝ ලෝකසන්නිවාසෝ ....**

ලෝක සත්වයාට සැඟවී ඉන්න තැනක් ලෝක ධාතුවේ කොතැනකවත් නැහැ. ගල් කුහරයකවත්, පර්වත කුහරයකවත්, අහසේවත්, මහමුහුදේවත් සැඟ වී ඉන්න තැනක් නැහැ. තමා කළ කර්මයේ විපාක තමාම විඳින්න ඕනෑ. තමන් ගොඩනගා ගත්ත පඤ්චස්කන්ධ දුක තමන් ම විඳින්නට ඕනෑ. මේ නිසා ලෝක සත්වයාට ආරක්ෂා ස්ථානයක් නැහැ, සැඟවී ඉන්න ස්ථානයක් නැහැ කියන කරුණ සිහිපත් කරමින් මහාකාරුණිකයන් වහන්සේ මහාකරුණා සමාපත්තියට සමවදිනවා.

**අසරණෝ ලෝකසන්නිවාසෝ ....**

මේ ලෝක සත්වයා පරම අසරණ තත්වයෙන් වාසය කරනව. තමන්ට එන භය සන්සිඳවා ගන්නටත් බැහැ. අන් අයට එන භය සන්සිඳවන්න සමර්ථකමකුත් නැහැ. ඒක නිසා අසරණයි ලෝක සත්වයා.

**අසරණීභූතෝ ලෝකසන්නිවාසෝ ...**

උපතින්ම මේ ලෝක සත්වයා අසරණයි. උපතින්ම තමාට තමා පිහිටක් නැති හැටියට උපන්නා. මේ උපන්න අසරණ ජීවිතය, අසරණව ගෙවල, අසරණව පරලොව යනව. අසරණව මේ සංසාර කාන්තාරයේ එහා මෙහා සැරිසරනව කියා සිහිපත් කරමින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහාකරුණා සමාපත්තියට සමවදිනව.

**උද්ධතෝ ලෝකෝ අවුපසන්තෝ ....**

මේ ලෝක සත්වයා අලු ගොඩකට ගලක් ගැසුවාම විසිරී යන්නා වගේ, ජලාශයකට ගල් කැටයක් දමපුවාම ජලය කැලඹෙන්නා වගේ, චංචල සිතින් වාසය කරනවා. සන්සුන් මනසක් නැහැ. අසහනකාරී සිතින් වාසය කරනවා. "උද්ධච්චයෙන්" විසිරුණු සිතින් වාසය කරනවා. ගසක් මුදුනේ බැන්ද කොඩියක් සුළඟින් විසිරී යන්නාක් මෙන්, නිරන්තරයෙන් ම විසිරුණු සිතින් වාසය

කරනවා. මේ විසිරුණා වූ සිත් ඇත්තා වූ සත්වයාට මා පිහිට වෙන්න ඕනෑ කියලා මහාකරුණා සමාපත්තියට සමවදිනවා.

**සසල්ලෝ ලෝකසන්නිවාසෝ විද්ධෝ පුථුසල්ලේහි තස්ස නත්ථඤ්ඤො කෝචි සල්ලානං උද්ධාතා අඤ්ඤත්‍ර මයා ති ....**

මේ ලෝක සත්වයා උල් හතකින් ඇනීගෙන, ඇමිණීගෙන වාසය කරනව.

1. රාගසල්ල 2. දෝස සල්ල 3. මෝහ සල්ල 4. මානසල්ල 5. දිට්ඨිසල්ල 6. කිලේස සල්ල 7. දුච්චරිත සල්ල කියා උල් ජාති හතක් මේ සත්ව සන්තානයේ ඇනී ගෙන තිබෙනවා. උල් හතකින් ඇනී ගත්ත මේ සත්වයාගේ ඒ උල් ගලවන්නට මා හැර වෙන කෙනෙක් නැහැ කියල ඒ තථාගතයන් වහන්සේ මහාකරුණා සමාපත්තියට දිනපතා සූවිසි කෝටි ලක්ෂ වාරයක් සමවදිනවා.

**අවිජ්ජන්ධකාරාවරණෝ ලෝකසන්නිවාසෝ කිලේසපඤ්ජරපක්ඛිත්තෝ තස්ස නත්ථඤ්ඤො කෝචි ආලෝකං දස්සේතා අඤ්ඤත්‍ර මයා ති ...**

මේ ලෝක සත්වයා අවිද්‍යා නමැති ඝනාන්ධකාරයක ගිලීගෙන වාසය කරනවා. ක්ලේශ නමැති මහා මැදිරියකට කොටුවෙලා වාසය කරනවා. මේ අවිද්‍යා අන්ධකාරයෙන් නිමක් නොදැක සිටින මේ ලෝකසත්වයා හට මා හැර වෙන ආලෝකය දෙන්න කෙනෙක් නැහැ නේද කියලා මහාකාරුණිකයන් වහන්සේ, මහාකරුණා සමාපත්තියට සමවදිනවා.

**අවිජ්ජාගතෝ ලෝකසන්නිවාසෝ අණ්ඩභූතෝ
පරියෝනද්ධෝ තණ්හාකුලකජාතෝ ගුළාගුණ්ඨිකජාතෝ
මුඤ්ජබබ්බජභූතෝ අපායං දුග්ගතිං විනිපාතං
සංසාරං නාතිවත්තතී' ති........**

මේ ලෝක සත්වයා අවිද්‍යාවට ඇතුල්වෙලා වාසය කරනවා. හරියට බිජුවක සත්වයෙක් ජීවත් වෙන්න වාගේ. අවිද්‍යාවෙන් වටවී වාසය කරනවා. නූල් හැරයක් (නූල් පන්දුවක්), මීයෙකු විසින් අවුල් කරන ලද නූල් හැරයක් වාගේ අවුලෙන් අවුලට

පත් වී සිටිනවා. වඩු කුරුලු කූඩුවක කෙඳි අවුලෙන් අවුලට පත්වෙලා තියෙන්න වාගේ මේ සත්වයෝ තෘෂ්ණා අවුලෙන්, **අන්තෝජටා, බහිජටා**, වී වාසය කරනවා. නරකාදී සතර අපාය නොඉක්මෙව්වා වූ, මේ සත්වයාගේ කෙලෙස් අවුල ලිහන්නට මා හැර අන් සමතෙක් නැහැ. එනිසා මා ඉදිරිපත් විය යුතු යැයි සලකා මහා කරුණා සමවතට සමවදිනව.

**අවිජ්ජාවිසදෝසසංලිත්තෝ ලෝකසන්නිවාසෝ**
**කිලේසකලලීභූතෝ' ති**

මේ ලෝක සත්වයා අවිද්‍යා නැමති විෂ දෝෂයෙන් ඇලීගෙන, තැවරීගෙන වාසය කරනවා. කෙලෙස් නැමති මඩ කලල්වල එරීගෙන වාසය කරනවා. මොවුනට මම පිහිට වෙන්න ඕනෑ කියලා මහා කරුණා සමාපත්තියට සමවදිනව.

**රාගදෝසමෝහජටාජටිතෝ ලෝකසන්නිවාසෝ**
**තස්ස නත්‍ථඤ්ඤො කෝචි ජටං විජටෙතා අඤ්ඤත්‍ර මයා' ති**

මේ ලෝක සත්වයා රාග, දෝස, මෝහ කියන මහා ජටාවකින් පැටලිලා වාසය කරනවා. ගැට ගැසී වාසය කරනවා. මොවුන්ගේ මේ කෙලෙස් ගැට ලිහන්නට, තථාගතයන් වහන්සේ හැර වෙන කෙනෙක් නැහැ කියල මහා කරුණා සමාපත්තියට සමවදිනව.

**තණ්හාසඞ්ඝාටපටිමුක්කෝ ලෝකසන්නිවාසෝ**

මේ ලෝක සත්වයා තෘෂ්ණා නැමති දඬුකඳක ගැටීගෙන වාසය කරනවා. රාජ අපරාධ කළ අයට දෙනව දඬුකඳේ දඬුවමක්. අදකාලේ "දඬුකඳ" දකින්න නැතත් ඒ කාලේ දඬුකඳේ ගහල දින ගණන්, සතිගණන් තියලා පුද්ගලයන් හික්මවනව. ඒ වාගේ තෘෂ්ණා නැමති දඬුකඳේ ගහල ඉන්නවා මේ සත්වයා. මොවුන්ට මම පිහිට වෙන්නට ඕනෑ. **"තණ්හාජාලේන ඔත්‍ථටෝ ලෝකසන්නිවාසෝ"** වටු වැද්දෙක් වටු රංචුවකට දැලක් දැම්මා වාගේ තෘෂ්ණා නැමති දැලෙන් වටවෙලා ඉන්නවා මේ ලෝක සත්වයා. **"තණ්හාසෝතේන වුය්හති ලෝකසන්නිවාසෝ .....** ගංගාවකට වැටුණ අසරණයෙක් වාගේ, ලෝක සත්වයා තෘෂ්ණා නැමති ගංගාවේ

සැඩ පහරේ පාවෙනවා. **"තණ්හාසංයෝජනේන සඞ්ඝද්ධුත්තෝ ලෝක සන්නිවාසෝ ......** ලෝක සත්වයා තෘෂ්ණා නැමති මහා බැම්මකින් සංයෝජනයකින් සංසාරයෙහි බැඳීගෙන සිටිනවා. **"තණ්හානුසයේන අනුසටෝ ලෝකසන්නිවාසෝ....** ලෝක සත්වයා තෘෂ්ණා නැමති මහා අනුසය හතකින් දැඩිලෙස කෙලෙස් බරින් වාසය කරනවා. **"තණ්හාසන්තාපේන සන්තප්පති ලෝකසන්නිවාසෝ ....** මේ ලෝක සත්වයා තෘෂ්ණා නැමති මහ තැවීමකින්, දැවීමකින් දැවෙමින් වාසය කරනවා. **"තණ්හාපරිලාහේන පරිඩයිහති ලෝකසන්නිවාසෝ....** ලෝක සත්වයා තෘෂ්ණා නැමති මහා ඩාහයකින් දැවී දැවී වාසය කරනවා. මේ සත්වයාට මා හැර පිහිටවෙන්න කෙනෙක් නෑ කියා සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමවතට සම වදිනව. **දිට්ඨිසංඝාටපටිමුක්කෝ ලෝකසන්නිවාසෝ.....**

මේ ලෝක සත්වයා මිථ්‍යා දිට්ඨි නැමති දඬුකඳක බැඳීගෙන වාසය කරනවා. **"දිට්ඨිජාලේන ඔත්ථටෝ ලෝකසන්නිවාසෝ....** ලෝක සත්වයා දිට්ඨි නැමති දැලකට යටවී වාසය කරනවා. **"දිට්ඨිසෝතේන වුයිහති ලෝකසන්නිවාසෝ....** ලෝක සත්වයා දිට්ඨි නමැති මහ සැඩපහරකට හසුවී ගහගෙන යනවා. **" දිට්ඨිසංයෝජනේන සඞ්ඝද්ධුත්තෝ ලෝකසන්නිවාසෝ .....** ලෝක සත්වයා දිට්ඨි නැමති සංයෝජනයකින් බැඳී වාසය කරනවා. **"දිට්ඨානුසයේන අනුසටෝ ලෝකසන්නිවාසෝ....** අප්‍රහීණ වශයෙන් ශකතිමත් බවට පත් වූ දිට්ඨියකින් ලෝක සත්වයා බැඳීගෙන වාසය කරනවා. **"දිට්ඨිසන්තාපේන සන්තප්පති ලෝකසන්නිවාසෝ......** මේ ලෝක සත්වයා දිට්ඨි නැමති මහා ඩාහයකින් දැවෙමින් වාසය කරනවා. **"දිට්ඨිපරිළාහේන පරිඩයිහති ලෝකසන්නිවාසෝ ....** මේ ලෝක සත්වයා දිට්ඨි නැමති මහා දැවිල්ලකින් දැවි දැවී වාසය කරනවා. මේ ලෝක සත්වයාට මා පිහිට විය යුතුයි කියා මහා කාරුණිකයන් වහන්සේ මහා කරුණා සමාපත්තියට සමවදිනව.

**"ජාතියා අනුගතෝ ලෝකසන්නිවාසෝ ......**

මේ ලෝක සත්වයා ජාතිය නැමති දුකෙන් අනුව ගමන් කරනවා. **"ජරාය අනුසටෝ ලෝකසන්නිවාසෝ ......** මේ ලෝක සත්වයා ජරාවෙන් වැළඳී ගෙන වාසය කරනවා. **"ඛ්‍යාධිනා අභිභූතෝ ලෝකසන්නිවාසෝ ......** ලෝක සත්වයා ව්‍යාධියෙන් මැඬගෙන වාසය කරනවා. **"මරණේන අබ්බාහතෝ ලෝකසන්නිවාසෝ ......** ලෝක සත්වයා මරණයෙන් විනාශ වෙවී වාසය කරනවා. **"දුක්ඛෙ පතිට්ඨිතෝ ලෝකසන්නිවාසෝ .....** මේ ලෝක සත්වයා විශාල දුක්ඛයක පිහිටා ගෙන වාසය කරනවා කියා. මේ එකක් පාසා මෙනෙහි කරමින් ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහා කරුණාවට සමවදිනව. **"තණ්හාය උඩ්ඩිතෝ ලෝක සන්නිවාසෝ.....** මේ ලෝක සත්වයා තෘෂ්ණා නැමති ඇණයක එල්ලීගෙන වාසය කරනවා. ඇඳුම් එල්ලන්නට ගෙවල් වල තිබෙනව "**නාග දත්ත**" කියල ඇත්දලවලින්, මුව අංවලින්, එල්ලන තැන් හදල තියෙනවා. ඒවාගේ එල්ලී ගෙන තෘෂ්ණාවෙන් වාසය කරනව. **ජරාපාකාරපරික්ඛිත්තෝ ලෝකසන්නිවාසෝ .....** ලෝක සත්ත්වයා "ජරා නැමති පවුරකින් (ප්‍රාකාරයකන්) වටවෙලා වාසය කරනවා. **"මච්චුපාසේන පරික්ඛිත්තෝ ලෝකසන්නිවාසෝ ......** මේ ලෝක සත්වයා මරණය නැමති මහා පාසකයකට බැඳී වාසය කරනවා.

**"මහාබන්ධනබද්ධෝ ලෝකසන්නිවාසෝ රාගබන්ධනේන,**
**දෝසබන්ධනේන, මෝහබන්ධනේන, මානබන්ධනේන,**
**දිට්ඨිබන්ධනේන, කිලේසබන්ධනේන, දුච්චරිතබන්ධනේන.**

මේ ලෝක සත්වයා, රාග බන්ධනයෙන්, දෝස බන්ධනයෙන්, මෝහ බන්ධනයෙන්, මාන බන්ධනයෙන්, දෘෂ්ටි බන්ධනයෙන්, ක්ලේශ බන්ධනයෙන්, දුෂ්චරිත බන්ධනයෙන් කියන බැඳුම් හතකින් බැඳීගෙන වාසය කරනවා. මේ බැඳුම් ලිහන්නට මා හැර වෙන කෙනෙක් නෑ කියා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහාකරුණාවට සමවදිනව. **"මහාසම්බාධපටිපන්නෝ ලෝකසන්නිවාසෝ.....** මේ ලෝක සත්වයා මහා සම්බාධයකට පත්

වී වාසය කරනවා. "**මහාපළිබෝධේන පළිබුද්ධෝ ලෝකසන්නිවාසෝ....** මේ ලෝක සත්වයා මහා පලිබෝධයකින් වෙලාගෙන වාසය කරනවා. "**මහාපපාතේ පතිතෝ ලෝකසන්නිවාසෝ.....** මේ ලෝක සත්වයා මහා සංසාර ප්‍රපාතයක වැටීගෙන වාසය කරනවා. **මහා කන්තාරපටිපන්නෝ ලෝකසන්නිවාසෝ ......** මේ ලෝක සත්වයා "මහා කාන්තාරයක වැටීගෙන වාසය කරනවා. "**මහාසංසාර පටිපන්නෝ ලෝකසන්නිවාසෝ.....** සංසාර විදුග්ගයක මේ ලෝක සත්වයා එහා මෙහා පෙරලී පෙරලී වාසය කරනවා.

"**මහාපළිපේ පළිපන්නෝ ලෝකසන්නිවාසෝ ......** මේ ලෝක සත්වයා සංසාරයේ කෙලෙස් නැමති මහා මඩ ගොහොරුවක එරීගෙන වාසය කරනවා. මේ ලෝක සත්වයාහට මා හැර වෙන පිහිට වෙන්නට සමතෙක් නෑ නේද? කියා මහා කාරුණිකයන් වහන්සේ මහා කරුණා සමාපත්තියට සම වදිනව. "**අබ්භහතෝ ලෝකසන්නිවාසෝ......** මේ ලෝක සත්වයා ජරාවෙන්, ව්‍යාධියෙන්, මරණයෙන් අභිභවනය වී මැඩීගෙන වාසය කරනවා.

මොවුනට පිහිට වෙන්න මාහැර වෙන කෙනෙක් නෑ කියා මහා කරුණාවට සමවදිනව.

**ආදිත්තෝ ලෝකසන්නිවාසෝ රාගග්ගිනා,**
**දෝසග්ගිනා, මොහග්ගිනා, ජාතියා, ජරා, මරණේන, සෝකේහි,**
**පරිදේවේහි, දුක්ඛේහි දෝමනස්සේහි**
**උපායාසේහි, තස්ස නත්ථඤ්ඤෝ කෝචි නිබ්බාපේතා අඤ්ඤත්‍ර**
**මයා ති......**

මේ ලෝක සත්වයා, එකොළොස් මහා ගින්නකින් දැවීගෙන. වාසය කරනවා. **රාගගින්නෙන්, දෝසගින්නෙන්, මෝහගින්නෙන්, ජාති ගින්නෙන්, ජරා ගින්නෙන්, මරණ ගින්නෙන්, සෝක පරිදේව, දුක්ඛදෝමනස්ස, උපායාස** කියන ගිනි එකොළහකින් දිවා රාත්‍රී දෙකේ නිරන්තරයෙන් දැවී දැවී වාසය කරනවා. මේ මහා දුක් ගින්දරෙන් දැවෙන්නා වූ කෙලෙස් ගින්නෙන් දැවෙන්නා වූ මොවුනට නිවීමක්, සිසිලසක් සලසා දෙන්නට මා හැර වෙන කෙනෙක් නෑ නේද කියා සම්මා සම්බුදුරජාණන් වහන්සේ මහාකරුණාවට සමවදිනව.

**"උන්නීතකෝ ලෝකසන්නිවාසෝ හඤ්ඤති නිච්චමතාණෝ පත්තදණ්ඩෝ තක්කරෝති......**

වදයට නියම වුණා වූ පුද්ගලයෙකුට තමා කළ රාජ අපරාධයට අනුරූපව වද විඳින්නාක් මෙන්, මේ ලෝක සත්වයා උපන්න දා පටන් වද විඳිනව. උපන්න දා පටන් හුස්ම ගන්නව, හෙලනව, උපන්න දා පටන් අත්පා නමනව, දිගහරිනව, ඉරියව් මාරු කරනව, උපන්න දා පටන් කෑම බීම ගන්නට වෙනවා, උපන්න දා පටන් කෙළ, සොටු, මළ, මූත්‍රා බැහැර කරනව. උපන්න දා පටන් සීතල, උණුසුම, විඳින්න වෙනව. උපන්න දා පටන් මැසි, මදුරු, අව්වැසි, සුළං විෂඝෝර සර්පාදීන්ගේ ස්පර්ශ විඳින්න වෙනව. උපන්දා පටන් සාපිපාසාදී දුකට පත් වෙන්න සිදු වෙනව. උපන්දා පටන් වාත, පිත, සෙම තුන්දොස කිපීමේ රෝගයන්ට මුහුණ පාන්න සිදුවෙනව. ඒ වාගේ අනේක විධ වද වේදනාවන්ට මුහුණ පාමින් මේ ලෝක සත්වයා දුකෙන් පෙළෙනවා. දුකෙන් පෙළෙන මොවුනට පිහිට වෙන්නට මා හැර ලොව වෙන කෙනෙක් නෑ කියා සම්මා සම්බුදු රජාණන් වහන්සේ මහා කරුණා සමවතට සමවදිනව.

**"වජ්ජබන්ධනබද්ධෝ ලෝකසන්නිවාසෝ ආඝාතනපච්චුපට්ඨිතෝ......**

මේ ලෝක සත්වයා තමා කළ වැරදින් බැඳීගෙන දඬුවමක් විඳින්න වදක ස්ථානයට ගෙනයනු ලබමින් සිටිනව. උපන්දා පටන් මේ වදකස්ථානයට යන්නෙ. මරණ ස්ථානයට යන්නෙ. මොවුන් මේ බන්ධනයෙන් මුදවන්න, තමන් වහන්සේ හැර වෙන කෙනෙක් නෑ කියා මෙනෙහි කරමින් මහා කරුණාවට සමවදිනව.

**"අනාථෝ ලෝකසන්නිවාසෝ, පරමකාපඤ්ඤප්පත්තෝ.......** මේ ලෝක සත්වයා අතිශයින් ම අනාථයි. පරම කරුණාවට ලක් වූ අරමුණක් වෙනවා. මේ ලෝක සත්වයා මොවුනට මා පිහිට විය යුතු යැයි සිතා මහා කරුණාවට සමවදිනව.

**"දුක්ඛාභිතුන්නෝ ලෝකසන්නිවාසෝ නිච්ච පිපාසිතෝති......** මේ ලෝක සත්වයා තෘෂ්ණාදී ක්ලේශයන්ගෙන් ගිජු වෙලා වාසය

කරනවා. ලුණු වතුර පිපාසයට පානය කරන්න වාගේ තව තවත් මේ තෘෂ්ණා පිපාසයෙන් පිපාසිත වෙලා වාසය කරනව. මොවුනට මා පිහිට වෙන්නට ඕනෑ කියා මහා කරුණාවට සමවදිනව.

**"අන්ධෝ ලෝකසන්නිවාසෝ අචක්ඛුකෝ.....** මේ ලෝක සත්වයා අන්ධයි. ඇසක් නැහැ පෙනෙන්නේ. මෙලොව පේන්නෑ. පරලොව පේන්නෑ. කුසල් අකුසල් පේන්නෑ, හොඳ නරක පේන්නෑ, කර්මවිපාක පේන්නෑ. හේතුඵල පේන්නෑ. මෙලොව පරලොව පේන්නෑ. මේ විදිහේ නොපෙනෙන අන්ධභූත ජීවිතයක් මේ ලෝක සත්වයා ගෙවන්නේ. මොවුන්ගේ ඇස පාදන්නට මා හැර වෙන කෙනෙක් නෑ කියලා මහා කරුණාවට සමවදිනව.

**"හතනෙත්තෝ ලෝකසන්නිවාසෝ අපරිනායකෝ .....** මේ ලෝක සත්වයා උපතේදී ඇස් තිබුණත් අතරකදී සම්පූර්ණයෙන් ම නුවණැස අන්ධ වී ගියා. තමාගේ කණවැල අල්ලන්න කෙනෙක් නැතුව වාගේ. මේ සංසාර ගමනේ මේකයි හරි මාර්ගයය, මේකයි වැරදි මාර්ගය කියලා පෙන්නන්නට කෙනෙක් නැති බැවින් අසරණව සංසාරයේ එහා මෙහා ජරා මරණාදී දුකෙන් පීඩා විඳිමින් වාසය කරනවා. මොවුන්ට මම පිහිට වෙන්නට ඕනෑ කියලා මහා කරුණාවට සමවදිනව.

**"විපථපක්ඛන්තෝ ලෝකසන්නිවාසෝ අඤ්ජසාපරද්ධෝ.....**

**තස්ස නත්ථඤ්ඤො කෝචි අරියපථං ආනේතා අඤ්ඤත්‍ර මයා ති.** ..... මේ ලෝක සත්වයා වැරදි මාර්ගයක ගමන් කරනවා. ආර්ය මාර්ගයෙන් ඉවත්වෙලා ගමන් කරනවා. මේ ආර්ය මාර්ගයට කවුද වෙන ගන්නේ. මා හැර වෙන කෙනෙක් නෑ නේද? කියා මහා කරුණා සමවතට සමවදිනව.

**"මහෝඝපක්ඛන්තෝ ලෝකසන්නිවාසෝ .......** මේ ලෝක සත්වයා ක්ලේශ ඕඝයන්ට බැසගෙන වාසය කරනවා. කාමෝඝ, දිට්ඨි ඕඝ, අවිද්‍යා ඕඝ, භවඕඝ කියන මේ සතර මහා ඕඝයකින් පෙලෙන මේ සත්වයා ඕඝයෙන් එතෙර කරවන්නට තමන් වහන්සේ හැර වෙන සමතෙක් නෑ කියා මහා කරුණා සමාපත්තියට සම වදිනව.

"**ද්විහි දිට්ඨිගතේහි පරියුට්ඨිතෝ ලෝකසන්නිවාසෝ ......** ශාස්වත සහ උච්ඡේද යන දෘෂ්ටි දෙකකින් මේ ලෝක සත්වයා අතරමං වී වාසය කරනවා. "**තීහි දුච්චරිතේහි විප්පටිපන්නෝ ලෝක සන්නිවාසෝ.....** ලෝක සත්වයා දුශ්චරිත තුනකින් නොමඟ ගමන් කරනවා. කායදුශ්චරිත, වාග්දුශ්චරිත, මනෝදුශ්චරිත කියන දුශ්චරිත තුනකින් නොමඟ ගිහින් වාසය කරනවා.

**චතූහි යෝගේහි යුත්තෝ ලෝකසන්නිවාසෝ, චතුයෝගයෝජිතෝ.....** කාමයෝග, භවයෝග, දිට්ඨියෝග, අවිද්‍යා යෝග කියන සතර මහා යෝගයකින් මේ ලෝක සත්වයා බැඳීගෙන වාසය කරනවා.

**චතූහි ගන්ථෙහි ගන්ථිතෝ ලෝකසන්නිවාසෝ ......** අභිජ්ඣාකාය ග්‍රන්ථ, ව්‍යාපාද, කාය ග්‍රන්ථ, ඉදං පච්චාභි නිවේස කාය ග්‍රන්ථ සීලබ්බත පරාමාස කාය ග්‍රන්ථ කියන මේ කාය ග්‍රන්ථ හතරකින් මේ ලෝක සත්වයා ගැට ගැසී වාසය කරනව.

"**චතූහි උපාදානේහි උපාදියති ලෝකසන්නිවාසො .......** කියන මේ උපාදාන හතරකින් මේ සත්වයා දැඩි ලෙස ගෙන සංසාරයේ වාසය කරනව.

"**පඤ්චගතිසමාරුළ්හෝ ලෝකසන්නිවාසෝ ......** නරක ගතිය, ප්‍රේත ගතිය, තිරස්චීන ගතිය, මනුෂ්‍ය ගතිය, දේව ගතිය, කියන පංච ගතියට පමණක් මේ ලෝක සත්වයා ගමන් කරනවා. "**පඤ්චහි නීවරණේහි ඔත්ථටෝ ලෝකසන්නිවාසෝ .....** මේ ලෝක සත්වයා පංචනීවරණයන්ගෙන් බැඳීගෙන ආවරණ වී ගෙන වාසය කරනවා.

"**පඤ්චහි කාමගුණේහිරජ්ජති ලෝකසන්නිවාසෝ .......** පංච කාම ගුණයකින් ඇලීගෙන, බැඳීගෙන, වෙලීගෙන, පැටලීගෙන, එරීගෙන, මේ ලෝක සත්වයා වාසය කරනවා. මේ අසරණ සත්වයන්ට පිහිට වෙන්නට මා හැර වෙන සමතෙක් නෑ නේද කියා මහා කරුණික බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමවතට සමවදිනව.

"**ඡහි විවාදමූලේහි විවදති ලෝකසන්නිවාසෝ.....** මේ ලෝක සත්වයා විවාද මූල හයකින් විවාද කරමින්, සංසාරය දිග් කරගන්නවා.

**ඡහි දිට්ඨිගතේහි පරියුට්ඨිතෝ ලෝකසන්නිවාසෝ .....** මේ ලෝක සත්වයා දෘෂ්ටි හයකින් වටවී වාසය කරනවා. ආවරණය වී වාසය කරනවා.

**ඡහි තණ්හාකායේහි රජ්ජති ලෝකසන්නිවාසෝ ......** ලෝක සත්වයා තෘෂ්ණා හයකින් ඇලීගෙන, බැඳීගෙන, වෙලීගෙන, පැටලීගෙන වාසය කරනවා.

**සත්තහි මානේහිඋන්නතෝ ලෝකසන්නිවාසෝ .....** ලෝක සත්වයා සප්තවිධ මාන්නයකින් උන්නත වෙලා, උඩඟු වෙලා වාසය කරනවා.

**සත්තහි සංයෝජනේහි සංයුත්තෝ ලෝකසන්නිවාසෝ......** සංයෝජන හතකින් බැඳීගෙන ලෝක සත්වයා වාසය කරනවා.

"**සත්තෙහි අනුසයේහි අනුසටෝ ලෝකසන්නිවාසෝ.....** අප්‍රහීණ වශයෙන් ශක්තිමත් බවට පත් වූ කෙලෙස් හතකින් බැඳීගෙන ලෝක සත්වයා වාසය කරනවා. "**අට්ඨහි ලෝකධම්මේහි සම්පරිවත්තති ලෝකසන්නිවාසෝ .....** ලෝක සත්වයා අටලෝ දහමකින් කම්පා වෙවී, පෙරලි පෙරලී වාසය කරනවා.

"**අට්ඨහි මිච්ඡත්තේහි නියයාතෝ ලෝකසන්නිවාසෝ ....** ලෝක සත්වයා මිච්ඡත්ත මාර්ග අටකින් අනුව ගමන් කරනවා. "**අට්ඨහි පූරිසදෝසේහි දුස්සති ලෝකසන්නිවාසෝ......** ලෝක සත්වයා පුරුෂ දෝෂ අටකින් කිළිටි වෙවී, අපිරිසිදු වෙවී වාසය කරනවා.

**නවහි ආඝාත වත්ථුහි අඝාතිතෝ ලෝකසන්නිවාසෝ ......** ලෝක සත්වයා නව ආඝාත වස්තුවකින් බැඳීගෙන වාසය කරනවා. " **නවහි තණ්හාමූලකේහි ධම්මෙහි රජ්ජති ලෝකසන්නිවාසෝ ....** මේ ලෝක සත්වයා තෘෂ්ණා මූලික ධර්ම නවයකින් ඇලීගෙන, බැඳීගෙන, වෙලීගෙන, පැටලීගෙන, මුලාවීගෙන, යටවීගෙන වාසය කරනවා.

"**නවවිධමානේහි උන්නතෝ ලෝකසන්නිවාසෝ. ....** මේ ලෝක සත්වයා නව ආකාර මාන්නයකින් උඩඟු වී වාසය කරනවා.

"**දසහි ආඝාත වත්ථුහි අඝාතිතෝ ලෝකසන්නිවාසෝ .....** ක්ලේශ වස්තු දහයකින්, මේ ලෝක සත්වයා කිලිටි වේවි. කිලිටි වෙවී අපිරිසිදු වේවී වාසය කරනවා.

**"දසහි සංයෝජනේහි සංයුත්තෝ ලෝකසන්නිවාසෝ ......** ලෝක සත්වයා දස අකුසලයකින් සමන්නාගතව වාසය කරනවා.

**"දසවත්ථුකාය මිච්ඡාදිට්ඨියා සමන්නාගතෝ ලෝකසන්නිවසෝ.....** මේ ලෝක සත්වයා දසවස්තුක මිථ්‍යා දෘෂ්ටියකින් සමන්නාගතව වාසය කරනවා.

**"දසවත්ථුකාය අන්තග්ගාහිකාය, දිට්ඨියා, සමන්නාගතෝ ලෝක සන්නිවාසෝ....** ලෝක සත්වයා අන්ත්‍රග්‍රාහික මිත්‍යා දෘෂ්ටි දහයකින් බැඳීගෙන වාසය කරනවා.

**ද්වාසට්ඨියා දිට්ඨිගතේහි පරියුට්ඨිතෝ ලෝකසන්නිවාසෝ .......** මේ ලෝක සත්වයා හැට දෙකක් වූ මිථ්‍යා දෘෂ්ටින්ගෙන් ආවරණය වී මැඩලාගෙන වාසය කරනවා.

**"අට්ඨසතතණ්හාපපඤ්චසතේහි පපඤ්චිතෝ ලෝකසන්නිවාසෝ......** මේ ලෝක සත්වයා එකසිය අට (108) වැදෑරුම් තණ්හා ප්‍රපඤ්චයකින් ප්‍රපඤ්චිත වෙලා වාසය කරනවා.

**අහඤ්චම්හි තිණ්ණෝ ලෝකෝ ච අතිණ්ණෝ, අහඤ්චම්හි මුත්තෝ**
**ලෝකෝ ච අමුත්තෝ, අහඤ්චම්හි දන්තෝ ලෝකෝ ච අදන්තෝ.**
**අහඤ්චම්හි සන්තෝ ලෝකෝ ච අසන්තෝ, අහඤ්චම්හි අස්සත්ථෝ**
**ලෝකෝ ච අනස්සත්ථෝ, අහඤ්චම්හි පරිනිබ්බුතෝ ලෝකෝ ච**
**අපරිනිබ්බුතෝ, පහෝම්බවාහං තිණ්ණෝ තාරේතුං.**
**මුත්තෝ මෝචේතුං, දන්තෝ දමේතුං**
**සන්තෝ සමේතුං, අස්සත්ථෝ අස්සාසේතුං පරිනිබ්බුතෝ**
**පරිනිබ්බා පේතුන්ති, පස්සන්තානං බුද්ධානං භගවන්තානං**
**සත්තේසු මහාකරුණා ඔක්කමති......**

මම වනාහි සංසාර සාගරයෙන් එතර වුණා
මම සියලු දුක්ඛයෙන් අත මිදුනා
මම ඉන්ද්‍රියන් දමනය කළා. මම කෙලෙසුන් සංසිඳවා ගත්තා.
මම පරම අස්වැසිල්ලට පත් වුණා. මම ක්ලේශ පරිනිර්වාණය කළා.
මම සංසාරයෙන් එතෙර වී සිටින බැවින්,
අන් අය සංසාරයෙන් එතෙර කරවීමට සමර්ථයි.

මම සියලු කෙලෙසුන්ගෙන් මිදී සිටගෙන, අන් අය ද මුදවන්නට සමර්ථයි.

මම ඉන්ද්‍රීන් දමනය කරගත් බැවින්, අන් අය ද දමනය කරවීමට සමර්ථයි.

මම කෙලෙසුන් සන්සිඳ වූ බැවින්, අන් අයට ද සන්සිඳුවීමට සමර්ථයි.

මම පරම අස්වැසිල්ලට පත් වූ බැවින්, අන් අයට ද අස්වැසිල්ල ලබාදීමට සමර්ථයි.

මම ක්ලේශ පරිනිර්වාණය කළ බැවින්, අන් අයට ද ක්ලේශ පරිනිර්වාණය සලසාලීමට සමර්ථයි කියා, මේ අයුරින් අනේකාකාරයෙන් සලකන්නා වූ මහා කාරුණික වූ, සම්මා සම්බුදු රජාණන් වහන්සේ සූවිසි කෝටි ලක්ෂවාරයක් දිනපතා මහා කරුණා සමාපත්තියට සමවදිනව.

**"ඉදං තථාගතස්ස මහාකරුණාසමාපත්තියා ඤාණං"** මෙන්න මේ කියන ලද්දේ අසූනව ආකාරයකින් පමණක් සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ මහා කරුණා සමාපත්ති ඤාණයයි කියා, ධර්මසේනාධිපති ශාරිපුත්‍ර මහරහතන් වහන්සේට මහා කරුණා සමාපත්ති දේශනාව නිමාකොට වදාළා. මේ දහම් කරුණු අසූනවය එකක් එකක් පාසා විස්තර වශයෙන් විග්‍රහ කරනවා නම්, දිනගණනාවක් සති, මාස ගණනාවක් නමුත් තෝරා බේරා ගන්නට ධර්ම කරුණු රාශියක් මෙතන තිබෙනවා.

මම ආරාධනා කරනවා මේ දහම් පොත කියවන සෑම දෙනාම මේ දහම් කරුණු අසූනවය කටපාඩම් කරගනිත්වා! මේ කරුණු සියල්ලම නිවැරදිව අර්ථාවබෝධ කර ගැනීමට සමර්ථ වෙත්වා! ඒ සඳහා ධර්ම ශ්‍රවණය කරත්වා! දහම් පොත් පත් බලත්වා! දහම් සාකච්ඡා කරත්වා! එපමණකින් නොනැවතී උදේ සවස මොහොතක් බැගින් හරි කරුණා භාවනාව වඩත්වා! කරුණාවෙන් සීතල වූ හදවතක් ඇති, මහාකාරුණික සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණානුභාව බලයෙන්, අපේ සන්තාන නිවාගෙන සනසා ගෙන, දෙවියන් සහිත ලෝකයාගේ ගිනිගෙන

දැවෙන මේ හදවත් නිවාගෙන සනසාගෙන, සැමදෙනාටම අමාමහ නිවන් සුව අවබෝධ කරවන්නට වාසනා වේවා කියා අපි ආරාධනා කරනවා. ප්‍රාර්ථනා කරනවා.

විශේෂයෙන් ම කරුණා බ්‍රහ්ම විහරණය අපි මොහොතක් සිහිපත් කරන්නට ඕනෑ.

කරුණා බ්‍රහ්ම විහරණය කොහොමද වඩන්නේ? මෛත්‍රී භාවනාව වඩන හැටි බොහෝ දෙනා දන්නවා. මම වෛර නොවෙමි. තරහ නොවෙමි. නිදුක් වෙමි. නීරෝගී වෙමි. සුවපත් වෙමි.

සියලු සත්වයෝ වෛර නැත්තෝ වෙත්වා. තරහ නැත්තෝ වෙත්වා. නිදුක් වෙත්වා. නීරෝගී වෙත්වා. සුවපත් වෙත්වා. මේ මෛත්‍රී බ්‍රහ්ම විහරණය, කරුණා බ්‍රහ්ම විහරණය තියෙන්නේ වචන වශයෙන් එකයි. "දුකෙන් මිදෙත්වා" මේ දුකෙන් මිදෙත්වා කියන වචනය අපි භාවනාවට නඟන්නට පුරුදු වෙන්නට ඕනෑ.

තමාට ප්‍රථමයෙන් ආරෝපනය කරන්නට ඕනෑ කරුණාව. මම දුකෙන් මිදෙම්වා. දුකෙන් මිදෙම්වා. දුකෙන් මිදෙම්වා කියල සිතල, මොනවද මේ දුක කියන එක තෝරාගන්නට ඕනෑ.

මම ජාති දුකෙන් මිදෙම්වා. ජරා දුකෙන් මිදෙම්වා. ව්‍යාධි දුකෙන් මිදෙම්වා. මරණ දුකෙන් මිදෙම්වා. සෝක දුකෙන් මිදෙම්වා. පරිදේව දුකෙන් මිදෙම්වා. දුක්ඛ දුකෙන් මිදෙම්වා. දෝමනස්ස දුකෙන් මිදෙම්වා. උපායාස දුකෙන් මිදෙම්වා. අප්‍රිය සම්ප්‍රයෝග දුකෙන් මිදෙම්වා. ප්‍රියවිප්පයෝග දුකෙන් මිදෙම්වා. ඉච්ඡාවිඝාත දුකෙන් මිදෙම්වා. පංචස්ඛන්ධ දුකෙන් මිදෙම්වා. මම සතර අපා දුකෙන් මිදෙම්වා. මනුෂ්‍ය ලෝක දුකෙන් මිදෙම්වා. දිව්‍ය ලෝක දුකෙන් මිදෙම්වා. බඹලොව දුකෙන් මිදෙම්වා. සතර යෝනියේ ඉපදීමේ දුකෙන් මිදෙම්වා. පංචගතියේ ඉපදීමේ දුකෙන් මිදෙම්වා. සත්ත විඤ්ඤාණට්ඨිතියේ ඉපදීමේ දුකෙන් මිදෙම්වා. නව සත්තාවාසයේ ඉපදීමේ දුකෙන් මිදෙම්වා. නවමහභවයේ ඉපදීමේ දුකෙන් මිදෙම්වා. රාගගින්නේ දුකෙන් මිදෙම්වා. දෝස ගින්නේ දුකෙන් මිදෙම්වා. මෝහ ගින්නේ දුකෙන් මිදෙම්වා.

සියලු කෙලෙස් ගින්නෙන් සිදුවන දුකෙන් මිදෙම්වා.

මෙසේ සියලු දුක්ඛරාශියෙන් අත මිදී බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලා නිවී සැනසී වදාළ නිවන් සුව අවබෝධ වේවා කියා තමාට කරුණාව ආරෝපණය කරගෙන, ඉන් අනතුරුව සෙසු සියලුම සත්වයන්ටමත් අර මෛත්‍රී බ්‍රහ්ම විහරණසේම මුලින් සඳහන් ආකාරයට කරුණා භාවනාව වඩන්නට සැම දෙනාම උත්සාහවත් වෙත්වා කියා අපි කරුණාවෙන් ආරාධනා කරනවා.

එසේ කරුණා භාවනා වැඩීමේ කුසලානුභාවයෙන් සැම දෙනාටම අනන්ත අපරිමාණ බුදු පසේබුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළ අජරාමර ශාන්ත ලෝකෝත්තර අමාමහ නිවන්සුව සුවසේම අවබෝධ වේවා!

සාදු! සාදු ! සාදු!

**මහාකරුණා සමාපත්ති ඥාණ ධර්ම දේශනාව නිමි.**

# 5. සබ්බඤ්ඤුත ඤාණ - අනාවරණ ඤාණ

## ධර්ම දේශනය

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස*

සබ්බං සංඛතමසංඛතං අනවසේසං ජානාතීති
සබ්බඤ්ඤුත ඤාණං තත්ථ ආවරණං නත්ථීති
අනාවරණ ඤාණන් ති.

ශ්‍රද්ධාවන්ත පිංවතුනි,

තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත් වූ, අර්හත් වූ, සම්‍යක් සම්බුද්ධ දසබලධාරී සර්වඥරාජෝත්තමයාණන් වහන්සේගේ සන්තානයේ විද්‍යමාන වන, අනන්ත ඤාණ සම්භාර අතුරින් අග්‍රගන්‍ය වූ සර්වඥතා ඤාණය සම්බන්ධව ධර්ම දේශනයටයි, මේ සූත්‍ර පාඨය මාතෘකා කරන්නට යෙදුනේ.

ශාන්ති නායකයාණන් වහන්සේ විසි අසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලේ පිරූ පාරමිතානුභාව බලයෙන්, මෙයින් අවුරුදු 2587 කට පෙර, අද වැනි දවසකදී බෝමුල අරා වැඩ ඉඳගෙන, සපරිවාර මාර පරාජය කොට ලොව්තුරා සම්බුද්ධ රාජ්‍යයට පත් වී වදාළ ඒ ශාන්තිනායකයාණන් වහන්සේගේ සන්තානයෙහි එදා පහළ වූ, අන්නත ඤාණ සම්භාර සියල්ල එක්කාසු කොට ප්‍රකාශ කරනවා නම්, සර්වඥතාඤාණය ඇතුළට ඒ සියලුම ඤාණ සම්භාරය ඇතුළත් වෙනව.

එනිසා ලොවුතුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිළිබඳව තත්වාකාරයෙන් අවබෝධ කර ගැනීමට නම් සර්වඥතා ඤාණය පිළිබඳව දැනගත යුතුමයි. එනිසා මේ වෙසක් සතියේදී පැවැත්වෙන, අතිශ්‍රේෂ්ඨ වූ ධර්ම දේශනා පන්තියට මේ සර්වඥතාඤාණය තෝරා ගැනීම ඉතාම ඤාණ සම්ප්‍රයුක්තයි කියල අපි ස්තුතිවන්ත වෙනව. විශේෂයෙන් ම සර්වඥතාඤාණය හැඳින්වීමේදී, මූලික තේරුම් කිහිපයක් අපි දැනගෙන තිබෙන්නට

ඕනෑ. ධර්ම දේශනාවක් කරන වේලාවෙ, ජීවමාන බුදුරජාණන් වහන්සේ අභියස මෙන්, අපේ සිත සමාධිගත වන්නට ඕනෑ. ඒ සමාධිගත සිතින් යුක්තව ධර්මදේශනා කළහොත්, ධර්මශ්‍රවණය කළහොත්, ඒ දේශනාව නියමාකාරයෙන් අවබෝධ කර ගැනීමට හැකිවෙනවා. සර්වඥයන් වහන්සේ ම දේශනා කළා නේද?

**සමාහිතෝ යථාභූතං පස්සති පජානාති**

සමාධිමත් පුද්ගලයා ඇත්ත ඇති සැටියෙන්, ධර්ම ස්වභාව හරියටම අවබෝධ කරගන්නව. ඒ නිසා, දැන් අපි මේ දේශනයට සවන් දීමේදී, වඩාත් සිත සමාධිගත කරගනිමු.

විශේෂයෙන්ම ශ්‍රවණය කළයුතු දේශනාවන් අතරට, ගාම්භීරතම (ගැඹුර) දේශනාවක් තමයි, සර්වඥතාඥාණ දේශනාව. එනිසා මේ දේශණට හැකිතාක් අපි සාවධානව සමාධිගතව සවන්දීමට සූදානම් වෙමු.

මාතෘකා කළ සූත්‍ර පාඨය ඇතුළත් වන්නේ, පටිසම්භිදාමග්ග පාළියෙහි තෙසැත්තෑ ඥාණ නිර්දේශයටයි. පටිසම්භිදාමග්ග පාළිය ධර්ම සේනාධිපති ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ විසින් දේශනා කල ධර්ම කොට්ඨාශයක්.

ඒ පටිසම්භිදාමග්ග පාළියට මාතෘකා වශයෙන් තියෙන්නේ, සර්වඥයන් වහන්සේගේ ශ්‍රී මුඛදේශනා, ඒ ශ්‍රී මුඛ දේශනාවන් මාතෘකා කරගෙන එක එක දහම් පදයක් පාසා විස්තර වර්ණනාවක් වශයෙනුයි, ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ පටිසම්භිදාමග්ග පාළිය දේශනා කළේ.

පටිසම්භිදා මග්ග පාළිය පමණක් නොවෙයි. මහානිද්දේශ පාළිය, චුල්ලනිද්දේශ පාළිය, මේ දේශනාත් සැරියුත් මහා රහතන් වහන්සේගේ ම විස්තර දේශනාවන්, ඒ දේශනාවන්ට මාතෘකා කරගෙන තිබෙන්නේ සර්වඥයන් වහන්සේ දෙසූ සූත්‍ර දේශානාවන්මයි.

එනිසා තෙසැත්තෑ ඥාණ, පටිසම්භිධාමග්ග පාළියට ඇතුළත් වෙන දේශනාවක්, ඒ තෙසැත්තෑ ඥාණ එකක් එකක් ගානේ

ඉතාමත්ම පැහැදිලි විස්තරාත්මක දේශනාවක් මේ පටිසම්භිදාමග්ග පාළියට ඇතුළත්ව තිබෙනවා. එයින් සර්වඥතාඥාණය සහ අනාවරණ ඥාණය යන ඥාණ දෙක එකම දේශනාවකින් විස්තරාත්මකව, මෙහි ඉදිරිපත් කර තිබෙනවා. අපි සළකා බලමු මේ සූත්‍ර පාඨයේ කෙටි තේරුම ගැන.

**කතමං තථාගතස්ස සබ්බඤ්ඤුතඤාණං**
**සබ්බං සංඛතමසංඛතං අනවසේසං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං**
**තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං**

තථාගතයන් වහන්සේගේ සර්වඥතාඥානය නම් කවරේද? සියලු සංඛත, අසංඛතයන් සර්වප්‍රකාරයෙන් දන්නේනුයි, සර්වඥතාඥාණය නම් වේ. එහිලා ආවරණයක් නැත්තේනුයි, අනාවරණ ඥාණය නම් වේ. මේකයි කෙටිම තේරුම.

**සබ්බං සංඛතඅසංඛත අනවසේසං,**
**ජානාතීති තත්ථ, ආවරණං නත්ථි ති.**
**අනාවරණ ඤාණං**

එයින් පැහැදිලි වෙනව, සර්වඥතාඥාණයත් අනාවරණ ඥාණයත් එකක් බව. ඒ කියන්නේ සර්වඥතා ඥාණයෙන් අරමුණු කරනව. ඊට බාධාවක් නැති බව නිසා, එයට ම අනාවරණ ඥාණය කියනව.

එතකොට මෙහිදී ලෝක ධාතුවෙහි කිසිම රහතන් වහන්සේ නමකටවත් නොලැබෙන, පසේබුදුවරයන් වහන්සේලාට ද නොලැබෙන, සම්මා සම්බුදුරජාණන් වහන්සේලාට පමණක් ම ලැබෙන ඥාණ හයක් තියෙනවා. එම ඥාණ හයට කියන්නේ ෂට් අසාධාරණ ඥාණ කියලයි. එම ඥාණ හය නම්,

1. ඉන්ද්‍රිය පරෝපරිය ඥාණය
2. ආසයානුසයේ ඥාණය
3. යමක ප්‍රාතිහාර්යය ඥාණය
4. මහා කරුණා සමාපත්ති ඥාණය
5. සර්වඥතාඥාණය
6. අනාවරණ ඥාණය

මෙම ඤාණ හය තේරුම්ගත යුතුමයි. මෙම ඤාණ හය වෙන කාටවත් සමාන නොවන බැවින්, නොලැබෙන බැවින් මේවාට කියනවා, අසාධාරණ ඤාණ කියලා. ශ්‍රාවකයන්ට සාධාරණ නැහැ.

ඊළඟට අපි සලකා බලමු කුමක්ද මේ සංඛත කියන්නේ. සියලුම අසංඛතය කියන්නේ කුමක්ද? මේවා අපි තේරුම් ගත්තොත් සර්වඥතාඤාණය පැහැදිලි කරගන්න හැකිවෙනවා.

**සංඛතං** කියන්නේ, හේතුප්‍රත්‍යයන්ගෙන් සකස් කරන ලද්දේ යන තේරුමයි. ලෝක ධාතුවෙහි සියල්ල හේතු ප්‍රත්‍යන්ගෙන් හටගත් දේවල් බව අපි තේරුම් ගන්නට ඕනෑ.

නිර්වාණ ධාතුව හැර, අනිකුත් සියල්ලම සකස් වෙලා තිබෙන්නේ හේතුන්ගෙන්, මහ පොළොව සංඛතයක්, මහ සයුර සංඛතයක්, ඉර, හඳ, තාරකා සංඛත, සතර අපාය සංඛත, මනුලොව සංඛත, දෙව්ලොව හය සංඛත, බඹලොව දහසය සංඛත, අරූප ලෝක හතර සංඛත, මේ සක්වල සංඛත, පිටසක්වල සංඛත, අපේ ශරීර සංඛත, අපි පරිහරණය කරන ඇඳුම් පැලඳුම් සංඛත, යාන වාහන සංඛත, ඇඳපුටු ආදී පරිහරණය කරන භාණ්ඩ සංඛත, හැම දෙයක් ම සංඛත, හැම දෙයක් ම සකස්වෙලා තිබෙන්නේ යම් යම් හේතු සම්භාර, කාරණා රාශියක් නිසයි.

මෙන්න මේක නිසා **සංඛත** කියන්නේ හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සියල්ලට නමක්.

**අසංඛත** කියන්නේ නිර්වාණ ධාතුවටයි. නිර්වාණ ධාතුව කිසිම හේතුවකින් හටගත්ත දෙයක් නොවෙයි. නිර්වාණ ධාතුවේ නාම, රූප කිසිවක් නැහැ. ස්කන්ධ නැහැ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ නැහැ. චිත්ත චෛතසික ධර්ම නැහැ. කොටින්ම ඇතිව නැතිව යන කිසිවක් නිර්වාණ ධාතුවේ නැහැ. නිර්වාණ ධාතුව හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් නොවූ බැවින්මයි කාලයකට යටත් නැතිවෙන්නේ. අතීත නිර්වාණය කියලා හෝ අනාගත නිර්වාණය කියල හෝ වර්තමාන නිර්වාණය කියලා හෝ නිර්වාණයට කාල පරිච්ඡේදයක් කාල භේදයක් නැත්තේ,

හේතු ප්‍රත්‍යයන්ගෙන් හටනොගන්නා නිසයි.

හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නවා නම් එතන අනිත්‍ය, තිබෙනවා. දුක්ඛය තිබෙනවා. අනාත්මය තිබෙනවා. නිර්වාණ ධාතුවේ අනිත්‍ය ලක්ෂණයත්, දුක්ඛ ලක්ෂණයත් අනාත්ම ලක්ෂණයත් නැහැ. එනිසා, නිර්වාණ ධාතුව හේතු ප්‍රත්‍යයන් ගෙන් හට නොගත්ත නිසා අසංඛතයි.

**සබ්බං සංඛතං අනවසේසං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං**

ලෝක ධාතුවට අයිති හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත්, සිත ඇති සිත නැති සෑම ස්වභාවයක් ම, සෑම ධර්මතාවක් ම, සෑම නාම රූපයක් ම, සෑම ස්කන්ධයක්ම, සෑම ආයතනයක්ම, සෑම ධාතු ස්වභාවයක් ම ඉතිරිවක් නැතිව දන්නේ සර්වඥතාඥාණයෙන්, ඒ දැන ගැනීමේදී කිසිදු බාධාවක් නැති ස්වභාවය අනාවරණ ඥාණය නම් වෙනවා.

අපි සළකා බලමු මෙය කවදාද ලැබුණේ කියලා. මේ සියල්ල දක්නා නුවණ ලැබුණේ කවදාද? හරියටම අදවැනි දවසකයි. අවුරුදු 2587 ක් පිරෙනවා අදට. (1999-05-29) වෙසක් පෝය දිනට.

බුද්ධත්වය ලබන්න සුදුසු දවස වෙසක් පෝය දවසයි. වෙසක් පෝය දවසේ අලුයම් කාලයේදී මේ තත්වය උදාවුණේ. එදා රාත්‍රී පූර්වයාමයේදී සර්වඥයන් වහන්සේට හැකි වුණා සියලුම අර්පණා කර්මස්ථාන සහ අභිඥා ලබන්න. ඉර බැස යන්න මත්තෙන් දිව්‍යපුත්‍ර මාරයා පලවා හැර, ආනාපාන සති කර්මස්ථානය පදනම් කොටගෙන, රාත්‍රී පූර්වයාමයේදී සමථභාවනා සියල්ලම ප්‍රතිලාභ කරගත්තා.

දස කසිණ, සමාපත්ති ලැබුවා. දස අශුභ සමාපත්තිය ද ලැබුවා. ආනාපාන සති සමාධි සියල්ලම මුලින්ම ලැබුවා. කායගතා සමාධිය ලැබුවා. බ්‍රහ්ම විහාර සමාපත්තිය ලැබුවා. අරූප සමාපත්ති ලැබුවා. මේ අර්පණා කර්මස්ථාන තියෙනවනේ 30ක්. ඒ තිහම ලැබුවා.

ඒ නිසා රාත්‍රී පෙර යම් කාලයේදී, අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය කල්පගණන් ඈත දකින්න හැකිවුණා. පෙර විසූ කඳ පිළිවෙල දන්නා ඥාණය ලැබුවා. ඒ සර්වඥතා ඥාණය නොවෙයි. එයට කියන්නේ **"පූර්වේ නිවාසානුස්මෘතිඥාණය"**.

එයින් උන්වහන්සේට පෙනී ගියා භවයක් භවයක් පාසා සිදු කරන ලද කුසලාකුසල කර්මයන් අනුව පුනර්භවය සිදු වූ හැටි. ඉන්පසු රාත්‍රී මැදියම කාලයේදී ඔරලෝසු පැයෙන් රාත්‍රී 10.00 සිට 2.00 දක්වා පැය හතර ඇතුළතදී දිබ්බචක්ඛු ඥාණය ප්‍රතිලාභ කළා. අතීතය දවස් හතක් අනාගතය දවස් හතක් වශයෙන් දවස් දාහතරක් දක්නා වූ දිවැස් හතක් ලැබුණා. ඒ දිවැස් නුවණට මුලු ලෝක ධාතුවෙහි අස්සක් මුල්ලක් නැර සෑම සත්වයෙක් ම සෑම පුද්ගලයෙක් ම දැකගන්නට හැකිවුණා. මැරෙන, උපදින සත්වයන්, සුගති දුගති යන සත්වයන්, සෝභන අසෝභන සත්වයන්, කුසල් අකුසල් කරන සත්වයන්, සැප විඳින දුක් විඳින සත්වයන් මේ සියල්ලම දැකගත්තා.

සත්ව පුද්ගලයන් පමණක් නොව, මේ ලෝක ධාතු වාසි අවිඥ්ඥාණක සියලු වස්තූන් ද දැක ගත්ත. දිවැස් නුවණින් ඒ සියල්ල දැක ගත්තාම දැන් අතීතය දැක්ක, අනාගතයත් දැක්ක, දවස් දාහතරක වර්තමානයත් දැකගත්ත.

මේ තුන්ලෝක ධාතුවට අයත් සියලු වස්තූන් හේතුඵල සම්බන්ධතාවයෙන් දිගට පැවතුන හැටි වැටහුණා නිසා පටිච්ච සමුප්පාද විදර්ශනාවට හැරුණා, රාත්‍රී දෙකෙන් පසු.

මේ පටිච්ච සමුප්පාද විදර්ශනාව තමයි, බුදුවීමේ විදර්ශනා මාර්ගය. එය අති තීක්ෂණ ලෙස, සියුම් ලෙස උන්වහන්සේ වැඩුවා. අභිධර්ම පිටකයේ විභඟ්ගප්ප්‍රකරණයේ. පච්චයාකාර විභඟ්ගයේ තිබෙනවා ලස්සන හේතුඵල දේශනාවක්.

එක එක චිත්තයක් චිත්තයක් පාසා දහසය, දහසය ආකාරයකට හේතුඵල සම්බන්ධතාව පටිච්ච සමුප්පාදයට අනුව දේශනා කරලා තිබෙනවා. ඒ දේශනාව මධ්‍යම ප්‍රමාණයයි. නමුත් ඊට වඩා බොහොම සියුම් ලෙස ඉතාම තීක්ෂණ ලෙස ඒ සර්වඥයන් වහන්සේ පටිච්ච සමුප්පාද විදර්ශනාව වඩල තිබෙනවා.

දසදහසක් සක්වල, කෙළ ලක්ෂයක් සක්වළ, අනන්ත සක්වළ සියලුම නාම රූප ස්කන්ධ ආදී දේවල් ඉතිරිවක් නැතිව දක්නා වූ, සූර්යය මණ්ඩල දස දහසක් උදාවුවාට වඩා ආලෝකමත් විපස්සනා ඤාණ ආලෝක පහළ වීමෙන්, නාම රූප පරිච්ඡේද ඤාණයේ පටන් පටිපදා ඤාණ දර්ශන විශුද්ධිය දක්වා, සියලුම විපස්සනා වීථි ඉතාමත්ම තීක්ෂණ ලෙස, උත්තරීතර ලෙස පහළ වුණා. අලුයම් කාලයේ බ්‍රහ්ම මුහුර්තිය උදාවෙන සුභ මොහොත වෙනකොට, වැඩිය යුතු විපස්සනා භාවනා මාර්ග සියල්ල සම්පූර්ණයි.

බ්‍රහ්ම මුහුර්තය කියන්නේ, උදේ හයට හිරු පායන දවසක නම් අලුයම 3 විනාඩි 48න් පසුව බ්‍රහ්ම මුහුර්තය කියලා හඳුන්වනවා. ඒ තමයි සුභ මොහොත. ලොව්තුරා බුදුවරයන් වහන්සේලා බුදුවන වේලාව, ඒ අවස්ථාවයි. ඒ ශාන්තිනායකයාණන් වහන්සේ විසි අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් තිස්සේ පිරූ පාරමිතානුභාව බලයෙන්, සුවිශුද්ධ වූ විපස්සනා භාවනා මාර්ගය උට්ඨාන ගාමිණී විපස්සනා බවට පත්වී ඒ උත්තරීතර වේලාවේදී දසදහසක් සක්වළ ප්‍රාතිහාර්යන් සහශ්‍රයන් සිද්ධ වෙද්දී, දස දහසක් සක්වළ ඒකාලෝකව බැබළෙද්දී, දස දහසක් සක්වළ කම්පාවෙද්දී, තමන් වහන්සේ වැඩ සිටි බෝධි මණ්ඩලය පමණක් නිශ්චලව තේජෝ බල පරාක්‍රමයෙන් පවතිද්දී, සවාසනා සකලක්ලේශයන් සෝදා හරිමින්, සෝතාපත්ති මග්ගඵල, සකදාගාමී මග්ගඵල, අනාගාමී මග්ගඵල, අරහත්ත මග්ගඵල පිළිවෙලින් ප්‍රතිවේද වුණා.

එහිදී අරහත් මාර්ග ඤාණය කියන මේ උතුම් අවස්ථාවේදි වාසනා සහිත සකල ක්ලේශයන් සියල්ලම අහෝසි බවට පත් වුණා. මෙන්න මේ අර්හත් මාර්ගඥාණයට පත්වන අවස්ථාවේදී

තමයි, සර්වඥතාඥාණය ප්‍රතිලාභය සිද්ධ වෙන්නේ. ඒ අර්හත් මාර්ගය ලෝකෝත්තරයි. සර්වඥතාඥාණය ලෝකෝත්තර මාර්ගඵලය නොවෙයි. එසේ නමුත් ඒ අර්හත් මාර්ගය ඥාණ ක්ෂණයේදී සියල්ල ආවර්ජනා කළ පමණින්, දැන ගැනීමට සුදුසු ප්‍රඥාසම්භාරය, ප්‍රඥා ශක්ති විශේෂය පහළ වුණා. එයට කියනවා "විමෝක්ෂාන්ත" කියලා. විමෝක්ෂාන්ත කියන්නේ, අර්හත් මර්ගයට අනතුරුව ලැබෙන අර්හත්ඵලය, අර්හත්ඵලයට පත්වන කොටම ලැබිය යුතු ඥාණසම්භාර සියල්ලම ඒ සර්වඥයන් වහන්සේට පිහිටියා. දසබල ඥාණ, චතුර් වෛශාරද්‍ය ඥාණ, චතුර් ප්‍රතිසම්භිදා ඥාණ, ෂට්විධ බුද්ධ ධර්ම, ෂට් අභිඥ්ඥා චුද්දස ඥාණ, සෝළස මහා ඥාණ, අට්ඨාරස ආවේණික බුද්ධ ගුණ, තෙසැත්තෑ ඥාණ, සත්සැත්තෑ ඥාණ, සූවිසි කෝටි ලක්ෂවාර සමාපත්ති සංචාරක අර්හත්ඵල, වජිරඥාණ, අනන්ත ණය සමන්වාගත සමන්ත පට්ඨාන මහාප්‍රකරණ, විෂයන්තර්ගත ගාම්භීර ඥාණ, ඉන්ද්‍රිය පරෝපරිය ඥාණ, ආසයානුසයේ ඥාණ, යමකමහා ප්‍රාතිහාර්ය ඥාණ, මහා කරුණා සමාපත්ති ඥාණ, සර්වඥතාඥාණ, අනාවරණ ඥාණ යන මේ සියල්ලම අර්හත්ඵලයට හා සම්බන්ධවම පහළ වුණා. අර්හත්ඵලයට සම්බන්ධ වන කොටම ඒ සියල්ල අවශ්‍ය අවශ්‍ය වේලාවට ප්‍රයෝජන ගැනීමට සුදුසු ඥාණ ශක්තිය පහළ වුණා.

මෙන්න මේකටයි විමෝක්ෂාන්ත කියලා කියන්නේ. විමෝක්ෂය කියන්නේ අර්හත් මාර්ගය. විමෝක්ෂාන්තිය කියන්නේ අර්හත් ඵලය, අර්හත් ඵලය සම්බන්ධව ලැබුණ මෙම අවස්ථාවට කියන්නේ, විමෝක්ෂාන්තික ඥාණය.

මෙය භාග්‍යවතුන් වහන්සේට ලැබුනේ, හරියට ම වෙසක් පෝය ගෙවීගෙන ඊළඟට උදාවෙන දවසට පළමුවෙනුයි. මේ උතුම් වූ ඥාණ සම්පත්තිය පහළ වුණේ ඒ අවස්ථාවේදී. දස දහසක් සක්වළට දරාගත නොහැකි වුණා. මේ වාගේ දස දහසක් පෘථිවීන් එකවර කම්පාවුණා. බුද්ධාන්තරයකට කලින් තමයි කාශ්‍යප බුදුසසුන පහළ වුණේ. ඊට පස්සේ තමයි අපේ මේ

ගෞතම බුදු සසුනේ මේ උතුම් සිදුවීම සිදු වුණේ. එනිසා මේ අචේතනික මහා පොළොවට දරන්නට බැරි වුණා මේ උතුම් අවස්ථාව.

දස දහසක් ලෝක අනේක රාවයෙන් කම්පාවෙන්න පටන්ගත්තා. අහෝ බුද්ධෝ, අහෝ ධම්මෝ, අහෝ සංඝෝ කියන මේ ගෞරවාන්විත ආශ්චර්යය අද්භූත තත්වයට පත්වූවාක් මෙන්, පොලෝතලය කම්පා වුණා. ආශ්චර්යයි නේද?

මෙන්න මේ අවස්ථාව තමයි, සර්වඥයන් වහන්සේ සම්මා සම්බුද්ධ කියන මේ උතුම් අවස්ථාවට පත් වුණේ.

දැන් ඊළඟට සලකා බලමු, ඒ සර්වඥයන් වහන්සේ අභීතව තමන් වහන්සේ සර්වඥයි කියලා ප්‍රකාශ කල අවස්ථා කීපයක් ගැන.

එක් අවස්ථාවක් තමයි, තමන් වහන්සේ බුදු බවට පත්වෙලා මාස දෙකක්ම ගත වුනානේ ධර්ම දේශනා නොකොට, බුදුවීමෙන් අටවන සතියේදී අජපාල නුගරුක මුලදී ධර්ම ගාම්භීරත්වය සිහි කළානෙ.

සහම්පතී මහාබ්‍රහ්මරාජයා පැමිණ වැඳලා ආරාධනා කළානේ, තථාගතයන් වහන්සේ ලොව බුදු ඇසින් බලා වදාරමින් ධර්මදේශනා කරන සේක්වා කියලා. එම අවස්ථාවේදී තමයි තමන් වහන්සේ බුදු ඇස විහිදෙව්වේ. බුදු ඇස කියන්නේ ඉන්ද්‍රිය පරෝපරිය ඥාණය. ආසය අනුසයේ ඥාණ දෙකයි. එයින් දස දහසක් සක්වළ ලෝකධාතුවාසී සත්වයන් අතරට සූවිසි අසංඛ්‍ය හැටකෝටි පනස්ලක්ෂයක් දෙනා තමන් වහන්සේ ජීවමාන කාලයේම නිවන් අවබෝධ කරන බව බුදු ඇසට පෙනී ගියා. බුද්ධ පරිනිර්වාණයෙන් පසුවත් අවුරුදු 5000ක් යනතුරුත් එසේම අසංඛෙය්‍ය අප්‍රමෙය්‍ය ජනතාවක් නිවන් අවබෝධ කරගන්නා බව බුදු ඇසට පෙනී ගියා.

උග්ඝටිතඤ්ඤ, විපචිතඤ්ඤ, ඤෙය්‍ය කියන මෙම කොට්ඨාශ තුනට අනුව නිවන් අවබෝධ කරගන්න හැටි බුදු ඇසට පෙනිල, ප්‍රතිඥා දුන්න, පොරොන්දු දුන්නා, ධර්ම දේශනා කරන බවට.

තමන් වහන්සේ හරියටම ඇසල පෝය දවසේ ගයාවේ සිට යොදුන් දහඅටක් දුර පිහිටි බාරාණසිය බලා පිටත් වුණා. ඉසිපතනාරාමය බලා පාගමනින් වැඩම කළේ. මෙසේ පා ගමනින් වැඩියේ පුද්ගලයෙක් මුණ ගැසෙන්නයි. "උපක ආජීවක" තුමා, එතුමා අනාගතයේ දී ඒ ජීවිතයේදී අනාගාමී වන බව දැනගෙ නම ඔහුට වචනයකින් සංග්‍රහ කරනු පිණිස ඒ පාරෙන් වැඩියා.

එක වරුවෙන් වැඩියේ. පාර අවශ්‍ය වෙලාවට කෙටිකරග න්න ඇති. එදා උපක ආජීවකතුමාට දේශනාකොට වදාළ තමන් සර්වඥබව. ඒ කියන්නේ,

**සබ්බාභිභූ සබ්බවිදූහමස්මි**
**සබ්බේසු ධම්මේසු අනුලිත්තෝ**
**සබ්බං ජහෝ තණ්හක්ඛයේ විමුත්තෝ**
**සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං**

මේ ගාථාවෙන් ප්‍රකාශ වුණා තමන් නිවන් අවබෝධ කළ බව. ඒ වේලාවේදී උපක කියා සිටියානේ ගෞරව සම්ප්‍රයුක්තව ඔබ වහන්සේ අනන්තජින වෙන්න ඕනෑ කියලා.
ඒ වෙලාවෙ නැවත ගාථාවකින් ප්‍රකාශ කළානේ,

**මා දිසාවෙ ජිනාහොන්ති යේපත්තා ආසවක්ඛයං**
**ජිතා මේ පාපකා ධම්මා තස්මා හං උපකා ජිනෝ**

ජිනයන් වහන්සේලා මා වැන්නෝ වෙනවා. මම සියලුම අකුසල ධර්මයන්, සියලුම ක්ලේශ ධර්මයන් අභිබවා ජයගත්තා. එනිසා මම "අනන්තජින" කියල තමන් වහන්සේ ප්‍රකාශ කළානේ. මේ පළමුවන අවස්ථාව.

දෙවන අවස්ථාව තමයි ඉසිපතනාරාමයට සමීපවීමේදී, පස්වග තව්සන් වහන්සේලා දැක්කනේ දුරදීම උන්වහන්සේ වඩින හැටි. උන්වහන්සේලා තීරණය කළානේ මෙන්න අපව සොයාගෙන එනවා. දැන් උන්වහන්සේට පරිපූර්ණ දේහසම්පත්තියක් ඇතිව අප සොයාගෙන එනවා. උසස් වංසවත් කෙනෙක් නිසා, අපි ආසනයක් දෙමු. පෙර ගමන් නොකරමු. වත්පිළිවෙත් නොකරමු. නොවදිමු. මේ වාගේ සාකච්ඡා කළානේ. තීරණය කළානේ.

නමුත් සර්වඥයන් වහන්සේගේ මෛත්‍රී ආනුභාවයෙන් ඒ සියලුම කතිකාවත් අමතක වෙලා පිළිවෙත් කළානේ. වැන්දේ නැහැ. නොවැඳ සිටියා. ඒ අවස්ථාවේදී සර්වඥයන් වහන්සේ තුන්වාරයක් ම ප්‍රකාශ කළානේ,

මහණෙනි, දෙසවන් නමා සවන් දෙත්වා

තථාගතයන් වහන්සේ සියල්ල අවබෝධ කළා කියලා.

තුන්වාරයක් වදාළ. ඒත් නැහැ. බාරගත්තේ.

හතරවන වතාවේදී දේශනා කළානේ,

මහණෙනි, මම ඔබලා ඇසුරේ අවුරුදු හයක් ජීවත් වුණා නේද? ඒ අවුරුදු හය තුළදී මම කවදා හරි කිව්වද මම සියල්ල අවබෝධ කරගත්ත කියලා. කිව්වේ නැහැ නේද? අද මම කියන්නේ සියල්ල අවබෝධ කරගත්ත නිසයි. දෙසවන් නමා සවන් දෙන්න. මේ ධර්මයට අනුව පිළිපන් කෙනෙක් මේ ජීවිතයේම කෙලෙසුන් ජයගෙන මඟඵල නිවන්සුව ලබනවා. ඒ අවස්ථාවේදී තමයි පස්දෙනා බණ අහන්න සූදානම් වුණේ.

එම අවස්ථාවේදී ධම්මචක්කපවත්තන සූත්‍රාන්ත දේශනය සඳහා, **ද්වේමේ භික්ඛවේ අන්තා පබ්බජිතේන න සේවිතබ්බා** කියන මේ සුද්ධ වූ, බුද්ධ වචන ශ්‍රී මුඛයෙන් දේශනා කරන කොට දසදහසක් සක්වළ ඒකාලෝකව ඒක සුගන්ධයෙන් සුගන්ධවත් වී, මහා පෘථිවිය කම්පාවෙන්න පටන් ගත්තනේ. මෙන්න මේ දවසේ තමයි ප්‍රසිද්ධව සර්වඥතාඥාණය ප්‍රකාශ කළේ.

ඒ දේශනාවේ අගට තිබෙනවනේ යම් දවසක මේ ද්වාදසාකාර වූ ත්‍රිපරිවට්ට වූ, චතුරාර්ය සත්‍ය ධර්මය මා විසින් අවබෝධ කරගත්තේ නම්, එදා මම දෙවියන්, බ්‍රහ්මයන්, මනුෂ්‍යයන්, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත මේ ලෝක ධාතුවෙහි ලොවුතුරා බුදු වුණා කියලා ප්‍රතිඥා කළානේ. මේ එක අවස්ථාවක්.

තවත් අවස්ථාවක් තමයි 500ක් සඟ පිරිස පරිවරාගෙන රජගහ නුවර සිට නාලන්දාව බලා පිටත්වන ගමනේදී අතර මඟ "අම්බලට්ඨික" කියන උයනක රාජාගාරයේදී අර "සුප්පිය

පරිබ්‍රාජක තුමාත්, බ්‍රහ්මදත්ත මානවක තුමත්" දෙදෙනාගේ බහින් බස් වීමක් නිමිතිකරගෙන දේශනා කළානේ "බ්‍රහ්මජාල සූත්‍රය" එදා හැටදෙවාරයක් උන්වහන්සේ සර්වඥතා ඤාණය ප්‍රතිඥා කළා. හැටදෙවාරයක් පොළව කම්පා වුණා.

තවත් අවස්ථාවක් තමයි සාකේත නගරයේ කාලකාරාම සූත්‍රය දෙසූ දවසේ, හත් වාරයක් සර්වඥතාඤාණය ප්‍රතිඥා කළා. හත් වාරයක් ම පොළොව කම්පා වුණා.

තවත් අවස්ථාවක් තමයි, 500ක් භික්ෂූන් වහන්සේලාට විශාලා මහනුවර සමීපයේ ගෝතමක චෛත්‍යස්ථානයේදී තුන්වාරයක් බුද්ධත්වය, සර්වඥතාඤාණය ප්‍රතිඥා කළා. මහ පොළොව තුන් වාරයක් කම්පා වුණා.

මේ තරම් පොළොව කම්පිත වෙන තරම්, පුදුම දෙයක් තමයි, තමන් වහන්සේ සර්වඥයි කියලා අභීතව ප්‍රකාශ කිරීම. මේ තරම් අභීතව සීහනාද කරන්න සුදුසු උතුම් වූ ප්‍රඥාව සර්වඥතාඤාණයයි.

දැන් අපි සලකා බලමු, සර්වඥතාඤාණය පිළිබඳව ධර්මසේනාධිපති ශාරිපුත්ත මහරහතන් වහන්සේ වදාළ වචන ලෙස. වචන වශයෙන් ගැඹුරු වෙන්න පුළුවන්. අපි හැකිතාක් එය තේරුම් ගැනීමට පුළුවන් තරම් නුවණ යොදමු.

මෙතන පළමුවෙන් ම කියැවුණා සංඛත අසංඛත සියල්ල දක්නා බැවින්, සර්වඥතාඤාණය. එහිලා ආවරණයක්, බාධාවක් නැති බැවින් අනාවරණ ඤාණයයි කියලා.

කුමක්ද මේ සංඛත, අසංඛත කියන්නේ කියන එක අපි ඊළඟට තේරුම් කළා. නැවත,

**අතීතං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං**
**තත්ථ ආවරණං නත්ථී ති අනාවරණඤාණං**

අතීත කාලයෙහි යම්තාක් සංඛත අසංඛත තිබුණා නම්, ඒ සියල්ලම උන්වහන්සේ දන්නවා. ඒ සියල්ලම ආවරණයක් නැතිව දන්නවා. ඒ නිසා සංවර්ඥතා ඤාණයත් අනාවරණ ඤාණයත් අතීත කාලය පිළිබඳව පවතිනවා.

**අනාගතං පච්චුපන්නං**

අනාගත කාලයේ සංඛත, අසංඛත සියල්ල සර්වඥයන් වහන්සේ දන්නවා. එහි ආවරණයක් නැතිව දන්නවා. වර්තමාන කාලයේ සංඛත, අසංඛත සියල්ලම සර්වඥයන් වහන්සේ දන්නව. එහිලා ආවරණයක් නැතිව දන්නවා. එනිසා තුන් කාලය පිළිබඳව සියල්ල දන්නා බැවින්, සර්වඥතා ඤාණයයි. සියල්ල දැකීමේදී ආවරණයක් නැති නිසා, අනාවරණ ඤාණයයි. තවදුරටත් උන්වහන්සේ දේශනා කරනවා.

**චක්ඛුඤ්චේ ච රූපා ච ඒතං සබ්බං ජානාතීති**
**සබ්බඤ්ඤුතඤාණං තත්ථ ආවරණං නත්ථී ති අනාවරණඤාණං**

අපි යමක් දක්නා ඇසක් තිබෙනවානෙ චක්ඛු කියලා. මේ චක්ඛුව පිළිබඳව සියල්ලත්, චක්ඛුවට අරමුණුවන වර්ණරූප සියල්ලත් ඒ සර්වඥන් වහන්සේ දන්නව. ඒ දැනීම සර්වඥතා ඤාණයයි. ඒ හා දැකගැනීමට බාධාවක් නැති බව අනාවරණ ඤාණයයි.

සෝත ප්‍රසාදය හා ශබ්ද අරමුණු
ඝාන ප්‍රසාදය හා ගන්ධ අරමුණු
ජිව්හා ප්‍රසාදය හා රස අරමුණු
කාය ප්‍රසාදය හා ස්පර්ශ අරමුණු

සිත හා සිතට අරමුණු වන ධර්ම අරමුණු, මේ සම්බන්ධව ඒ සදොරත් සදොරට අරමුණු වන සෑම අරමුණත් පිළිබඳවත් සියල්ල දක්නා බැවින් සර්වඥතා ඤාණයයි. එහිලා ආවරණයක් නැති බැවින් අනාවරණ ඤාණයයි.

ඊළඟට සඳහන් කරනවා ත්‍රිලක්ෂණය

**යාවතා අනිච්චට්ඨං දුක්ඛට්ඨං අනත්තට්ඨං**
**තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං**
**තත්ථ ආවරණං නත්ථි ති අනාවරණඤාණං**

අනිත්‍ය කියා යම් අර්ථයක් තිබෙනවා
දුක්ඛ නැමැති අර්ථයක් තිබෙනවා
අනාත්ම නැමැති අර්ථයක් තිබෙනවා

අනිත්‍ය කියන්නේ - යමක් ඇතිව නැතිව යනවා නම් එය අනිත්‍යයි.

දුක්ඛය කියන්නේ - ඇතිවීම නැතිවී දෙකෙන් නිතර පෙලෙනවා නම් යමක්, ඒක දුකයි.

අනාත්ම කියන්නේ - කැමති කැමති සේ නොපවතිනවා නම් යමක් අසාර නිස්සාර නම් යමක්, එය අනාත්මයි.

අනිත්‍ය නිසා දුකයි. අනාත්මයි.
දුක්ඛය නිසා අනිත්‍යයි. අනාත්මයි
අනාත්මය නිසා අනිත්‍යයයි. දුකයි.

මේ තුන ඒකාබද්ධ ලක්ෂණ තුනක්. යම් වස්තුවක අනිත්‍ය ලක්ෂණය ඇතොත්, එතන තියෙනවා දුකත්, අනාත්මයත්. යම් තැනක දුක්ඛ ලක්ෂණය ඇතොත්, එතන තිබෙනවා අනිත්‍යයත්, අනාත්මයත්. යම් තැනක අනාත්ම ලක්ෂණය ඇතොත්, එතන තිබෙනවා අනිත්‍යයත්, දුකත්. මේ ත්‍රි ලක්ෂණයට කියනවා සාමඤ්ඤ ලක්ෂණ. පොදු ලක්ෂණ. සෑම වස්තුවක් ම පාසා තිබෙනවා.

ඊළඟට දේශනා කරනවා කවර කවර දෙයක් පිළිබඳව ද අනිත්‍ය දුක්ඛ, අනත්ත දකින්නේ.

**යාවතා රූපස්ස අනිච්චට්ඨං දුක්ඛට්ඨං**
**අනත්තට්ඨං තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුත**
**ඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං**

මේ ලෝකයේ යම්තාක් රූප ඇතොත්, රූප ජාති තියෙනවානේ සියල්ල සත්වසන්තාන තුළ 28ක්, බාහිර අචේතනික වස්තුවල

නම් රූප ජාති අටක් හෝ නවයක්, ඒ සියලුම ආධ්‍යාත්මික, බාහිර වූ රූපයන් පිළිබඳව අනිත්‍ය, දුක්ඛ, අනාත්ම සියල්ල දක්නා බව සර්වඥතා ඥාණයයි. එහිලා ආවරණයක් නැති බව අනාවරණ ඥාණය නම් වෙනවා.

වේදනා පිළිබඳව, සඤ්ඥාව පිළිබඳව, සංස්කාර පිළිබඳව, විඤ්ඤාණ පිළිබඳව ඔය වාගේ පද 201ක් සම්බන්ධව තිබෙනවා. ඒ සියලුම ධර්ම සම්බන්ධව ඇති අනිත්‍ය, දුක්ඛ, අනත්ත අර්ථයන් තත්වාකාරයෙන් දන්නා බැවින් සර්වඥතාඥාණයයි. එහිලා ආවරණයක් නැති බැවින් අනාවරණ ඥාණයයි.

නැවත දේශනා කළා තවත් කරුණු පහක්.

**යාවතා අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨං**

විශිෂ්ඨ ඥාණයෙන් දතයුතු සියල්ල දන්නා බව අභිඤ්ඤාර්ථයයි.

**යාවතා පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨං**

**පරිඤ්ඤට්ඨ** යනු පිරිසිඳ, පිරිසිඳකොට, දතයුතු ලෞකික ධර්මයි. එනම් දුක්ඛ සත්‍යය පිළිබඳ සියල්ලයි. **පහානට්ඨ** නම් ප්‍රහාණය කළයුතු සියල්ල දැනීමේ ඥාණයයි. එනම් සමුදය සත්‍යය පිළිබඳ දැනුමයි. **භාවනට්ඨ** නම් භාවනා වශයෙන් දතයුතු සත්තිස් බෝධිපාක්ෂික ධර්ම මණ්ඩලයයි.

**සච්ඡිකිරියට්ඨ** නම් ප්‍රත්‍යක්ෂ කළයුතු නිර්වාණය අවබෝධයයි.

ඒ සියල්ල පිළිබඳ දන්නා වූ සර්වඥතා ඥාණයයි. එහිලා ආවරණයක් නැති බව අනාවරණ ඥාණයයි.

**යාවතා භාවනාය භාවනට්ඨං**

භාවනා වශයෙන් වැඩිය යුතු මාර්ග අංග තිබෙනවා. ඒ සම්බන්ධව අවබෝධ සර්වඥතා ඥාණයයි. ආවරණයක් නැති බව අනාවරණ ඥාණයයි.

**යවතා බන්ධානං බන්ධට්ඨං පෙ: ධාතූනං**
**ධාතුට්ඨා පෙ: ආයතනානං ආයතනට්ඨං පෙ:**
**සඞ්ඛතානං සඞ්ඛතට්ඨං පෙ: අසඞ්ඛතස්ස**

**අසංඛතට්ඨං තං සබ්බං ජානාතීති සබ්බඤ්ඤුත ඤාණං තත්ථ ආවරණං නත්ථී ති අනාවරණඤාණං**

ස්කන්ධයන් පිළිබඳව යම්තාක් දතයුතු දේ ඇතොත්, ඒ සියල්ල දන්නා බව සර්වඥතාඥාණයයි. ආවරණයක් නැති බව අනාවරණ ඥාණයයි. යම්තාක් අටලොස් ධාතූන් පිළිබඳව, දොළොස් ආයතන පිළිබඳව, සංඛත ධර්ම සියල්ල පිළිබඳව, අසංඛත නිර්වාණ ධාතුව පිළිබඳව දතයුතු දේ ඇතොත්, ඒ සියල්ල දක්නා ඥාණය සාර්වඥතා ඥාණයයි. ආවරණයක් නැතිබව අනාවරණ ඥාණයයි.

**යාවතා කුසලේ ධම්මේ සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං තත්ථ ආවරණං නත්ථී ති අනාවරණඤාණං**

කුසල ධර්ම සියල්ල විසිඑකක් තියෙනවානේ. කුසල් සිත් විසිඑකයි. එහි යෙදෙන චෛතසික තිස් අටයි. ඒ සියල්ලම දන්නා වූ ඥාණය සර්වඥතාඥාණයයි. ආවරණයක් නැති ඥාණං අනාවරණ ඥාණයයි.

යම්තාක් අකුසල තියෙනවා නම්, අකුසල චිත්තෝත්පාද වශයෙන් 12යි. සම්ප්‍රයුක්ත චෛතසික වශයෙන් 27යි. සියල්ල උන්වහන්සේ දන්නවා. යම්තාක් අව්‍යාකෘත ධර්ම වෙතොත් ඒ කියන්නේ අව්‍යකෘත විපාක ක්‍රියා ධර්ම සියල්ලත්, උන්වහන්සේ දන්නවා. ඒ දන්නා ඥාණය සර්වඥතාඥාණයයි. ආවරණයක් නැති බව අනාවරණ ඥාණයයි.

නැවත භූමි වශයෙන් වෙන් කරනව.

**යාවතා කාමාවචරේ ධම්මේ සබ්බං ජානාතීති සබ්බඤ්ඤුතඤාණං තත්ථ ආවරණං නත්ථී ති අනාවරණංඤාණං**

කාමාවචර ධර්ම තිබෙනවානේ සියල්ල සිත් වශයෙන් 54යි. එහි යෙදෙන චෛතසික 52යි. රූප 28යි. මේ සියල්ල දක්නා ඥාණය සර්වඥතාඥාණයයි. ආවරණයක් නැති බව අනාවරණ ඥාණයයි.

**යාවතා රූපාවචරේ ධම්මේ පෙ:**

රූපාවචර සිත් වශයෙන් 15යි. චෛතසික ධර්ම 35යි. මේ සියල්ල දන්නව.

**යාවතා අරූපාවචරේ ධම්මේ පෙ:**

අරූපාවචර ධර්ම සිත් වශයෙන් 12යි. චෛතසික වශයෙන් 30යි. මේ සියල්ල දන්නව.

**යාවතා පරියාපන්නේ ධම්මේ පෙ:**

ලෞකික ධර්ම වශයෙන් සිත් 81යි. එහි යෙදෙන චෛතසික 52යි. රූප 28යි. සියල්ල දන්නව.

**යාවතා අපරියාපන්නේ ධම්මේ පෙ:**

ලෝකෝත්තර සිත් 8යි. චෙතසික 36යි. නිර්වාණයයි. සියල්ල දන්නව. එහි ආවරණයක් නැති බව අනාවරණ ඤාණයයි.

**යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨං තං සබ්බං ජානාතීති**
**සබ්බඤ්ඤුතඤාණං තත්ථ ආවරණං නත්ථීති**
**අනාවරණඤාණං**

දුක්ඛය පිළිබඳව යම්තාක් දුක්ඛාර්ථයක් වෙයි නම් පීලන, සංඛත, සංතාප, විපරිණාම, ඒ සියලුම දුක්ඛාර්ථයන් තත්වාකාරයෙන් දක්නා ඤාණය, සර්වඥතා ඤාණයයි.

සමුදය, නිරෝධය, මාර්ගය, අර්ථ ප්‍රතිසම්භිදාව, ධම්ම ප්‍රතිසම්භිදාව, නිරුත්ති ප්‍රතිසම්භිදාව, ප්‍රතිභාන ප්‍රතිසම්භිදාව, ඉන්ද්‍රිය පරෝපරිය ඤාණය, ආසය අනුසය ඤාණය, යමක ප්‍රාතිහාර්යය ඤාණය, මහා කරුණා සමාපත්ති ඤාණය, සර්වඥතාඤාණය, අනාවරණ ඤාණය කියන මේ ධර්මතා සියල්ල පිළිබඳව දන්නා ඤාණය සර්වඥතාඤාණයයි. එහිලා ආවරණයක් නැති ඤාණය අනාවරණ ඤාණයයි.

ඊළඟට දේශනා කළා සමස්ථයක් වශයෙන් සම්පිණ්ඩනය කරලා, **යාවතා සදේවකස්ස, ලෝකස්ස, සමාරකස්ස, සබ්‍රහ්මකස්ස, සස්සමණබ්‍රාහ්මණියා පරියේසිතං, අනුච්චරිතං, මනසා, සබ්බං, ජානාතීති,**

**සබ්බඤ්ඤුතඤාණං, තත්ථ ආවරණං නත්ථීති අනාවරණඤාණං.**

දෙවියන් සහිත, මනුෂ්‍යයන් සහිත, බ්‍රහ්මයන් සහිත, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත, මේ ලෝක සත්වයා කෙරෙහි යම් යම් කෙනෙක් යමක් දකිනවා නම්, යමක් අහනවා නම්, යමක් ආඝ්‍රාහණය කරනවා නම්, යමක් රස විඳිනවා නම්, යමක් ස්පර්ශ කරනවා නම්, යමක් සිත සිතා සිටිනවානම්, තමා වෙත පැමිණි අරමුණක් හරි, තමා සොයාගත්ත අරමුණක් හරි, ඒ කවර විදිහේ අරමුණකින් සිටියත්, මේ ලෝක ධාතුවේ සත්වයෝ අනන්තයි. ඒ අනන්ත සත්වයන් එක එක්කෙනා සිතන, කියන, දකින, අහන, සෑම දෙයක් ම ආවර්ජනා කළ පමණින්, සර්වඥයන් වහන්සේ දන්නවා. එය සර්වඥතාඥාණයයි. ඒ සම්බන්ධ ආවරණයක් නැති බව අනාවරණ ඥාණයයි.

එනිසාම එම සැරියුත් මහරහතන් වහන්සේ, ගාථාවකින් නැවත එය සනාථ කරනව.

**න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි**
**අථෝ අවිඤ්ඤාතමජානිතබ්බං**
**සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං**
**තථාගතෝ තේන සමන්තචක්ඛු ති.**

ඒ තථාගතයන් වහන්සේට අතීතකාලයේ නොපෙනෙන දෙයක් ඇත්තේම නැත. අනාගත කාලයේද අවබෝධ නොවන දෙයක් ඇත්තේම නැත. වර්තමාන කාලයේද නුවණින් නොදක්නා දෙයක් නැත. සියල්ලම ඒ තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරගත් බැවින් "සමන්තචක්ඛු" නම් වන සේක. මේකයි ගාථාවේ තේරුම.

ඒ සමන්තචක්ඛු කියන වචනය තෝරාගන්නට බුද්ධ ඥාණ 14ක් ඉදිරිපත් කළා. දුක්ඛය, සමුදය, නිරෝධය මාර්ග ඥාණ 4යි. අර්ථ ප්‍රතිසම්භිදා ඥාණය, ධර්ම ප්‍රතිසම්භිදා ඥාණය, නිරුත්ති ප්‍රතිසම්භිදා ඥාණය, ප්‍රතිභාන ප්‍රතිසම්භිදා ඥාණය, ඉන්ද්‍රිය පරෝපරිය ඥාණය, ආසයානුසය ඥාණය, යමකමහා ප්‍රාතිහාර්ය ඥාණය, මහා කරුණා සමාපත්ති ඥාණය, සර්වඥතාඥාණය,

අනාවරණ ඤාණය මේ ඤාණ 14 ඉදිරිපත් කළා. සමන්තචක්ඛු කියන වචනය හඳුන්වන්න. **සමන්ත** කියන්නේ හාත්පසනේ. හාත්පස දක්නා ඇස සමන්තචක්ඛු. හාත්පස දක්නා ඇසක් ඇති සර්වඥ තථාගතයන් වහන්සේටයි සමන්තචක්ඛු කිව්වේ. එතකොට මේ සමන්තචක්ඛු කියන සර්වඥයන් වහන්සේ සියල්ලම දකිනව.

ඊළඟට සඳහන් වන්නේ,

**යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨෝ සබ්බෝ**
**ඤාතෝ අඤ්ඤාතෝ දුක්ඛට්ඨෝ නත්ථී ති සබ්බඤ්ඤුත**
**ඤාණං තත්ථ ආවරණං නත්ථී ති අනාවරණඤාණං**

දුක්ඛය පිළිබඳව යම් දුක්ඛ අර්ථයක් තිබෙනවා නම්, ඒ සියල්ලම උන්වහනසේ දන්නවා. නොදන්නා අර්ථයක් නැහැ. එලෙසින් ම සමුදය නිරෝධය, මාර්ගය ගැනත්, අර්ථ ප්‍රතිසම්භිදා ධර්ම ප්‍රතිසම්භිදා, නිරුත්ති ප්‍රතිසම්භිදා, ප්‍රතිභාන ප්‍රතිසම්භිදා ගැනත් ඉන්ද්‍රිය පරෝපරිය ඤාණය, ආසයානුසය ඤාණය යමක ප්‍රාතිහාර්ය ඤාණය, මහා කරුණා සමාපත්ති ඤාණය ගැනත් යමක් යමක් දතයුතු නම්, එහිලා සියල්ල දක්නා බැවින් සර්වඥතා ඤාණය නම් වෙනවා. ආවරණයක් නැති බව අනාවරණ ඤාණයයි.

නැවතත් සමස්ථයක් වශයෙන් ගෙන, ලෝකවාසී දෙවියන් සහිත, මනුෂ්‍යයන් සහිත, මාරයන් සහිත, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත, සමස්ථ ලෝක සත්වයා අතරට දක්නා ලද දේ, අසන ලද දේ, ආඝ්‍රාණය කරන ලද දේ, සිතන දේ, සියල්ලම ඒ සර්වඥයන් වහන්සේ දන්නව. උන්වහන්සේ නොදන්නා අරමුණක් ඇත්තේම නැත කියන එකයි. ඒ සමන්තචක්ඛු කියන වචනයෙන් සර්වඥතාඤාණය ඉදිරිපත් කොට වදාළේ. අන්තිමට අර ගාථාව නැවත වරක් දේශනා කරලා තියෙනවා.

**න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි**
**අථෝ අවිඤ්ඤාතමජානිතබ්බං**
**සබ්බං අභිඤ්ඤාසි යදත්ථි නෙය්‍යං**
**තථාගතෝ තේන සමන්තචක්ඛු ති.**

අතීත කාලයේ යමක් දත යුතු නම් ඒ සියල්ල උන්වහන්සේ දැක වදාළ. අනාගත කාලයේ යමක් දත යුතු නම් ඒ සියල්ල ඒ තථාගතයන් වහන්සේ දකිනව. වර්තමාන කාලයේ යමක් දතයුතු නම් ඒ සියල්ල ඒ සර්වඥයන් වහනසේ දකිනව.

ඒ නිසා සියල්ල දක්නා අර්ථයෙන් "සමන්තචක්ඛු" නම් වෙනවා. මෙතනදී අප තේරුම් ගන්නට ඕනෑ නැවත වරක්, "සර්වඥතාඥාණය ගැන ප්‍රතිඥා කරන බොහෝ ශාස්තෘවරු ඉන්නව. ඒ ශාස්තෘවරුන් කොටස් පහකට බෙදනවා. මොනවාද කොටස් පහ

1. ඛණ සබ්බඤ්ඤු
2. සකිං සබ්බඤ්ඤු
3. සතත සබ්බඤ්ඤු
4. සත්ති සබ්බඤ්ඤු
5. ඤාත සබ්බඤ්ඤු

1. ඛණ සබ්බඤ්ඤු කියන ඇතැම් ශාස්තෘ කෙනෙක් ප්‍රතිඥා කරනවා, මම අනුපිළිවෙලින් තමයි සියල්ල දකින්නේ. ඉතිං අනුපිළිවෙලින් දැකල අවසන් වෙන්නේ කවදාද? ඒක පිළිගන්න බැරි සර්වඥතාවක්.
2. සකිං සබ්බඤ්ඤු කියන්නේ, මම සියල්ල එකවර දකිනව. ඒකත් වෙන්න බැරි දෙයක්. සියල්ල එකවර බලන්න බැරි එක එක ආකාර අරමුණුනේ තිබෙන්නේ. ඒ නිසා එයත් පිළිගන්න බැරි සර්වඥතාවක්.
3. සතත සබ්බඤ්ඤු තවත් ශාස්තෘවරයෙක් කියනවා, මම නිරුත්තරයෙන් සියල්ල දැක දැක ඉන්නවා. ඒකත් පිළිග න්න බැහැ. හේතුව ඇහෙන් දකින අරමුණු වෙනයි.

කනෙන් අහන අරමුණු වෙනයි. එක එක දොරටුවෙන් ගන්න අරමුණු විවිධාකාර නිසා ඒක පිළිගන්න බැහැ.

4. සත්ත සබ්බඤ්ඤු කියන්නේ, මට ඕනෑම වේලාවක සියල්ල දැකගන්න පුළුවන්. ඒකත් පිළිගන්න බැහැ. විවිධාකාර අරමුණු තිබෙන බැවින් ඒක පිළිගන්න හැකි සර්වඥතාවක් නොවෙයි.

5. ඥාත සබ්බඤ්ඤු "ඥාත" කියන්නේ සියල්ල අරමුණු කළ පමණින් ආවර්ජනා කළ පමණින්, දැකගන්න පුළුවන් වෙනවා. මෙය නියම සර්වඥතාවයි. ඒක නිසානේ දම්සෙනෙවි සැරියුත් මහරහතන් වහන්සේ තවත් තැනක දේශනා කළේ,

**සබ්බේ ධම්මා බුද්ධස්ස භගවතෝ**
**ආවජ්ජනපටිබද්ධා ආකඩ්ඛනපටිබද්ධා**
**චිත්තුප්පාදපටිබද්ධා මනසිකාරපටිබද්ධා කියලා**

තථාගතයන් වහන්සේට යමක් දැකගන්න අවශ්‍ය නම් " ආවජ්ජනපටිබද්ධා" ආවර්ජනා කළ පමණින්, ඒක දකින්න හැකි වෙනවා. "ආකංඛණපටිබද්ධා" ඕනෑ කමක් තිබෙනවා නම් යමක් දකින්න, ඒ ඕනෑම අනුව දකිනවා. "චිත්තුප්පාදපටිබද්ධා" යමක් දැකගන්න සිතක් පහළ කරගත්තොත් ඒ අනුව දකින්න පුලුවන් වෙනවා. "මනසිකාරපටිබද්ධා" යමක් මෙනෙහි කළ පමණින් දැකගන්න පුලුවන් වෙනවා.

මෙන්න මේක තමයි ඥාතසබ්බඤ්ඤු කියන වචනයේ තේරුම. ඥාත කියන්නේ මෙතන ලෝකයේ දතයුතු දේවල් තිබෙනව සියල්ල පහක්. ඒවට කියනවා පංච විධ ඥෙයය මණ්ඩල. මොනවාද පංචවිධ ඥෙයය මණ්ඩලය කියන්නේ,

1. සංස්කාර 2. විකාර 3. ලක්ඛණ 4. නිර්වාණ
5. පඤ්ඤප්ති

මේ පහට මුලු ලෝකයේ සියල්ලම අයිති වෙනවා.

**සංස්කාර**

මුලින් කිව්වනේ නිර්වාණ ධාතුව හැර සියල්ල හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත්ත දේවල් කියලා. මේවා තමයි සංස්කාර, හැබැයි සංස්කාර කීවාම තවත් තේරුම් රාශියක් තිබෙනවා. මෙතන ගැනෙන්නේ නිර්වාණයෙන් මෙපිට හේතු ප්‍රත්‍යයන් ගෙන් හටගත් සියල්ල සංස්කාර.

**විකාර**

හැම නාමයක, රූපයක, ක්ෂණයක් ක්ෂණයක් පාසා ඇතිවීම, නැතිවීම කියන එකයි. ඒ ඇතිවීම, නැතිවීමට කියනවා විකාර කියලා. තවත් තිබෙනවා එකක්, රූප ධර්ම 28 තිබෙනවා. විඤ්ඤත්ති රූප දෙක සහ විකාර රූප තුන කියන පහ කාය විඤ්ඤත්ති, වචී විඤ්ඤත්ති දෙකයි, රූපස්ස ලහුතා, මුදුතා, කම්මඤ්ඤතායන තුනයි, සියල්ල පහයි. මේවාටත් කියනවා විකාර රූප. ඒ විකාර රූප පහයි සියලුම සංස්කාර ධර්මයන්ගේ විපරිණාමයයි. මේකට කියනවා "විකාර කියන ධර්මතාව".

**ලක්ඛණ**

ලක්ඛණ කියන්නේ සෑම නාමයකම, සෑම රූපයකම, සෑම ධර්මතාවයකම තිබෙනවා පච්චත්ත ලක්ෂණය සහ පොදු ලක්ෂණය කියලා ලක්ෂණ දෙකක්. පච්චත්ත ලක්ෂණය කියන්නේ දැන් පඨවි ධාතුවේ කර්කශ ලක්ෂණය, ආපෝ ධාතුවේ ආබන්ධන ලක්ෂණය, තේජෝ ධාතුවේ උණ්හත්ත ලක්ෂණය, වායෝ ධාතුවේ විස්ථම්භන ලක්ෂණය, සිතේ චින්තන ලක්ෂණය, වේදනාවේ වේදියත ලක්ෂණය, මේ වාගේ තිබෙනවා. පුද්ගලික ලක්ෂණ. හැම දෙයක් ගානෙම පොදු ලක්ෂණය කියන්නේ,

හැම දේකම තියෙනවා අනිත්‍ය ලක්ෂණය, දුක්ඛ ලක්ෂණය, අනත්ත ලක්ෂණය, මෙන්න මේ සම්බන්ධව දක්නා බව ලක්ඛණ නම් වෙනවා.

**නිර්වාණ**

අසංඛතධාතු සංඛ්‍යාත නිර්වාණයයි.

**ප්‍රඥප්ති**

ලෝක සම්මුති ව්‍යවහාර. ලෝක සම්මුති ව්‍යවහාරයත් දතයුතු දේවල්, ඒ කියන්නේ, දැන් අපි සිංහල බසින් යම් යම් දේවල් කියනව. මේස, පුටු, ඇඳ, ඇතිරිලි, කෝට්ට, මෙට්ට, කෝප්ප, පිඟන්, මෙහෙම අපි සිංහල බසින් කියනව. ඉංග්‍රීසි බසින් තවත් ක්‍රමයකට, දෙමළ බසින් තවත් ක්‍රමයකට, හින්දි බසින් තවත් ක්‍රමයකට, පාළි බසින් තවත් ක්‍රමයකට, එක එක භාෂාවලින් එක එක මනුෂ්‍යයන් සම්මත කරගත් ව්‍යවහාර තිබෙනවානේ. මේවා තමයි ප්‍රඥප්ති.

මේ සියල්ලත්, මේ ඥෙය්‍ය මණ්ඩලයට අයිති, එනිසා සංස්කාර, විකාර, ලක්ඛණ, ප්‍රඥප්ති, නිර්වාණ කියන මේ පංචවිධ ඥෙය්‍ය මණ්ඩලය අතට ගත් නෙල්ලි ගෙඩියක් දකින්නා වාගේ ඒ තථාගතයන් වහන්සේ එදා බෝධිමූලයේදී අර්හත් මාර්ගයට අනතුරුව අර්හත් ඵලයට පත් වීමේදී මේ දැකීමේ ශක්ති විශේෂය උන්වහන්සේගේ සිතේ පහළ වුණා.

තමන් වහන්සේට අවශ්‍ය වුණ වේලාවකදී ඒ සියල්ල අරමුණු කරගන්න හැකි වෙනවා. අවශ්‍ය දේ පමණයි, ඒ ඒ වෙලාවට අරමුණු කරන්නේ.

නිදසුනක් වශයෙන් කියනවා නම්, තමන් වහන්සේ අර්හත් මාර්ගඵල ප්‍රතිලාභ කරගන්න විට, සියලු ධර්ම අවබෝධ කළානේ. එසේ නමුත් අවබෝධ කරගත් ධර්ම පේලියට, පේලියට සම්මර්ශනය කරන්න ගතවුණා දවස් හතක්. අභිධර්මය පමණක් දේශනා කරන්න පමණක් කාලය ගතවුණා දින අනූවක්.

මෙයින් තේරුම් ගන්න හැකිවෙනව නේද? අවබෝධ කරගන්න තත්පරයක්වත් ගියේ නැහැ. අර්හත්ඵලයට පත්වෙනකොට ඒ අවබෝධය සම්පූර්ණයි. මනසිකාරයට ගියා දවස් හතක්. දේශනා කරන්න ගතවුණා (අභිධර්මය) දවස් අනූවක්. මෙන්න මේ අනුව

තේරුම් ගන්න පුළුවන් ඒ සර්වඥයන් වහන්සේ බෝධිමූලයේදී, සර්වඥතා ඥාණය, අනාවරණ ඥාණ ප්‍රතිලාභ කරගත්ත. අවශ්‍ය වේලාවට ඒ ඒ දේ ආවර්ජනා කළ පමණින් අවබෝධ කරගන්නව. දැකගන්නව.

ලොව්තුරා බුදුකෙනෙක් පහළවීම නිසා මේ උතුම් ශාන්තිය ලොවට බෙදී ගියා. ඒ කියන්නේ මහා කරුණාවේ පිහිටාගෙන ලෝ වැසි ජනතාව දෙස ශාන්ති නායකයාණන් වහන්සේ බලනවා. දවසට සූවිසි කෝටිලක්ෂවාරයක් මහා කරුණාවට සමවැදි ලොව දෙස බලා, ලොවට හිත සුව ප්‍රාර්ථනා කරනවා. ඊළඟට සර්වඥතාඥාණයේ පිහිටාගෙන ඒ ඒ පුද්ගලයන් අනුරූප ධර්මය අවබෝධ කරවා දෙනවා. මෙන්න මේක නිසා මහා කරුණාවයි සර්වඥතාඥාණයයි දෙක නිසා ඒ ශාන්තිනායකයන් වහන්සේ සූවිසි අසංඛෙය්‍ය හැටකෝටි පනස්ලක්ෂයක් දෙනාට දුක්ඛය, සමුදය, නිරෝධය, මග්ගය යන චතුරාර්ය සත්‍ය අවබෝධ කරවා අමාමහ නිවන් සුව සාක්ෂාත් කරවා දුන්නා.

අනාගතය බලා අවුරුදු 5000ක් කල් පවත්නා සේ අධිෂ්ඨාන කරලා, මානෙල් මල් සුවඳ විහිදෙන ශ්‍රී මුඛ පත්මයෙන් සුදු බුදුරැස් විහිදෙන දළදා ස්පර්ශයෙන් අෂ්ටංග සමන්වාගත බ්‍රහ්ම ස්වරයෙන් දස දහසක් ලෝක ධාතුව සිසිල් කරමින්, සුවඳ කරමින් සුවාසූ දහසක් ධර්මස්කන්ධය දේශනා කළා. තමන් වහන්සේ කොතෙක් ලොවට දහම් දෙසූවත්, තමන් අවබෝධ කරගත්ත නිවන් සුවය දිනපතා සූවිසි කෝටි ලක්ෂවාරයක් බැගින් වළඳමින් වැඩසිට අද වාගේ දවසක අනුපාදිසේස පරිනිර්වාණයෙන් නිවන්පුර වැඩියා. ඒ ශාන්ති නායකයාණන් වහන්සේ සර්වඥතාඥාණය අදත් ජීවමානයි. පිරිනිවන් පෑවාට අවුරුදු 5000 කට වැඩි කලක් ජීවමානව මෙන් සර්වඥතාඥාණයේ බලමහිමය පිහිටා තිබෙනවා. එනිසා බෞද්ධයන් වශයෙන් අපි නිතරම ඒ සර්වඥතාඥාණ සිහියට නඟාගන්න ඕනෑ. සෑම උදයකම අවදි වෙනකොට,

**නමෝ තස්ස, භගවතෝ, අරහතෝ සම්මා සම්බුද්ධස්ස.** කියා අවදි වෙමු. ඒ තුලින් අනිවාර්යයෙන් සර්වඥතාඥාණය අපි සිහිකළා වෙනවා. සම්මා සම්බුද්ධ කියන්නේ සර්වඥතාඥාණයයි.

එනිසා ඕනෑම වෙලාවක යම්බඳු ප්‍රශ්ණයක් ඇතිවූ වෙලාවක වෙන කිසිම දෙයක් සිතන්නේ නැතිව නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස කියන්න.

මෙසේ දිනපතා සර්වඥතාඥාණය සිහිපත් කරනවා නම් අපේ කටයුතු සියල්ලම සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වෙනවා. එනිසා අද වැනි දවසක නියත විවරණ ලබාගෙන අද වැනි දවසකම ලොව පහළ වී, අද වැනි දවසක මාර පරාජය කොට ලොව්තුරා බුදු වී, ලොවට සදහම් අමාවැසි වැස්සූ, අද වැනි දවසක පිරිනිවන් පා වදාළ වූ ශාන්තිනායකයාණන් වහන්සේගේ සර්වඥතාඥාණයට අපේ ගෞරවාචාර උත්තමාංග නමස්කාරය වේවා.

ඒ ශාන්තිනායකයාණන් වහන්සේගේ සර්වඥතාඥාණ ආනුභාව බලයෙන් අපටත් ප්‍රඥා ආලෝකය පහළ වේවා. අපේ සම්‍යක් ප්‍රාර්ථනා සඵල වී, මේ වාගේ වෙසක් පෝයවල් සියයකට වඩා දැකගනිමින් බුදුසසුනේ උසස් ලෙස පාරමී පුරා, ප්‍රාර්ථනා කරන අධිගම බෝධි යානයන්ගෙන් අජරාමර ශාන්ත ලෝකෝත්තර නිවන් සුව සාක්ෂාත් කරගැනීමට හේතු වාසනා වේවා කියා අපි ගෞරවයෙන් ප්‍රාර්ථනා කරමු.

සීලයක පිහිටා ධර්මානුශාසනයට සවන් දීමෙන් මෙතෙක් වේලා සිද්ධ කරගත් භාවනාමය කුසලානුභාවයෙන් සෑම දෙනාට ධ්‍යාන අභිඥා, විපස්සනා, මාර්ගඵල පිළිවෙලින් අජරාමර ශාන්ත නිවන් සුව සාක්ෂාත් වේවා කියා අපි ප්‍රාර්ථනා කරමු.

99-05-29 දින වෙසක්පෝය නිමිත්තෙන් ගුවන් විදුලියේ ප්‍රචාරය වූ ධර්ම දේශනාවකි.

**සබ්බඤ්ඤුත ඤාණ අනාවරණ ඤාණ ධර්ම දේශනාව නිමි.**

ධර්මදානය සඳහා දායක වූ සැමටත්, ආධාර උපකාර අනුග්‍රහ දැක්වූ එම පවුල්වල සැම දෙනාටත් නිරෝගී සුව දීර්ඝායු අත්වී ධර්මඥාණ, භාවනා ඥාණ වර්ධනය වී නිවන් අවබෝධය පිණිසම හේතුවේවා! අභාවයට පත් සියලු ඥාතීන්ටත් නිවන්සුව අත්වේවා!

## බුදු ගුණ වැඩීමේ ආනිසංශ

- සතර අපායට පත් නොවීම
- පිට ලෝකයක නූපදීම
- අඳ, ගොළු, බිහිරි, ආදී අභව්‍ය නොවීම
- උම්මත්තක නොවීම
- මසදුටු නොවීම
- පාපයට ලැජ්ජා, බිය ඇතිවීම
- අධි කුසලයට සිත නැමීම
- විශාරද වීම
- සිහිය සහ නුවණ ලැබීම
- මරණයට භය නැතිවීම
- මුහුණේ වර්ණය පැහැපත් වීම
- ලෝකයාට ප්‍රියමනාප වීම
- වස, විෂ, අවි, ආයුධ ගිනි විපත් වැළකීම
- බොහෝ කොට ප්‍රත්‍ය ලැබීම
- දෙවියන්ගේ දැහැමි රැකවරණය ලැබීම
- අන් අයගේ කරුණාවට ලක්වීම
- භූත, පිසාච, ප්‍රේත ආදී විපත් ලං නොවීම
- තමන් සිතූ පැතූ දේ ඉෂ්ට වීම
- බුදු බව පවා පැතීමට සිත නැඹුරුවීම
- තම හදවත බුදු මැදුරක් මෙන් පිහිටීම
- සුවසේ සැතපීම
- නපුරු සිහින නොපෙනීම
- වහා සිත සමාධිගත වීම
- මරණින් පසු සුගතියට යෑම
- සම්මා දිට්ඨියෙහි පිහිටීම
- ධාරණ ශක්තිය හා ධර්මය අවබෝධ කරගැනීමේ දක්ෂකම ලැබීම
- බුදුගුණ වැඩූ යමෙක් යම් උපක්ලේශයක් නිසා බුදුකෙනෙක් මුණ නොගැසී නම් ඔවුන් වෙත බුදුවරු වැඩම කරවීම
- මේ ජීවිතයේ බුදුගුණ වඩා මගඵල නොලද නම් සුගතියකට යෑම
- භය, තැති ගැනීම, ලොමු ඩැහැ ගැනීම සිදු නොවීම
- සෑම කෙනෙක් ම තමා වෙත නැමිගත් පැවතුම් ඇතිවීම
- තම යෝජනා අදහස් අන් අය එක ලෙසම පිළිගැනීම
- ප්‍රභූවරුන්ගේ ගෞරව සැලකිල්ලට භාජනය වීම
- නිහතමානී පැවතුම් හා ගතිගුණ දියුණු වීම
- බුදුගුණ වඩන්නා සත්‍යවාදියෙක් බවට පත්වීම
- බුදුගුණ වඩන්නා නිතරම සතුටු සිතින් වාසය කිරීම
- සියලු පවින් වැළකීම
- නිවන් දකින තුරු සියලු සම්පත් ලැබීම